ISSN 3093-6217

# The Socialist

ශ්‍රී ලංකාවේ හා දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වයේ මාසික ප්‍රකාශනය

භූ දේශපාලනය | ඉතිහාසය | න්‍යාය | පන්ති අරගල



## LTTE තහනම අප සැමටම එරෙහි ආයුධයකි: සංගීත්සන් අත්අඩංගුවට ගැනීම සහ රාජ්‍ය මර්දනයේ සැබෑ තර්කනය පි.6




## මීගමුව බන්ධනාගාර සමූලඝාතනය: පන්ති ප්‍රචණ්ඩත්වය සහ ශ්‍රී ලංකා ධනේශ්වර රාජ්‍යය පි.14

## වෙම්මනි සමූහ මිනීවළේ මළගියවුන් කතා කරයි පි.4

## එක්සත් ජනපද කතිපයාධිකාරයේ අපරාධ කල්ලි නායකයා: ට්‍රම්ප් 2025 දී ඩොලර් බිලියන 2.2ක් සාක්කුවේ දමාගනී පි. 21




## ජපානයේ ආරක්ෂක අමාත්‍යවරයා න්‍යෂ්ටික ආයුධ පිළිබඳ “තහංචිය” අවසන් කරන ලෙස ඉල්ලා සිටියි

කොයිසුමිගේ මෑතම අදහස් දැක්වීම්වල අරමුණ වන්නේ ජපානයේ න්‍යෂ්ටික අභිලාෂයන් ආවරණය කර ගැනීම වන අතරම, යුද්ධය සාධාරණීකරණය කිරීම සඳහා චීනය කෙරෙහි මහජනතාව තුළ බියක් ඇති කිරීමයි. පි.2



## මහා බලවතුන්ගේ ගැඹුරු වන එදිරිවාදිකම් මධ්‍යයේ යුරෝපීය අධිරාජ්‍යවාදීන් වෙළඳපල, ලාභ ශ්‍රමය සහ තීරණාත්මක අමුද්‍රව්‍ය වෙත ප්‍රවේශය සොයති

ස්වභාවික සම්පත් සහ ලාභ ශ්‍රමය සුරක්ෂිත කර ගැනීමට සහ වෙළඳපොළවල් පුළුල් කිරීම සඳහා යුරෝපා සංගමය දරන උත්සාහයන් සිදුවන්නේ ගෝලීය ධනේශ්වර අර්බුදයක් මැද ය. එහි ප්‍රතිවිරෝධතා දැනටමත් තුන්වන ලෝක යුද්ධයක මුල් අවධියට මඟ පාදා ඇති අතර, ලෝකය නැවත බෙදා ගැනීමක් සඳහා ප්‍රධාන බලවතුන් පටලවා ඇත. පි.24

# ජපානයේ ආරක්ෂක අමාත්‍යවරයා න්‍යෂ්ටික ආයුධ පිළිබඳ "තහංචිය" අවසන් කරන ලෙස ඉල්ලා සිටියි

**බෙන් මැක්ග්‍රාත්** විසිනි.

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026 ජූලි 23* දින *"Japanese defense minister calls for end of "taboo" on nuclear weapons"* යන හිසින් පළවූ බෙන් මැක්ග්‍රාත් විසින් ලියන ලද ලිපියේ සිංහල පරිවර්තනය යි.



ෂින්ජිරෝ කොයිසුමි [AP Photo/Eugene Hoshiko, Pool]

ජපානයේ ආරක්ෂක අමාත්‍ය ෂින්ජිරෝ කොයිසුමි ජූලි 17 වන දින ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේ, ජපානයට න්‍යෂ්ටික ආයුධ හඳුන්වා දීම පිළිබඳව ටෝකියෝව සාකච්ඡා කළ යුතු බවයි. දැනට ධුරයේ සිටින රජයේ සාමාජිකයෙකුගෙන් මෙවැනි අදහස් පළවීම දුර්ලභ වන අතර, චීනයට එරෙහිව ඇමරිකාව මෙහෙයවන යුද ව්‍යාපාරයේ කොටසක් ලෙස ටෝකියෝවේ වේගවත් වන ප්‍රතිසන්නද්ධ වීමේ (remilitarization) වැඩසටහන මෙයින් පෙන්නුම් කෙරේ.

ඔන්ලයින් වැඩසටහනක් වන ගෙන්රොන් ටීවී (Genron TV) වෙත සම්මුඛ සාකච්ඡාවක් දෙමින් කොයිසුමි ප්‍රකාශ කළේ, "මෙය ජපානයට සාකච්ඡා කිරීමට අපහසු විෂයයක් වුවද, අපට මගහැරිය නොහැකි එක් මාතෘකාවක් වන්නේ න්‍යෂ්ටික ආයුධයි" යනුවෙනි. මෙම අදහස් පළ වූයේ අන්ත-දක්ෂිණාංශික ආරක්ෂක අමාත්‍යවරයා යුරෝපය බලා පිටත්ව යාමට ආසන්නව තිබියදීය. පැරිසිය සිය න්‍යෂ්ටික ආයුධ ගබඩාව ඉහළ නැංවීමට සැලසුම් කරන අතරම, හෙල්සින්කි (ෆින්ලන්තය) මෑතකදී නේටෝ න්‍යෂ්ටික ආයුධ එරට ස්ථානගත කිරීම පිළිබඳ තහනම ඉවත් කිරීම උපුටා දක්වමින්, ඔහු ප්‍රංශය සහ ෆින්ලන්තය යන රටවල් දෙකම අනුගමනය කළ යුතු උදාහරණ ලෙස පෙන්වා දුන්නේය.

පරමාණු බෝම්බ ප්‍රහාරයන්ගෙන් පීඩා විඳි එකම රට වන ජපානය තුළ න්‍යෂ්ටික ආයුධ සත්කාරකත්වය දැරීම (hosting) හෝ ලබා ගැනීම (acquire) "හදිසි අවස්ථාවකදී" අත්‍යවශ්‍ය කරුණක් ලෙස කොයිසුමි ඉදිරිපත් කළේය. ඔහු තවදුරටත් මෙසේ පැවසීය: "මෙය සලකා බලන විට, ජපානය මුහුණ දී සිටින ආරක්ෂක පරිසරය තුළ කිසිදු තහනම් වචනයකින් (taboo) තොරව සාකච්ඡා කරමින් සහ ඉදිරියට යමින්, දැඩි අර්බුදකාරී හැඟීමකින් යුතුව සෑම ප්‍රතිපත්තියකටම අප එළඹිය යුතු බව පැහැදිලි කිරීමට අප මීටත් වඩා වැඩි උත්සාහයක් ගත යුතු යැයි මම විශ්වාස කරමි."

යුක්රේනය තුළ රුසියාවට එරෙහිව ඇමරිකාව/නේටෝව විසින් ඇවිලූ යුද්ධය පුපුරා ගිය තැන් පටන්, ජපානයේ වේගවත් ප්‍රතිසන්නද්ධ වීම සඳහා නිදහසට කරුණක් (pretext) ලෙස චීනය තායිවානයට ප්‍රහාරයක් එල්ල කිරීමට සැලසුම් කරන බවට චෝදනා කරමින්, "අද යුක්රේනය හෙට නැගෙනහිර ආසියාව විය හැකිය"යි ටෝකියෝව නිතිපතා ප්‍රකාශ කර ඇත.

කෙසේ වෙතත්, වොෂින්ටනයේ න්‍යෂ්ටික ආයුධ ගබඩාව හෝ ජපානයේ න්‍යෂ්ටික අභිලාෂයන්ට ආරක්ෂාව සමඟ කිසිදු සම්බන්ධයක් නොමැත. ඉරානයට එරෙහිව අඩු ඵලදායී (low-yield) න්‍යෂ්ටික ආයුධ භාවිතා කිරීම "කළ හැක්කක්ද" යන්න ඇමරිකානු ජනාධිපති ට්‍රම්ප් අසා ඇති බව වාර්තා වේ. චීනය සමඟ යුද්ධයක් ඇති වුවහොත්, ඇමරිකාව සැකයකින් තොරව මෙවැනි ආයුධ වෙත යොමු වනු ඇති අතර, ජපානය එවැනි ප්‍රහාර සඳහා විභව මෙහෙයුම් වේදිකාවක් (staging ground) බවට පත් කරනු ඇත.

ජපානය තුළ න්‍යෂ්ටික ආයුධ ස්ථානගත කිරීම මගින් ඉන්දු-පැසිෆික් කලාපය තවදුරටත් අස්ථාවර කරනු ඇති අතර, එය සැකයකින් තොරව පුළුල් ආයුධ තරඟයකට සහ න්‍යෂ්ටික යුද්ධයක ඊටත් වඩා විශාල අනතුරකට මග පාදනු ඇත.

කොයිසුමිගේ ප්‍රකාශයන්ට ප්‍රතිචාර දක්වමින් චීන විදේශ අමාත්‍යාංශයේ ප්‍රකාශක ලින් ජියාන් සඳුදා මෙසේ ප්‍රකාශ කළේය: "ජපන් බලධාරීන් න්‍යෂ්ටික කාරනාව පිළිබඳ ඔවුන්ගේ

වැරදි ගණනය කිරීම්වල එල්බ සිටින්නේ නම්, න්‍යෂ්ටික-හරණ මූලධර්ම ත්‍රිත්වය (three non-nuclear principles) සංශෝධනය කිරීමට වෙර දරන්නේ නම් සහ මිත්‍ර පාක්ෂිකයින්ගේ න්‍යෂ්ටික ආයුධ ජපානයේ ස්ථානගත කරන්නේ නම්, ඔවුන් පශ්චාත්-යුධ (දෙවන ලෝක යුද්ධයෙන් පසු) ජාත්‍යන්තර පිළිවෙත සහ ජාත්‍යන්තර න්‍යෂ්ටික අවි ව්‍යාප්ති පාලන තන්ත්‍රයට (international nuclear non-proliferation regime) බරපතල ලෙස අභියෝග කරනවා පමණක් නොව, සාමය සඳහා වූ කැපවීම උල්ලංඝනය කරමින්, ජපන් ජනතා අවශ්‍යතාවයන්ට පිටුපාන අතර, අවසානයේදී ඒ සඳහා අධික වන්දියක් ගෙවීමට ඔවුනට සිදුවනු ඇත."

වොෂින්ටනය සහ ටෝකියෝව යන දෙපාර්ශවයම, ඉහළ මට්ටමේ රාජ්‍ය තාන්ත්‍රික දූත මෙහෙවරයන් දියත් කිරීමෙන්, තායිවාන් සමුද්‍ර සන්ධිය හරහා නාවික යුධ නැව් යැවීමෙන් හෝ දිවයිනේ නිදහසට පක්ෂපාතී මතවාදයන්ට අනුබල දීමෙන්, එක් චීනයක් ප්‍රතිපත්තියට (One China policy) අඛණ්ඩව අභියෝග කරමින් වසර ගණනාවක් තිස්සේ බෙයිජිං පාලනය කුපිත කර ඇත. තායිවානය නිදහස ප්‍රකාශ කළහොත්, එය චීන භූමිය අනාගතයේදී කැබලි කිරීම සඳහා පූර්වාදර්ශයක් සපයන අතරම අධිරාජ්‍යවාදී බලවතුන්ට ප්‍රධාන භූමියට එරෙහිව යුද කඳවුරක් සපයන බව සම්පූර්ණයෙන්ම වටහාගෙන සිටින බෙයිජිං පාලනය, මෙම විෂයය සම්බන්ධයෙන් අතිශයින් සංවේදී වේ.

ඇමරිකාව සහ ජපානය ඇතුළු ලොව පුරා රටවල් දශක ගණනාවක් තිස්සේ තායිවානය චීනයේ කොටසක් බව පිළිගනිමින් එක් චීනයක් ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කර ඇත. ඇමරිකාව ලාභ චීන ශ්‍රමය ග්‍රහණය කර ගැනීමට සහ බෙයිජිං හා මොස්කව් අතර පැවති ආතතීන් ගසා කෑමට මාන බලමින්, 1979 දී වොෂින්ටනය බෙයිජිං සමඟ විධිමත් සබඳතා ඇති කර ගත්තේ එම පදනම මත ය.

පසුගිය නොවැම්බර් මාසයේදී, අන්ත දක්ෂිණාංශික අගමැති සානා ටකායිචි ප්‍රකෝපකාරී ලෙස ප්‍රකාශ කළේ තායිවානයේ “හදිසි අවස්ථාවක්” ජපානය සඳහා"පැවැත්මට තර්ජනයක් වන තත්වයක්” (survival-threatening situation) නිර්මාණය කරන බවයි — එය “ආත්ම ආරක්ෂාව” (self-defense) නාමයෙන් චීනයට එරෙහි යුද්ධය සඳහා අවශ්‍ය නෛතික සාධාරණීකරණය සැපයීමකි.

කෙටි කාලීනව, වඩාත්ම සිදුවිය හැකි දර්ශනය වනුයේ ටෝකියෝව විසින් ජපන් භූමිය තුළ ඇමරිකානු න්‍යෂ්ටික ආයුධ සඳහා සත්කාරකත්වය දැරීමයි. කෙසේ වෙතත්, ටෝකියෝව ඇමරිකාවේ කනිෂ්ඨ හවුල්කරුවෙකු (junior partner) පමණක් වීමේ අභිලාෂයක් නොමැත. ඒ වෙනුවට, ජපානය තුළ විවෘතව න්‍යෂ්ටික ආයුධ රඳවා තැබීමට ඇමරිකාවට ඉඩ දීම මගින් ටෝකියෝවට තවත් ඉදිරියට යාමටත්, තමන්ගේම න්‍යෂ්ටික ආයුධ ගබඩාවක් පිහිටුවා ගැනීමටත් පූර්වාදර්ශයක් සැපයෙනු ඇත. ජපානය සතුව අවම වශයෙන් කිලෝග්‍රෑම් 8,000 ක ආයුධ ශ්‍රේණියේ ප්ලූටෝනියම් (weapons-grade plutonium) තොගයක් පවතින අතර, එය න්‍යෂ්ටික ආයුධ 1,600 ක් සෑදීමට ප්‍රමාණවත් වේ. ජපානයේ තොග පිළිබඳ වෙනත් තක්සේරුවල අගයන් මීට වඩා සැලකිය යුතු ලෙස ඉහළ ය.

කලාපයේ ප්‍රධාන බලවතා ලෙස නැවත නැගී සිටීමට ගන්නා උත්සාහයේදී, ජපන් අධිරාජ්‍යවාදයට තමන්ගේම න්‍යෂ්ටික ආයුධ සහිත වීම, ඇමරිකාවේ වියදමින් පවා තමන්ගේම ආර්ථික හා මූලෝපායික අවශ්‍යතා තහවුරු කර ගැනීම සඳහා වැඩි හැකියාවක් ලැබෙනු ඇත.

කොයිසුමිගේ මෑතම අදහස් දැක්වීම්වල අරමුණ වන්නේ ජපානයේ න්‍යෂ්ටික අභිලාෂයන් ආවරණය කර ගැනීම වන අතරම, යුද්ධය සාධාරණීකරණය කිරීම සඳහා චීනය කෙරෙහි මහජනතාව තුළ බියක් ඇති කිරීමයි. ඔක්තෝබර් මාසයේ බලයට පත්වූ තැන් සිට, ටකායිචි සහ ඇගේ රජයේ අනෙකුත් ප්‍රමුඛයින් **ජපානය තමන්ගේ භූමිය තුළ න්‍යෂ්ටික ආයුධ ළඟ තබා නොගන්නා බවට, නිෂ්පාදනය නොකරන බවට හෝ ඉඩ නොදෙන බවට ප්‍රකාශ කෙරෙන ජපානයේ “න්‍යෂ්ටික-හරණ මූලධර්ම තුන” සංශෝධනය කිරීමට ඉඟි කර ඇත.**

න්‍යෂ්ටික-හරණ මූලධර්ම තුන ප්‍රථමයෙන් ගෙනහැර දක්වන ලද්දේ 1967 දී ය, නමුත් ඒවා නීත්‍යානුකූලව බැඳ නොතබන අතර අතීතයේදී උල්ලංඝනය කර ඇත. 2024 දී, නිහොන් විශ්ව විද්‍යාලයේ (Nihon University) සම්මානිත මහාචාර්ය ටකාෂි ෂිනොබු ලේඛන හෙළිදරව් කරමින් පෙන්වා දුන්නේ, ඇමරිකා-ජපාන ආරක්ෂක ගිවිසුම සංශෝධනය කිරීම සඳහා 1958 සහ 1960 අතර පැවති සාකච්ඡා අතරතුර, ජපන් රජය විමසීමකින් තොරව න්‍යෂ්ටික ආයුධ රැගත් ඇමරිකානු යුධ නැව් ජපන් වරායන්හි නැංගුරම් ලෑමට රහසිගතව ඉඩ දීමට ජපානය එකඟ වූ බවයි.

2017 දී ඇමරිකාව විසින් රහසිගතභාවයෙන් මුදාහළ (declassified) 1969 ලියවිල්ලකින් ද පෙන්නුම් කළේ, 1972 දී එම ප්‍රදේශය ජපානයට ආපසු ලබා දීමේ කොන්දේසියක් ලෙස “හදිසි පදනමක්” යටතේ ඔකිනාවා වෙත න්‍යෂ්ටික ආයුධ ගෙන ඒමට වොෂින්ටනයට ඉඩ දීමට ටෝකියෝව එකඟ වූ බවයි.

ජූලි 6 වන දින, ප්‍රධාන මිලිටරි ලේඛන තුන සංශෝධනය කිරීමේදී “න්‍යෂ්ටික-හරන මූලධර්ම තුන” සමාලෝචනය කිරීම පිළිබඳ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ටකායිචි ප්‍රකාශ කළේ, තමා “සෑම විෂයයක්ම සාකච්ඡාව සඳහා අනිවාර්යයෙන්ම මේසය වෙත ගෙන එන” බවයි. දෙසැම්බර් මාසයේදී, නම සඳහන් නොකළ රජයේ නිලධාරියෙකු ද ජපානයට න්‍යෂ්ටික ආයුධ අවශ්‍ය බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේ යැයි ප්‍රසිද්ධ විකාශන සේවයක් වන NHK වාර්තා කළේය.

ජපානය, සැලසුම් කළ කාලයට වසරකට පෙර, එනම් 2026 අග වන විට අදාළ ප්‍රධාන සන්නද්ධ ලේඛන තුන සංශෝධනය කිරීමට සැලසුම් කරයි. මෙම ලේඛන තුන 2022 දී

සංශෝධනය කරන ලද අතර, 2027 වන විට මිලිටරි වියදම් දළ දේශීය නිෂ්පාදිතයෙන් (GDP) සියයට දෙක දක්වා දෙගුණ කිරීමේ සැලසුමක් ගෙනහැර දැක්වීය. ටකායිචි රජය පසුගිය වසර අවසානයේදී එම ඉලක්කයට ළඟා වූ අතිරේක අයවැයක් සම්මත කළේය. අනුගමනය කළ යුතු ආකෘති ලෙස සියයට 3.5 ක් වැය කිරීමට නේටෝ රටවල් සහ දකුණු කොරියාව ලබා දී ඇති පොරොන්දු රජය උපුටා දක්වන බැවින් අනාගත වියදම් ඊටත් වඩා වැඩි විය හැකිය.

ජපානය තුළ න්‍යෂ්ටික ආයුධ සඳහා වන ඉල්ලීම් අලුත් දෙයක් නොවේ. උදාහරණයක් ලෙස, හිටපු අගමැති ෂින්සෝ අබේ 2022 පෙබරවාරි මාසයේදී ප්‍රකාශ කළේ, ටෝකියෝව යුරෝපීය රටවල අඩිපාරේ යමින් ඇමරිකානු න්‍යෂ්ටික ආයුධ සඳහා සත්කාරකත්වය දැක්විය යුතු බවයි. “සාකච්ඡා කරමින් පැවතෙන බව ” යන භාෂාවෙන් ආවරණය කරන මෙම යෝජනාවල ප්‍රවේශම් සහගත ස්වභාවය, කම්කරු පන්තිය තුළ පවතින පුළුල් විරෝධයේ ප්‍රතිඵලයකි. අසාහි ෂිම්බුන් (Asahi Shimbun) පුවත්පත මගින් අප්‍රේල් මාසයේදී පවත්වන ලද සමීක්ෂණයකදී, 75% ක ජනතාවක් ජපානයේ න්‍යෂ්ටික-හරණ ප්‍රතිපත්ති තුනෙහි කිසිදු වෙනසක් කිරීමට විරුද්ධ වූහ. මැයි මාසයේදී ජපානයේ මිලිටරි ව්‍යාප්තිය හෙළා දකිමින් විශාල විරෝධතා පැවැත්විණි.

ලොව දෙවන විශාලතම ආර්ථිකය ලෙස චීනය විසින් අභිබවා යනු ලැබීමෙන් පසුව, ජපානය මිලිටරි බලය ඇතුළු සියලු මාර්ගවලින් සිය පසුබැසීම ආපසු හැරවීමට උත්සාහ කරයි. මෙයට පාලක පන්තියේ ව්‍යාජ “සාමකාමීත්වයට” (pacifism) ඇලී සිටීම අතහැර දැමීම පමණක් නොව, සමස්තයක් ලෙස කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් සහ අවශ්‍යතාවයන් නොතකා කටයුතු කිරීම ද අවශ්‍ය වේ.

[අවධාරණය පරිවර්තනයේදී එක් කෙරුණි.]

---

# චෙම්මනි සමූහ මිනීවළේ මළගියවුන් කතා කරයි




2026 ජුලි 19 වන දින චෙම්මනි සමූහ මිනීවළෙන් සොයාගත් අංක 429 දරන මානව අවශේෂ. ඡායාරූපය කුමානන් කණා ෆේස්බුක් පිටුවෙනි.

**දිනේශ් ශක්ති** විසිනි.

මෙම ලිපිය 2026 ජුලි 20 දින theSocialist.lk වෙබ් අඩවියේ “***The Dead Speak at the Chemmani Mass Grave***” යන සිරසින් පළ කෙරුණි.

චෙම්මනි සමූහ මිනීවළේ කැණීම් කටයුතුවල 3 වන අදියරේ 37 වන දිනය වූ ඊයේ (19) ගොඩගන්නා ලද 429 වන මිනිස් ඇට සැකිල්ල, **හිඳගෙන සිටින ඉරියව්වකින් වළලා තිබියදී සොයා ගන්නා ලදී. එනම්, දෙපා නමා, දෑත් උකුල මත තබා, සිරුර ඊසාන දෙසට යොමු වන සේ තිබී ඇත.** මෙලෙස සොයාගත් දෙවන අවස්ථාව මෙයයි. 2025 වසරේ සිදුකළ 2 වන අදියරේදී සොයාගන්නා ලද 227 වන මිනිස් සැකිල්ලද මෙවැනිම ඉරියව්වකින් තිබී සොයාගන්නා ලදී. දකුණේ ස්ථාපිත කිසිදු ජනමාධ්‍ය ආයතනයකට මෙම සොයාගැනීම් කිසිවක් පුවතක් බවට පත් නොවීය.

යමෙකු විසින් මෙම පුද්ගලයා සිතාමතාම, යම් කිසි විශේෂිත දිශානතියකට යොමු කර වළලා ඇත. එම කාරණාව, කිසිදිනෙක වසා දැමිය නොහැකි තුවාලයකි.

චෙම්මනි-සිට්ටුපට්ටි යනු මේ වන විට **ශ්‍රී ලංකාවේ විශාලතම සමූහ මිනීවළයි.** එහි ළදරුවන් හයදෙනෙකු ඇතුළුව ළමයින් 18 දෙනෙකුගේ ශේෂයන් ද ඇතුළත්ව, මිනිස් ඇටසැකිලි කොටස් 400 කට වඩා පවතී. 2025 පෙබරවාරි මාසයේදී ආදාහනාගාරයක අත්තිවාරමක් කැපීමේදී ගොඩනැගිලි කම්කරුවන්ට අහම්බෙන් ඇටකටු හමු වීම නිසා පමණක් කැණීම් කටයුතු ආරම්භ විය. මියගියවුන් සැබවින්ම පොළොව යටින් මතු විය.

මෙම මිනීවළවල්වල ඉතිහාසය, ශ්‍රී ලංකා යුද හමුදාව යාපනය නැවත අත්පත් කරගත් **1995-96**කාලසීමාව දක්වා දිව යයි. දෙමළ පාසල් ශිෂ්‍යාවක වූ ක්‍රිෂාන්ති කුමාරස්වාමි දූෂණය කර ඝාතනය කිරීම සම්බන්ධයෙන් වරදකරු

වූ හමුදා කෝප්‍රල්වරයෙක් 1998 දී අධිකරණය හමුවේ පාපොච්චාරණය කළේය. එනම්, **ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන්ගේ** නියෝග මත "සැකකරුවන්", පැහැරගනු ලැබූවන් සහ අතුරුදහන් වූවන් ඇතුළු දෙමළ සිවිල් වැසියන් සිය ගණනක් ඝාතනය කර මෙහි රහසිගතව වළලා දැමූ බවයි. අවසානයේ හමුදා නිලධාරීන් හත්දෙනෙකු සඳහා අත්අඩංගුවට ගැනීමේ වරෙන්තු නිකුත් කරන ලදී. නමුත් ඔවුන් සියලු දෙනා ඇප මත මුදා හැරුණි. 2004 වන විට, මුළු නඩුවම **නිහඬවම යටපත් කර දමන ලදී.**

**දශක තුනකට** ආසන්න කාලයක් තිස්සේ පත්වූ අනුප්‍රාප්තික ආණ්ඩු, එනම් එජාප, පොදුජන එක්සත් පෙරමුණ, ශ්‍රීලනිප, නැවතත් එජාප, පොහොට්ටුව (SLPP), සහ 2009 හමුදා "ජයග්‍රහණය" සමරන ලද වත්මන් **ජේවීපී /එන්පීපී** ආණ්ඩුව ආදී සියල්ලම අන් හැමටම වඩා එක් දෙයක් තහවුරු කර ඇත. එනම්, **ඝාතකයන්ට ලබා දී ඇති අපරාධවලින් නිදහස් වීමේ මුක්තියයි.**

අද ජේවීපී අධිකරණ අමාත්‍යවරයා එම ස්ථානයට පැමිණෙන අතර (ජුනි 19), සත්‍යය සහ වගවීම ඉල්ලා සිටින සිය ගණනක් විරෝධතාකරුවන්ට මුහුණ දෙමින්, "වසර දෙකක් ඇතුළත" සාධාරණය ඉටු කරන බවට පොරොන්දු වෙමින් ඔවුන් මගහැර ගියේය. නමුත් එම නින්දිත ක්‍රියාව එතැනින් අවසන් වන්නේ නැත. කුඩා දරුවන්ගේ ඇටකටු ද ඇතුළුව, අස්ථි කොටස් 400 කට වඩා ඇති ශ්‍රී ලංකාවේ විශාලම සමූහ මිනීවළ අසල සිටගෙන සිටීමෙන් පසුව, යාපනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවැති හමුවකදී ජනතාව නැගූ ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් අමාත්‍යවරයා, චෙම්මනි යනු සමූහ මිනීවළක් ද යන්න පිළිබඳව ප්‍රසිද්ධියේ සැක පහළ කළ අතර, එය සාමාන්‍ය සුසාන භූමියක් විය හැකි බවට ඇඟවනු ලැබිය. ඔහු ප්‍රකාශ කළේ, "ඉස්සෙල්ලම මෙතන cemetery යක් තියෙන්නෙ, dating කර ගන්න ඕන, bones වල cause of death බලන්න ඕන" බවත්, "[අනන්‍යතාවය] identify කර ගත්තොත්, පැමිණිල්ලක් ආවොත් DNA අරගත්තට පස්සෙ තමයි culprit කෙනෙක් හොයන්න වෙන්නෙ" යනුවෙනි. මෙය ව්‍යාකූලත්වයක් නොවේ. මෙය නොදැනුවත්කම ද නොවේ. හින්දු ආදාහනාගාර භූමියක පස යට මළ සිරුරු 400 ක්, ඒ අතර කුඩා දරුවන් හයදෙනෙකුගේ සිරුරු ද තිබියදී, අඩි 1.6 ක වැනි ඉතා අඩු ගැඹුරක මළ සිරුරු සමූහ වශයෙන් වළලා තිබියදී, සහ ඝාතනවලට අණදුන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ නම් සඳහන් කරමින් වරදකරු වූ යුද හමුදා කෝප්‍රල්වරයෙකු අධිකරණය හමුවේ දිවුරා දුන් සාක්ෂි තිබියදී මෙයට "සාමාන්‍ය සුසාන භූමියක්" ලෙස හැඳින්වීම වසන් කිරීමේ භාෂාවයි. එය ප්‍රසිද්ධියේ කතා කරන දණ්ඩමුක්තියේ භාෂාවයි.

එය ජේවීපී අමාත්‍යවරයෙකුගේ මුවින් පිටවීම සුදුසුය. එම පක්ෂයම වසර 26 ක යුද්ධය පුරාම හමුදා ජයග්‍රහණයක් උදෙසා වර්ගවාදී ප්‍රචාරණ ව්‍යාපාරයක නිරත වූ, දැන් පසෙන් මතු කරගනු ලබන ලේබනගත කළ අපරාධ සිදු කළ රාජපක්ෂවරුන්ගේ බලය සක්‍රියව ශක්තිමත් කළ, සහ ද්‍රවිඩ සිවිල් වැසියන් 40,000 ක් ඝාතනය කර තිබියදීත් 2009 "යුද ජයග්‍රහණය" සැමරූ පක්ෂයයි. ප්‍රතිපාදන නිදහස් කිරීම ප්‍රතික්ෂේප කරමින් දෙවන අදියරේ කැණීම් මාස අටක් තිස්සේ අත්හිටවූයේත්, උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්හි 100,000 කට අධික සෙබළුන් පිරිසක් තවදුරටත් රඳවා තබා ගන්නේත්, පසුගිය වසරේදී ජාත්‍යන්තර යුද අපරාධ පරීක්ෂණයක් සඳහා වූ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළේත් මෙම රජයමය. අමාත්‍යවරයාගේ මෙම සැකය අහම්බයක් නොවේ. එය කිසිදු ලැජ්ජාවකින් තොරව ප්‍රකාශිත රජයේ ප්‍රතිපත්තියයි.

තවද චෙම්මනි පමණක් හුදෙකලාව නැත. මන්නාරම. තිරුකෝණමලේ. කොක්කුතොඩුවායි. කලාවංචිකුඩි ආදී ප්‍රදේශ ද වේ. උතුර සහ නැගෙනහිර යනු සලකුණු නොකළ සමූහ මිනීවලවල්වලින් පිරුණු භූමියකි.

**මෙම ධනපති රාජ්‍යයෙන් කිසිදු සාධාරණයක් ඉටු වන්නේ නැත.** ජේවීපී (JVP) පාලනයක් යටතේවත්, යූඑන්පී (UNP) පාලනයක් යටතේවත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ(SLFP) පාලනයක් යටතේවත්, සමස්ත දේශපාලන ක්‍රමයම දෙමළ විරෝධී වාර්ගවාදය මත ගොඩනගන ලද සිංහල ධනපති පන්තියේ කිසිදු සැකැස්මක් යටතේවත් එය සිදු නොවේ. එසේම, මුළු යුද්ධය පුරාම ශ්‍රී ලංකා හමුදාවට **ආයුධ සපයමින්, පුහුණුව ලබා දෙමින්, අරමුදල් සපයමින් සහ දේශපාලනිකව සහය දක්වමින්**, පසුව 2009 දී වන්නියේදී 40,000 ක සාමාන්‍ය සිවිල් වැසියන් ඝාතනය වෙද්දී අහක බලාගත් වොෂින්ටනය, ලන්ඩනය, බ්‍රසල්ස් වැනි "ජාත්‍යන්තර ප්‍රජාවගෙන්" පිහිට පතන දෙමළ ජාතිකවාදී පක්ෂ වලින්ද සාධාරණයක් ඉටු වන්නේ නැත. අද දිනයේ ගාසා හි ඊශ්‍රායල ජන සංහාරයට සහය දක්වන්නේද මෙකී අධිරාජ්‍යවාදී බලවතුන්මය.

එමෙන්ම කිසිදු සැකයක් තබා නොගත යුතුය: LTTE සංවිධානයේ සහ **එයින් කැඩී ගිය කණ්ඩායම්වල** අපරාධ සඳහාද යුක්තිය ඉටු විය යුතුය. බලහත්කාරයෙන් ළමා සොල්දාදුවන් ලෙස බඳවා ගැනීම, දෙමළ දේශපාලන ප්‍රතිවාදීන් ඝාතනය කිරීම, උතුරෙන් ජනයා වාර්ගිකව ශුද්ධ කිරීම සහ සිංහල සිවිල් වැසියන්ට එල්ල කළ බෝම්බ ප්‍රහාර ආදිය ඊට ඇතුළත් ය. යුද්ධය පිළිබඳ කම්කරු පන්තියේ සැබෑ, ස්වාධීන, වගවීමට ලක් කිරීමේ ක්‍රියාදාමයක් මර්දනය කිරීම තුළ තමන්ගේම අභිමතාර්ථ තිබෙන දෙමළ ධනපති පන්තියද රැඳී ඇති මෙම ධනපති රාජ්‍ය ක්‍රමය යටතේ මේ අපරාධ සම්බන්ධයෙන් කිසිදා අවංක ඇගයීමක් සිදු නොවනු ඇත.

දෙපා නමාගෙන, දෑත විවේකීව තබාගනිමින්, ඊසාන දෙසට මුහුණ ලා වාඩි වී සිටින මෙම සැකිල්ල, අණ පිළිපැදි සෙබළුන් විසින් හදිසියේ වළදමන ලද, ජනාධිපතිවරුන්ගේ ආරක්ෂාව ලැබූ ජෙනරාල්වරුන් විසින් වසර තිහක් පුරා වසා දමන ලද, එකිනෙකාට එරෙහිව බෙදා දමන ලද බහු-වාර්ගික සමාජයක් පාලනය කරන විට ධනපති ක්‍රමය විසින් බිහි කරනු

ලබන ප්‍රතිඵල පිළිබඳ ජීවමාන සාක්ෂියකි.

**වළදමන ලද මිනිසුන් සැමදා වළදමා තැබිය නොහැක. නමුත් යුක්තිය කිසිදිනෙක මෙම පද්ධතිය තුළින් ඉටු නොවනු ඇත.**

එම සාධාරණය ඉටු වනුයේ, දෙමළ, සිංහල සහ මුස්ලිම් කම්කරුවන්, කිසිදු ධනපති පක්ෂයක් පිටුපස හෝ අධිරාජ්‍යවාදී 'ජාත්‍යන්තර ප්‍රජාව' පිටුපස නොගොස්, චෙම්මනි වැනි ඛේදනීය සිදුවීම්වලට මග පෑදූ ධනපති ක්‍රමය පෙරළා දැමීමටත්, **ශ්‍රී ලංකා සහ ඊළාම් සමාජවාදී ජනරජයක්** ගොඩනැගීමටත් පොදු අරගලයකට එකමුතු වූ විට පමණි.

එතෙක්, මේ පොළොව නොනවත්වාම හඬ අවදි කරනු ඇත.

# LTTE තහනම අප සැමටම එරෙහි ආයුධයකි: සංගීත්සන් අත්අඩංගුවට ගැනීම සහ රාජ්‍ය මර්දනයේ සැබෑ තර්කනය

**සංජය ජයසේකර**, ශ්‍රී ලංකා සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) විප්ලවවාදී වාම කණ්ඩායම වන, ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වයේ (SLLA) සාමාජික. සසප යනු, ලෝක සමාජවාදී වෙබ් අඩවිය (WSWS) ප්‍රකාශයට පත් කරන හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (ICFI) ශ්‍රී ලංකා ශාඛාවයි.

මෙම ලිපිය 2026 ජුනි 11 දින theSocialist.lk වෙබ් අඩවියේ "*The LTTE Ban is a Weapon against All of Us: The Arrest of Sangeethsan and the Real Logic of State Repression*" යන සිරසින් ඉංග්‍රීසි බසින් පළ කෙරුණි.

කිලිනොච්චියට සාමාන්‍ය දිනයක් විය යුතුව තිබූ දිනක (ජූනි 2 වනදා), වාවකච්චේරි පොලිසිය හරහා ක්‍රියාත්මක වූ යාපනය දිස්ත්‍රික් අපරාධ විමර්ශන කාර්යාංශය විසින් 24 හැවිරිදි සංගීතඥයෙකු අත්අඩංගුවට ගන්නා ලදී. ඔහුගේ නම ගනේෂ් කුමාර් සංකීතන් (සංගීත්සන්) වන අතර, ඔහු "හිප් හොප් සංගී" (HipHop Sangee – යූටියුබ් නාලිකාවේ නම) යන වේදිකා නාමයෙන් ප්‍රසිද්ධය. රජයට අනුව ඔහු කළ අපරාධය වන්නේ, බෙදුම්වාදී දෙමළ ඊළාම් විමුක්ති කොටි (LTTE) සංවිධානය වක්‍රව උත්කර්ෂයට නංවන බවට පොලිසිය චෝදනා කරන ගීත අන්තර්ජාලයට උඩුගත කිරීමයි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ (PTA) 3(h) වගන්තිය යටතේ ඔහුව සති දෙකකට රක්ෂිත බන්ධනාගාරගත කර ඇති බව ඔහුගේ නීතිඥ කේ. සයන්තන් අපට තහවුරු කළේය.

සමාජීය විවේචන සහ සංස්කෘතික කථාන්දර එකිනෙක මුසු කරමින් නිර්මාණය කරන ලද ගීත හේතුවෙන්, රැප් ගායකයෙක් වන සංගීත්සන් දේශීය දෙමළ හිප්-හොප් ප්‍රජාව අතර පුළුල් පිළිගැනීමක් ලබා ඇත. ඔහුගේ නිර්මාණ බොහොමයක් ඔහුගේ සමාජ මාධ්‍ය ගිණුම් ඔස්සේ ලබාගත හැකිය.




අප මේ පිළිබඳව තවදුරටත් ගැඹුරින් සොයා බැලීමට පෙර, එම ගීතවලින් එකක අන්තර්ගතය කුමක්දැයි සලකා බලමු. එය හුදු අපැහැදිලි සංස්කෘතික ප්‍රකාශනයක් හෝ නොපැහැදිලි කලාත්මක උපමාවක් නොවේ. එහි වේලුපිල්ලේ ප්‍රභාකරන් හැඳින්වීම සඳහා ඊළාම් දෙමළ දේශපාලන සංස්කෘතිය තුළ භාවිතා වන 'අන්නන්' (වැඩිමහල් සහෝදරයා) යන පදය යොදා ගනී. ජයග්‍රාහී ලෙස පැමිණෙන කොටි ධජය පිළිබඳව එහි සඳහන් වේ. එමෙන්ම, මියගිය LTTE සාමාජිකයන් වන 'මාවීරන්' (මහා වීරයන්) ඔවුන්ගේ නම්වලින් සහ ඔවුන්ගේ කැපකිරීම්වල ප්‍රතිරූපයන් මඟින් එහිදී ගෞරවයට පාත්‍ර වේ. නැවත පැමිණ දේශය ගොඩනඟන ලෙස එය ඔවුන්ගෙන් ඉල්ලා සිටියි. තවද, LTTE සංවිධානයේ මියගිය අය වෙනුවෙන් වාර්ෂිකව පවත්වනු ලබන "මාවීරර් නාල්" සැමරුම් මාසය වන "කාර්තිකෙයි" (නොවැම්බර්) මාසය එහි හැඟීම්බර සහ සංකේතාත්මක පසුබිම ලෙස භාවිත කර ඇත: එහිදී මියගිය අය වෙනුවෙන් මල් රැගෙන එන අතර, ඔවුන් වෙනුවෙන් හඬා වැලපෙන පවුල්වල සාමාජිකයෝ ඔවුන්ට ආමන්ත්‍රණය කරති; අවසානයේදී දේශය ගොඩනැඟීම සඳහා මියගිය අයට නැවත කැඳවීමක් කරනු ලබයි.

මේවා, යුද්ධයෙන් පීඩා විඳි දිස්ත්‍රික්කයක උපත ලබා, ශෝකය මැද හැදී වැඩුණු තරුණයෙකුගේ පද රචනයන් වේ. 2009 මැයි මාසයේ සිට තම ප්‍රජාවට ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමට ප්‍රජාතන්ත්‍රවාදී නොවන අයුරින් තහනම් කර ඇති දේ, කලාව තුළින් ඉදිරිපත් කිරීමට ඔහු සංගීතය උපයෝගී කරගෙන ඇත.

අප මෙම කරුණු ප්‍රකාශ කරන්නේ සංගීත්සන්ව දිගින් දිගටම සිරකුඩුවක

රඳවා තබා ගැනීමට අවශ්‍ය අයට අනුබල දීමට නොවේ. අප මේවා ප්‍රකාශ කරන්නේ, ශ්‍රී ලංකා රජය සහ සමාජ මාධ්‍ය ජාලාවල සිටින එහි අන්තවාදී ආධාරකරුවන් විනාශ කිරීමට එකලෙස උත්සාහ කරන එක්තරා මූලධර්මයක් වෙනුවෙන් මෙම ලිපිය පෙනී සිටින බැවිනි. එනම්, අවංක දේශපාලනයක් ආරම්භ විය යුත්තේ තමන්ට වාසිදායක දේ පමණක් තෝරාගෙන ඉතිරිය මඟ හැරීමෙන් නොව, සත්‍යය පදනම් කර ගනිමිනි. අප ඉදිරියේ ඇති ගැටලුව වන්නේ සංගීත්සන්ගේ පද රචනා මඟින් අප අනුමත කරන දේශපාලන වැඩපිළිවෙළක් ප්‍රකාශ කෙරේද යන්න නොවේ. ඒවායින් එවැන්නක් ප්‍රකාශ නොවන අතර, ඊට හේතුව ඉදිරි ඡේදවලදී අප නිහතමානීව හා පැහැදිලිව විස්තර කරන්නෙමු. අප ඉදිරියේ ඇති ප්‍රශ්නය මීට වඩා වෙනස් මෙන්ම මූලික එකකි: එනම් තරුණයෙකු තම ගීතවල අඩංගු දේශපාලන කරුණු හේතුවෙන් සිරගත කිරීමට කිසියම් හෝ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට අයිතියක් තිබේද? යන්නයි.

එයට ඇති පිළිතුර නැත යන්නයි. නිසැකවම, නැත යන්නයි.

වැරදි, නොමඟ ගිය හෝ අන් අයගේ දැඩි විරෝධයට ලක්වන දේශපාලන මතවාදයන් ප්‍රකාශ කිරීමේ නිදහස ද ඇතුළුව දේශපාලනික අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස යනු කම්කරු පන්තිය විසින් උපරිම අවධානයෙන් යුතුව ආරක්ෂා කරන අයිතිවාසිකමකි. ඒ සඳහා පවතින්නේ එකම එක් මූලධර්මාත්මක සහ කිසිසේත් එකඟ විය නොහැකි ව්‍යතිරේකයකි: එනම් ෆැසිස්ට්වාදී කතා සහ ෆැසිස්ට්වාදී සංවිධානයයි. එය හැර, අප අන් සියලුම, අදහස් ප්‍රකාශ කිරීම් ආරක්ෂා කරන්නේ සියලුම දේශපාලන අදහස් එකලෙස නිවැරදි බැවින් නොවේ. දෙමළ ජනතාවගේ ශෝකය නිහඬ කිරීම සඳහා අද දින නිර්මාණය කර ඇති මර්දනකාරී නීතිමය යාන්ත්‍රණය, හෙට දින වැඩවර්ජනය කරන කම්කරුවන්ට, විරෝධතා පවත්වන සිසුන්ට සහ ධනේශ්වර රාජ්‍යයේ බලයට අභියෝග කරන වෙනත් ඕනෑම අයෙකුට එරෙහිව හරවනු ලබන්නේ, එම යාන්ත්‍රණයම වන බැවිනි. මෙය හුදු න්‍යායාත්මක අනතුරු ඇඟවීමක් නොවේ. මෙය ලංකාවේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA), අනෙකුත් ආරක්ෂක නීති සහ අත්‍යවශ්‍ය සේවා නීති පිළිබඳ ලේඛනගත ඉතිහාසයයි. මෙම නීති සිංහල ග්‍රාමීය තරුණයන්ට, සිසුන්ට, මුස්ලිම් තරුණයන්ට, දෙමළ මාධ්‍යවේදීන්ට, වතු කම්කරුවන්ට, විදුලිබල කම්කරුවන්ට සහ වරාය කම්කරුවන්ට එරෙහිව එකලෙස සහ වෙනසකින් තොරව සාහසික ලෙස භාවිත කර ඇත.

මෙම ලිපිය මූලිකවශයෙන්ම ලියැවෙන්නේ, අප මෙහි සාකච්ඡා කරන කරුණු තම දෛනික අත්දැකීම බවට පත්ව ඇති ජනතාව උදෙසා නොවේ. මෙය ලියැවෙන්නේ සිංහල තරුණ තරුණියන්, කොළඹ, මහනුවර සහ ගාල්ලේ මධ්‍යම පන්තික පවුල් මෙන්ම වතුවල සහ කර්මාන්තශාලාවල සේවය කරන කම්කරුවන් වෙනුවෙනි. ඔවුන්ට තම ජීවිත කාලය පුරාම අසන්නට ලැබුණේ 2009 මැයි මාසයේදී දෙමළ ප්‍රශ්නය විසඳා අවසන් වූ බවත්, "ත්‍රස්තවාදය" පරාජය කළ බවත්, දෙමළ දේශපාලන ප්‍රකාශනයන් කෙරෙහි දක්වන ඕනෑම අනුකම්පාවක් රටට එරෙහි කුමන්ත්‍රණයක් බවත්ය. මෙය ලියැවෙන්නේ, සමාජ මාධ්‍ය ඔස්සේ සංගීත්සන්ගේ පද රචනා සංසරණය වනු දැකීමෙන්, එහි ඇත්තේ කොටි කොඩිය, ප්‍රභාකරන්, දෙමළ ඊළම ආදිය යන්නත්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) තියෙන්නේ හරියටම මෙන්න මේ වගේ දේවල්වලට තමයි යනුවෙනුත් ස්වයංක්‍රීය ප්‍රතිචාරය දැක්වීමට හුරු කරන ලද වූ පිරිස් වෙනුවෙනි.

මෙය ලියැවෙන්නේ මෙසේ ප්‍රශ්න කිරීමටය: එම ස්වයංක්‍රීය ප්‍රතිචාරය ඇති කර ගැනීමට ඔබට කියා දුන්නේ කවුද? එයින් වාසි ලබන්නේ කවුද? එමෙන්ම, සිංහල පුද්ගලයෙකු ලෙස නොව, කම්කරුවෙකු ලෙස, තරුණයෙකු ලෙස, සහ දෙමළ තරුණයන් හා කලාකරුවන්ගෙන් රිමාන්ඩ් බන්ධනාගාර පුරවන එම රාජ්‍යය විසින්ම තමන්ගේ ජීවන තත්ත්වය විනාශ කරනු ලැබ පවතින අයෙකු ලෙස, ඒ වෙනුවෙන් ඔබට ගෙවීමට සිදුව ඇති වන්දිය කුමක්ද?

### LTTE තහනමේ එල්ලය ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීම නොව, එය නිර්මාණය කිරීමය

හමුදාවේ අවසාන ප්‍රහාරයෙන් සිවිල් යුද්ධය අවසන් වීමට මාස කිහිපයකට පෙර, එනම් 2009 ජනවාරි මාසයේදී මහින්ද රාජපක්ෂ රජය විසින් ගැසට් පත්‍රයක් මඟින් LTTE ය තහනම් කළ දා සිට මේ දක්වා එම නිල තහනම අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇත. 2011 වසරේ නිකුත් වූ අවසාන ගැසට් පත්‍රය මඟින් මෙම තහනම තවදුරටත් ශක්තිමත් කළ අතර "ඊට අදාළ ක්‍රියාකාරකම්" ද ඇතුළත් වන පරිදි එය දීර්ඝ කරන ලදී. එතැන් සිට සිරිසේන, වික්‍රමසිංහ, ගෝඨාභය සහ දැන් පවතින දිසානායකගේ JVP/NPP රජය ඇතුළුව බලයට පත් සෑම රජයක්ම, මෙම නීතිමය රාමුව කිසිදු වෙනසකින් තොරව එලෙසම පවත්වාගෙන ගොස් ඇත.

සමාජවාදී සමානතා පක්ෂය (සසප/SEP) 2009 දී පැනවූ මුල් තහනමට විරුද්ධ වූ අවස්ථාවේදී, එම තහනම සැබවින්ම පැනවූයේ කුමකටද යන්න ඉතා නිවැරදිව පැහැදිලි කළේය. එකල නිකුත් කරන ලද ප්‍රකාශයේ සඳහන් වූයේ මෙම තහනමෙන් "LTTE සංවිධානයට සෘජු බලපෑමක් නොමැති බවයි, මන්ද ආණ්ඩුව ඒ වන විටත් එම දෙමළ බෙදුම්වාදී සංවිධානයට එරෙහිව යුද්ධය දියත් කර තිබූ බැවිනි." LTTE සංවිධානය සමඟ "සම්බන්ධ හෝ එය නියෝජනය කරන" සංවිධාන තහනම් කිරීමට මෙම නියෝගය මඟින් ලැබෙන පුළුල් බලතල, "පාර්ලිමේන්තු දේශපාලන පක්ෂයක් වන දෙමළ ජාතික සන්ධානයට (TNA) එරෙහිව වහාම භාවිත කළ හැකි බවට" ද එමඟින් අනතුරු අඟවන ලදී. එමෙන්ම, "මෙවැනි පුළුල් අර්ථකථනයන්, රජයේ විරුද්ධවාදීන් ලෙස සැලකෙන දේශපාලන පක්ෂ, වෘත්තීය සමිති හෝ ශිෂ්‍ය සංවිධාන ඇතුළු ඕනෑම

සංවිධානයකට එරෙහිව වුවද භාවිත කළ හැකි බව" සසප පූර්ණ නිරවද්‍යතාවයකින් යුතුව අනාවැකි පළ කළේය.[1]

වසර දාහතකට පසු, එම අනතුරු ඇඟවීම් එකින් එක සැබෑ වී ඇති බව විවිධ සිදුවීම් මඟින් තහවුරු වී ඇත. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) භාවිත කරමින් දෙමළ රැඳවියන් නඩු විභාගයකින් තොරව වසර ගණනාවක් තිස්සේ සිරගත කර තැබීමටත්, අයිසිස් (ISIS) සංවිධානය සහ අධිරාජ්‍යවාදී යුද්ධය හෙළා දකිමින් කවි ලිවීම හේතුවෙන් අහ්නාෆ් ජසීම් නම් තරුණ මුස්ලිම් කවියෙකුට වධ හිංසා පැමිණවීමටත්, දෙමළ මාධ්‍යවේදීන්ට හිරිහැර කිරීමටත් කටයුතු කර ඇත. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරන බවට වූ පොරොන්දුව මත බලයට පත් වූ JVP/NPP රජය, ගාසා වර්ග සංහාරයට සිය විරෝධය පළ කළ මුස්ලිම් තරුණයන්ට එරෙහිව මේ වන විටත් මෙම පනත භාවිත කර තිබේ. 2025 අගෝස්තු මාසයේදී, උතුරු පළාතේ සමූහ මිනීවළවල් පිළිබඳව වාර්තා කළ දෙමළ මාධ්‍යවේදියෙකුගෙන් ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය (TID) ප්‍රශ්න කරන ලදී. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වෙනුවට හඳුන්වා දීමට කෙටුම්පත් කරමින් පවතින නව ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත (PSTA) මඟින් එහි මූලික ලක්ෂණ එලෙසම රඳවාගෙන ඇති අතර, "මහජනතාව බිය ගැන්වීම" හෝ "යම් ක්‍රියාවක් කිරීමට හෝ එයින් වැළකී සිටීමට රජයට බල කිරීම" ඇතුළත් වන පරිදි "ත්‍රස්තවාදී ක්‍රියාවක්" ලෙස අර්ථ දැක්විය හැකි පරාසය තවදුරටත් පුළුල් කර ඇත. මෙම නීතිමය භාෂාව වෘත්තීය සමිති වැඩවර්ජන, මහජන විරෝධතා සහ ඕනෑම ආකාරයක සංවිධානාත්මක ප්‍රතිරෝධයක් අපරාධයක් බවට පත් කිරීම සඳහා භාවිත කළ හැකිය.

භාවිත කරන මෙවලම වෙනස් වේ. නමුත් එහි අරමුණ එලෙසම පවතී: එනම් ඕනෑම අවස්ථාවක, ඕනෑම අයෙකුට එරෙහිව එල්ල කළ හැකි, අවශ්‍ය ආකාරයකින් නිර්වචනය කර යොදා ගත හැකි නීතිමය ආයුධයක් ධනේශ්වර රාජ්‍යයේ අතට පත් කිරීමයි.

**මතකය අපරාධකරණය කිරීම අහම්බයක් නොවේ**

කිලිනොච්චියේ වෙසෙන 24 හැවිරිදි රැප් ගායකයෙකු දෙමළ ඊළාම් පිළිබඳව ගීත ගැයීම හේතුවෙන් රිමාන්ඩ් බන්ධනාගාරගතව සිටින්නේ මන්දැයි වටහා ගැනීමට නම්, කිලිනොච්චිය යනු කෙබඳු ප්‍රදේශයක්ද යන්න සහ කිසිවිටෙකත් නමකින් හෝ හැඳින්විය නොහැකි බවට රජය බලකර සිටින්නේ කෙබඳු තුවාලයක් පිළිබඳවද යන්න ඔබ තේරුම් ගත යුතුය.

කිලිනොච්චිය යනු LTTE පාලන ප්‍රදේශයේ පරිපාලන අගනුවර විය. එය යුද්ධයේ අවසාන වසරවලදී, වඩාත්ම දරුණු සටන් සහ සිවිල් වැසියන් අවතැන් වීම් සිදු වූ ප්‍රදේශයක් ද විය. එක්සත් ජාතීන්ගේ ඇස්තමේන්තුවලට අනුව, දසදහස් සංඛ්‍යාත දෙමළ සිවිල් වැසියන් පිරිසක් මියගිය එම ගැටුමේ අවසාන අදියරයන් ක්‍රියාත්මක වූයේ ඒ අවට පිහිටි වන්නි කලාපය තුළය. එම මහා විපතින් දිවි ගලවා ගත්, එනම් තම පියවරුන්, මව්වරුන්, ස්වාමිපුරුෂයන් සහ දරුවන් අහිමි වූ, රඳවා තැබීමේ කඳවුරුවල මාස ගණනාවක් ගත කිරීමට සිදු වූ සහ සුන්බුන් අතරින් සිය ජීවිත නැවත ගොඩනඟා ගත් පවුල්, අද ජීවත් වන්නේ එම අත්දැකීම් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීම පවා අපරාධමය ක්‍රියාවක් ලෙස සැලකිය හැකි සමාජයකය.

සංගීත්සන් යනු ත්‍රස්තවාදියෙකු නොවේ. ඔහු එම මහා විපතින් පසු බිහි වූ වටපිටාවක හැදී වැඩුණු, කලාකරුවන් (සංගීතඥයන්) සාමාන්‍යයෙන් තමන්ට දැනෙන දේ ප්‍රකාශ කරන එකම ක්‍රමය වන සංගීතය ඔස්සේ එම අත්දැකීම් විග්‍රහ කිරීමට උත්සාහ කළ තරුණයෙකි. දේශපාලනිකව මෙන්ම සදාචාරාත්මකව මෙහි ඇති සැබෑ අවදානම තේරුම් ගැනීමට නම්, ඔහු සැබවින්ම ගායනා කළේ කුමක්දැයි අප කියවා බැලිය යුතුය. ඉන්පසුව අප ඇසිය යුත්තේ අප එහි සෑම වචනයක් සමඟම එකඟ වන්නේද යන්න නොව, ඒවා ගැයීම හේතුවෙන් තරුණයෙකු රිමාන්ඩ් සිරකුඩුවක සිරකර තැබීම කිසියම් හෝ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට සාධාරණීකරණය කළ හැකිද යන්නයි.

මෙය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ (PTA) තර්කනයට අහඹු ලෙස එකතු වුවක් නොවේ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ සැබෑ තර්කනය එයම වේ. LTTE සංවිධානයට නැවත හමුදාමය වශයෙන් හිස එසවීමට ව්‍යුහාත්මකව කිසිසේත්ම හැකියාවක් නොමැති බවත්, එවැනි තර්ජනයක් ප්‍රායෝගිකව නොපවතින බවත් රජය ඉතා හොඳින් දනී. LTTE සංවිධානයට අයත් ශක්තිමත් ආයතනික ව්‍යුහයක්, හමුදාමය අණදෙන මූලස්ථානයක් හෝ ක්‍රියාකාරී සන්නද්ධ බලකායක් පවතින බවට කිසිදු සාක්ෂියක් නොමැත. මෙම තහනම දිගින් දිගටම පවත්වාගෙන යනු ලබන්නේ LTTE සංවිධානයෙන් තර්ජනයක් පවතින නිසා නොවේ; මෙම තහනම පිටුපස ඇති නීතිමය යාන්ත්‍රණය වෙනත් නිශ්චිත අරමුණක් සඳහා අතිශයින්ම ප්‍රයෝජනවත් වන බැවිනි. එනම්: දේශපාලන අතෘප්තිය සාපරාධී ක්‍රියාවක් බවට පත් කිරීමටත්, ස්මරණය කිරීම සාක්ෂි බවට පරිවර්තනය කිරීමටත්, සිරගත කිරීමේ බිය උපදවමින් දෙමළ ජනතාව ස්ථිර දේශපාලන නිහඬතාවයකට ඇද දැමීමටත් ය.

රාජ්‍යතාන්ත්‍රික අරමුණු වෙනුවෙන් දෙමළ ඩයස්පෝරා කණ්ඩායම් කිහිපයක තහනම ඉවත් කිරීමට වික්‍රමසිංහ ආණ්ඩුව කටයුතු කළ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින්ම, මෙම තහනම් රාමුව තවදුරටත් පවත්වාගෙන යාමට පියවර ගත් අවස්ථාවේදී, එනම් 2022 අගෝස්තු මාසයේදී, සමාජවාදී සමානතා පක්ෂය (SEP) මෙසේ නිරීක්ෂණය කළේය: "දෙමළ සහ මුස්ලිම් කණ්ඩායම් දිගින් දිගටම තහනම් කර තැබීම, රටේ පීඩිත සුළුතරයන්ට එරෙහිව සිංහල ස්වෝත්තමවාදය සහ වෙනස්කොට සැලකීම් අවුලුවාලීම සඳහා එකින් එක බලයට පත් වූ රජයන් විසින් ගනු ලබන අඛණ්ඩ උත්සාහයන් හි කොටසකි. කම්කරුවන්ගේ සහ දුප්පත් ජනතාවගේ දැවැන්ත මහජන විරෝධයට මුහුණ දී සිටින, අර්බුදයෙන් පීඩිත වික්‍රමසිංහ

පාලන තන්ත්‍රය, වාර්ගික ආතතීන් ජීවමානව තබා ගැනීමටත් මර්දනකාරී පියවරයන් තීව්‍ර කිරීමටත් දැඩි ලෙස අධිෂ්ඨාන කරගෙන සිටී." [2]

නිදහසින් පසු යුගයේ බලයට පත් වූ සෑම රජයක් තුළම මෙම රටාව එකසේ දක්නට ලැබේ. එජාප (UNP), ශ්‍රීලනිප (SLFP), පොදුජන එක්සත් පෙරමුණ (PA), එජනිස (UPFA), ශ්‍රීලපොපෙ (SLPP), ජවිපෙ/ජාජබ (JVP/NPP) ලෙස නාමයන් වෙනස් වුවද, ප්‍රතිපත්තිය වෙනස් නොවේ. මෙය අහම්බයක් නොවේ. ලංකාව තුළ වාර්ගිකවාදය (communalism) විසින් සෑමවිටම ඉටුකර ඇති කාර්යභාරය මෙයයි. නිදහසින් පසු 60 වසරක ඉතිහාසය පිළිබඳ තම විශ්ලේෂණයේදී සමාජවාදී සමානතා පක්ෂය සඳහන් කළ පරිදි, "නිදහසින් පසු ගතවූ දශක හයක කාලය සාමාන්‍ය වැඩකරන ජනතාවට උරුම කර දී ඇත්තේ වාර්ගික ගැටුම්, දිනෙන් දින උග්‍ර වන සමාජ පීඩනය සහ වර්ධනය වන ප්‍රජාතන්ත්‍ර-විරෝධී පාලන ක්‍රමවේදයන් පමණි." එම ක්‍රියාවලියේ ප්‍රතිලාභීන් කිසිවිටෙකත් සාමාන්‍ය සිංහල වැඩකරන ජනතාව නොවීය. එහි ප්‍රතිලාභ ලැබුවේ බෙදුණු රටක් පාලනය කිරීම සඳහාත්, තමන්ගේ ජනවාර්ගිකත්වය කුමක් වුවත් සමස්ත වැඩකරන ජනතාවම පීඩාවට පත් කරමින් ප්‍රාග්ධනයට (ධනපති පන්තියට) සේවය කරන ආර්ථික ප්‍රතිපත්ති පටවනු ලැබීම සඳහාත් මෙම ජාතික බෙදීම භාවිත කළ පාලක පන්තියයි.[3]

**පදවැල කියවන්න — ඉන්පසු නිවැරදි ප්‍රශ්නය විමසන්න**

අප ඉහත සඳහන් කළ ගීතයෙන් සංගීත්සන් ගායනා කළ දේ පිළිබඳව අපි අවංක වෙමු. ඔහුගේ පදවැල් අපැහැදිලි සංස්කෘතික නොස්ටැල්ජියාවක් (අතීතකාමයක්) නොවේ. ගීය "අන්නන්" (அண்ணன்), එනම් වැඩිමහල් සහෝදරයා යන වචනය උපයෝගී කරගනියි. ඊළාම් දෙමළ දේශපාලන සංස්කෘතිය තුළ මෙම යෙදුමෙන් සෘජුවම අදහස් කෙරෙන්නේ වේලුපිල්ලේ ප්‍රභාකරන්වය. ජයග්‍රාහී ලෙස පැමිණෙන කොටි ධජයක් ගැන එය කතා කරයි. LTTE සංවිධානයේ මියගිය සාමාජිකයන් වෙනුවෙන් පමණක් වෙන් වූ විශේෂිත ගෞරව නාමය වන "මාවීරන්" (மாவீரன்), එනම් ශ්‍රේෂ්ඨ වීරයා යන යෙදුම එය භාවිතා කරයි. ගීය 'කාර්තිකෙයි' (கார்த்திகை/ නොවැම්බර්) මාසය සිහිපත් කරන අතර, එය LTTE සංවිධානයේ මියගිය අය වෙනුවෙන් පවත්වනු ලබන වාර්ෂික සැමරුම වන "මාවීරර් නාල්" (වීරදින සැමරුම) යෙදෙන මාසයයි. එම වීරයන්ට "නැවත පැමිණ" "දේශය ගොඩනඟන ලෙස" ගීයෙන් ඉල්ලා සිටියි. "සල්ෆර් සුවඳැති ශරීර සුළඟ සමඟ මුසු වූ" රණශූරයන් ගැන පද වැල් කතා කරයි. මෙහිදී යුද පිටියේ වෙඩි බෙහෙත් සුවඳ නිරූපණය කර ඇත්තේ පරිත්‍යාගයේ සුවඳ ලෙසය. මෙය පැහැදිලිවම LTTE සංවිධානයේ මියගිය සටන්කාමීන් සහ ඔවුන්ගේ නායකයා වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීමක් මෙන්ම ඔවුන්ව ඇගයීමට ලක් කිරීමක් ද වන ගීතයකි. එහි පදවැලෙන් කොටසක් [පරිවර්තනය] මෙසේය:

අපගේ ලොකු අයියාගේ කොටි ධජය පැමිණෙමින් තිබේ, ඉඩ සලසා මාවත හෙළි පෙහෙළි කරන්න!

දෙමළ ඊළාම් දේශය මහත් ජයග්‍රාහී උදම් අනමින් නර්තනයේ යෙදෙයි, ඔහුගේ නාමය සෑම දෙසින්ම දෝංකාර දෙයි!

මව්බිම සුරැකීම වෙනුවෙන් මියගිය ශ්‍රේෂ්ඨ වීරවරුනි, කාලය කිසිදා ඔබව අමතක නොකරනු ඇත!

ඔබගේ වීරත්වය ප්‍රදර්ශනය කිරීමට සහ දේශය ගොඩනැඟීම සඳහා, කරුණාකර නැවත එන්න, නැවත එන්න, නැවත වරක් පැමිණෙන්න! [වඩාත්ම ආසන්න සිංහල පරිවර්තනය]

ගීතයෙන් ප්‍රකාශ කර ඇති පරිදි මෙම අදහස්, කිසිදු අත්අඩංගුවට ගැනීමක් සාධාරණීකරණය නොකරයි. ඕනෑම බරපතල දේශපාලන විශ්ලේෂණයක් යථාර්ථයෙන් ආරම්භ විය යුතු බැවින්, අපි මෙහි අන්තර්ගතය වටහා ගනිමු. නමුත් මෙම ගීතය ලිවීම සහ ගායනා කිරීම වෙනුවෙන් කිලිනොච්චියේ පදිංචි 24 හැවිරිදි තරුණයා බන්ධනාගාරගත නොකළ යුතු බව අපි නිසැකවම ප්‍රකාශ කර සිටිමු.

සංගීත්සන්ගේ ගීතය ෆැසිස්ට්වාදී ප්‍රකාශනයක් නොවේ. කම්කරු පන්තිය ෆැසිස්ට්වාදී ප්‍රකාශන වෙනුවෙන් පෙනී නොසිටින අතර, ඔවුන් ඉල්ලා සිටින්නේ ෆැසිස්ට් කණ්ඩායම්වලට සහ ඔවුන්ගේ මූල්‍ය අනුග්‍රාහකයන්ට එරෙහිව නීතිමය පියවර ගන්නා ලෙසයි. මෙම වෙනස අත්තනෝමතික එකක් නොවේ. එය ෆැසිස්ට්වාදයේ ස්වභාවය තුළම මුල් බැස ඇත: වෙනත් ඕනෑම දේශපාලන ප්‍රවණතාවක් කෙතරම් වැරදි වුවද, ඒවායින් වෙනස්ව, ෆැසිස්ට්වාදය උත්සාහ කරන්නේ දේශපාලන තර්ක ජය ගැනීමට නොව, දේශපාලන තර්කනයකට පැවතිය හැකි වටපිටාවම සහමුලින්ම විනාශ කිරීමටයි. සංගීත්සන්ගේ ගීතය යනු සංගීතය ඇසුරින් ප්‍රතිනිර්මාණය කරන ලද, දැඩි ශෝකයට හා පීඩාවට පත් ජනතාවකගේ සැබෑ ප්‍රකාශනයයි. නමුත්, ශ්‍රී ලංකාවේ සමස්ත පශ්චාත් නිදහස් ඉතිහාසය තුළ කිසිදු සුවිශේෂී ව්‍යතිරේකයකින් තොරව, දෙමළ ජනතාවගේ ශෝකය සහ කම්කරු පන්තියේ ප්‍රතිරෝධය නිශ්ශබ්ද කිරීම සඳහා නිර්මාණය කර ඇති මෙම නීතිමය යාන්ත්‍රණය, පාලක පන්තිය විසින් පන්ති අරගලය තීව්‍ර වන අවස්ථාවන්හිදී, හදා වඩා, අරමුදල් සපයා සහ රැකවරණය සපයනු ලබන සිංහල ස්වෝත්තමවාදී සහ වාර්ගිකවාදී කණ්ඩායම්වලට එරෙහිව කිසිවිටෙකත් ක්‍රියාත්මක වූයේ නැත. බොදු බල සේනාවේ මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වයන් හෝ සිහල උරුමයේ වාර්ගික උසිගැන්වීම් ආදී මෙයින් කිසිවකට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ (PTA) දරුණු කඩාපැනීම එල්ල වූයේ නැත. රාජ්‍යය සිය ත්‍රස්ත විරෝධී යාන්ත්‍රණය වාර්ගිකවාදී බලවේග දෙසට යොමු කරන්නේ නැත. එය යොමු කරන්නේ පන්ති අරගලයේ බලවේග දෙසටය. එම අසමතුලිතතාවය එම යාන්ත්‍රණයට ආනුශංගික එකක් නොවේ. එහි සම්පූර්ණ අරමුණම එයයි.

දෙමළ තරුණ පරපුරට සිතට එකඟව උදව් වීමට සහ කුමක් සිදුවෙමින් පවතී

දැයි වටහාගත යුතු සිංහල කම්කරුවන් සමඟ අවංකවම කතා කිරීමට නම්, රාජ්‍ය මර්දනය මඟින් කිසිවෙකු විසින් ඇසීම වලක්වා ඇති වඩාත් දුෂ්කර ප්‍රශ්නය අප ඇසිය යුතුය: **කිලිනොච්චිය, යාපනය සහ මුලතිව් ප්‍රදේශවල දෙමළ තරුණ පරපුර ප්‍රභාකරන්ට අවංකවම ආදරය කරන්නේය සහ LTTE සංවිධානයේ මියගිය අය වෙනුවෙන් අවංකවම ශෝක වන්නේය යන්නෙහි සැබෑ අර්ථය කුමක්ද?**

එයින් අදහස් වන්නේ සැබෑ වූත් වේදනාකාරී වූත් යමක් ය. කලින් සඳහන් කළ පරිදි, මෙම තරුණ තරුණයන් හැදී වැඩුණේ ලේවැකි යුද්ධයක නටබුන් අතර ය. ඔවුන් හැදී වැඩුණේ අඛණ්ඩ හමුදා අත්පත් කරගැනීමකට යටත් වූ ප්‍රදේශයක ය; එහි තවමත් හමුදා භටයන් විසින් දෙමළ ඉඩම් පාලනය කරනු ලබන අතර, නිරන්තර විමර්ශනය සහ නිරීක්ෂණය එදිනෙදා ජීවිතයේ යථාර්ථයක් වී තිබේ. තවද, ඔවුන්ගේ වැඩිහිටියන් අතුරුදහන් කරනු ලැබුණු අතර, සමූහ මිනීවලවල් තවදුරටත් සොයාගනු ලැබෙමින් පවතී. 2022 ආර්ථික කඩාවැටීමට පවා පෙර මුලතිව් දිස්ත්‍රික්කයේ දරිද්‍රතා මට්ටම සියයට 40 දක්වා ළඟා වූ දිස්ත්‍රික්කවල ඔවුහු හැදී වැඩුණහ. මෙම යථාර්ථය හමුවේ, ප්‍රභාකරන් යනු ඔවුන්ට දේශපාලන වැඩපිළිවෙළක් නොවේ. ඔහු ඔවුන්ට යම් දිනෙක යමෙකු කෙළින් නැගී සිට පෙරළා සටන් වැදුනේය යන අදහසේ සංකේතයකි.

එම ශෝකය සැබෑ එකකි. එම කෝපය සාධාරණ ය. අභිමානය (dignity) උදෙසා වන එම අපේක්ෂාව හුදෙක් මානුෂීය ගුණාංගයක් පමණක් නොව, එය දේශපාලනික වශයෙන් ද අත්‍යවශ්‍ය වන්නකි. එමෙන්ම, සංගීත්සන්ගේ ගීතය වැනි නිර්මාණ තුළට දෙමළ තරුණ පරපුර වක්කරන උද්‍යෝගී අපේක්ෂාවේ හැඟීම, තමන්ට විශ්වාසය තැබිය හැකි යමක් සොයා දැඩි ලෙස වෙහෙසෙන පරපුරකට අවශ්‍ය මූලික අමුද්‍රව්‍ය සපයයි.

එබැවින්, අපගේ විප්ලවවාදී ව්‍යාපාරය මතු කරන ප්‍රශ්නය වන්නේ, "අපි මෙම දැඩි උද්‍යෝගය (passion) මර්දනය කරන්නේ කෙසේද?" යන්න නොවේ. අපගේ ප්‍රශ්නය වන්නේ, "මෙම දැඩි උද්‍යෝගය සමාජවාදී දේශපාලනය දෙසට ගලා එනු වෙනුවට දෙමළ ජාතිකවාදය දෙසට ගලා යන්නේ ඇයි?" යන්නයි. එම ප්‍රශ්නයට ලැබෙන පිළිතුර, අපව සෘජුවම නැවත කොළඹ පාලක පන්තිය වෙත සහ සිංහල කම්කරු පන්තියේ සුවිශේෂී වගකීම මෙන්ම, දෙමළ කම්කරුවන් සහ දුප්පත් ජනතාව සමඟ සැබෑ සහෝදරත්වයකින් කටයුතු කිරීමට ඔවුන් සතුවන විභවය වෙත යොමු කරයි. සංගීත්සන්ගේ ගීතය අපරාධයක් ලෙස සලකන මෙම රාජ්‍යය, හුදෙක් දෙමළ තරුණ පරපුර පීඩාවට පත් කරනවා පමණක් නොවේ. ඔවුන්ගේ එම දැඩි උද්‍යෝගය කිසිවිටෙකත් නිවැරදි දේශපාලන ඉලක්කයක් කරා ළඟා නොවන බව තහවුරු කර ගැනීම සඳහා ද මෙම රාජ්‍යය ක්‍රියාකාරීව කටයුතු කරමින් සිටියි.

**රවටනු ලබන්නේ කවුද, සහ ඒ ඇයි ?**

මෙතැනදී අප මෙම ලිපියේ සිංහල පාඨකයන්ට — විශේෂයෙන්ම, සමාජ මාධ්‍ය තුළ සංගීත්සන්ගේ අත්අඩංගුවට ගැනීම ගැන සාකච්ඡා වූ විට, 'ඔහු දෙමළ ඊළාම් ගැන ගීත ගායනා නොකළ යුතුව තිබුණා, ඒක LTTE මතවාදයේ සීමාවන්, LTTE යළි නැගිටවීම හැර ඔහු කුමක් බලාපොරොත්තු වුණාද?' වැනි ස්වාභාවික ප්‍රතිචාරයක් හැඟෙන්නට ඇති තරුණ තරුණියන්ට — සෘජුවම කතා කළ යුතුය.

එම ප්‍රතිචාරය ඔබගේම එකක් නොවේ. එය ඔබ තුළ කාවද්දන ලද එකකි.

දශක ගණනාවක් තිස්සේ, ශ්‍රී ලංකාවේ පාලක පන්තිය සහ ඔවුන්ගේ ආයතනික මාධ්‍ය විසින් සමාජය මිලිටරීකරණය කිරීමේ සහ දේශපාලනික ව හැඩගැස්වීමේ ක්‍රමවත් වැඩපිළිවෙළක් ක්‍රියාවට නංවා ඇත. සිංහල දරුවන් හැදී වැඩුණේ ජාතික ඉතිහාසය පිළිබඳ එක්තරා කතාන්දරයක් සමඟිනි; එහිදී ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් සඳහා වූ දෙමළ ජනතාවගේ අරගලය, එහි ආරම්භයේ සිටම විදේශීය කුමන්ත්‍රණයක් සහ ත්‍රස්තවාදී ව්‍යාපෘතියක් ලෙස නිරූපණය කර තිබුණි. 1956 ක්‍රමානුකූල භාෂාමය වෙනස්කම් කිරීම් වලට මගපෑදීම, 1958, 1977 සහ 1983 දෙමළ විරෝධී කලබල (pogroms), සහ රාජ්‍ය රැකියා මෙන්ම විශ්වවිද්‍යාල ප්‍රවේශයන්ගෙන් දෙමළ ජනතාව චේතනාන්විතව බැහැර කිරීම ආදී, දෙමළ ජාතික ව්‍යාපාරය බිහිවීමට හේතු වූ සාධාරණ දුක්ගැනවිලි, මහජන මතකයෙන් අතුගා දමන ලදී. ඒ වෙනුවට, භීතිය වැපිරීම මත පදනම් වූ ස්ථිර ආරක්ෂක කතිකාවක් ආදේශ කෙරුණි: "අපි තර්ජනයට ලක්ව සිටිමු, අපි අවධානයෙන් සිටිය යුතුයි, දෙමළ අනන්‍යතාවය කෙරෙහි දක්වන ඕනෑම අනුකම්පාවක් ත්‍රස්තවාදයට දක්වන අනුකම්පාවකි" යන්න එම මතයයි. යුද්ධය අත්‍යවශ්‍ය දෙයක් ලෙස සාධාරණීකරණය කර ඇති අතර, ජාතික බෙදීම් අභිබවා එකමුතු වන කම්කරු පන්තියේ ඕනෑම අරගලයකට එරෙහිව යෙදවීමට සූදානම් කර ඇති හමුදාව, "රණවිරුවන්" ලෙස උත්කර්ෂයට නංවා ඇත.

**මෙම වාර්ගික වාදී ව්‍යාපෘතිය කිසිවිටෙකත් සිංහල සංස්කෘතියේ හෝ බුද්ධාගමේ ස්වාභාවික වර්ධනයක් නොවීය.** එය, කොන්සර්වේටිව් (ගතානුගතික) එක්සත් ජාතික පක්ෂය අභිබවා යාම සඳහා වූ මැතිවරණ උපායමාර්ගයක් ලෙස 1956 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විසින් දියත් කරන ලද චේතනාන්විත දේශපාලන නිර්මාණයකි. ඉන්පසුව, පාලක පන්තියේ සෑම කල්ලියක් විසින්ම එය දිගින් දිගටම පවත්වාගෙන යනු ලැබුවේ, එයින් ඔවුන්ගේ වැදගත් පන්තිමය අවශ්‍යතාවයක් ඉටු වූ බැවිනි: එනම්, සිංහල සහ දෙමළ කම්කරු පන්තියට තම පොදු අවශ්‍යතා හඳුනා ගැනීමට සහ තමන් දෙපිරිසම සූරාකෑමට ලක් කරන පද්ධතියට එරෙහිව එක්සත් වීමට තිබූ ඉඩකඩ එමගින් වළක්වාලීමයි.

එහි ප්‍රතිඵලය අද ටික්ටොක් (TikTok), ෆේස්බුක් (Facebook) සහ එක්ස් (X) සමාජ මාධ්‍ය ඔස්සේ දැකගත හැකිය. දෙමළ කලාකරුවෙකු, මාධ්‍යවේදියෙකු

හෝ සාමාන්‍ය පුරවැසියෙකු තම ඉතිහාසයට අදාළ වචන, එනම් “දෙමළ ඊළාම්”, “නිජබිම”, “ජනසංහාරය”, “වගවීම”, “යුද අපරාධ”, “සමරුව” ආදිය භාවිත කරන සෑම අවස්ථාවකදීම, සිංහල සමාජ මාධ්‍ය අවකාශයේ ඇතැම් කොටස්වලින් ඊට එරෙහිව දැඩි විරෝධයක් සහ දෝෂාරෝපණයක් එල්ල වෙයි. මෙම සමාජ මාධ්‍ය හැසිරෙන්නන් තමන් රාජ්‍යයේ මෙවලම් ලෙස සලකන්නේ නැත. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ද උතුරේ සහ නැගෙනහිර දෙමළ කම්කරුවන් මුහුණ දෙන ආකාරයේම ආර්ථික විනාශයකින්, එනම් රැකියා විරහිතභාවය, උද්ධමනය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) දැඩි කප්පාදු පියවර සහ කඩාවැටෙන පොදු සේවාවන්ගෙන් බැටකන්නෝ වෙති. එහෙත්, ඔවුන්ගේ අවධානය වෙනතකට යොමු කිරීමට පාලකයින් සමත්ව ඇත. ඔවුන්ට පෙන්වා දී ඇති සතුරා වන්නේ තමන්ව පාලනය කරන පන්තිය නොව, වෙනත් භාෂාවක් කතා කරන සහ වෙනත් වේදනාවක් දරා සිටින තම අසල්වැසියා බවයි.

පාලක පන්තිය දශක හතක් තිස්සේ පවත්වාගෙන ආ, එමෙන්ම සිංහල කම්කරුවන් සහ තරුණයින් අනිවාර්යයෙන්ම තේරුම් ගත යුතු අපෝහකය මෙයයි : **එනම්, සිංහල ස්වෝත්තමවාදය විසින් දෙමළ ජාතිකවාදය බිහි කරන අතර, දෙමළ ජාතිකවාදය විසින් නැවතත් සිංහල ස්වෝත්තමවාදය ශක්තිමත් කරනු ලබයි. මෙම ප්‍රවණතා ද්විත්වයම එකක් අනෙකාගේ කැඩපත් ප්‍රතිබිම්බය මෙන්ම අනෙකා පෝෂණය කරන ඉන්ධනය ද වෙයි.** 1956 දී කොළඹ පාලනය විසින් දෙමළ භාෂා අයිතිවාසිකම්වලට එරෙහිව වෙනස්කම් සිදුකළ විට, එය දෙමළ දේශපාලන බලමුලු ගැන්වීමක් සඳහා අවශ්‍ය පසුබිම නිර්මාණය කළේය. එම බලමුලු ගැන්වීමට සාධාරණ විසඳුම් වෙනුවට වාර්ගික කලබලවලින් පිළිතුරු ලැබුණු විට, එය දෙමළ සන්නද්ධ බෙදුම්වාදයක් සඳහා මාවත සකස් කළේය. දෙමළ බෙදුම්වාදය විසින් සිංහල සිවිල් වැසියන්ට එරෙහිව ප්‍රහාර දියත් කළ විට, සිංහල පාලක පන්තිය එය භාවිත කළේ දෙමළ ජනතාවට එරෙහිව තවත් රාජ්‍ය භීෂණයක් සාධාරණීකරණය කිරීමට සහ මෙම ප්‍රයෝගය හඳුනාගත හැකිව තිබූ සිංහල කම්කරුවන් බිය ගැන්වීමටය. දැන් රාජ්‍යය විසින් ප්‍රභාකරන් හෝ දෙමළ ඊළාම් ගැන ගායනා කිරීම හේතුවෙන් 24 හැවිරිදි තරුණයෙකු අත්අඩංගුවට ගන්නා විට, එමඟින් තවත් දෙමළ තරුණ පරම්පරාවකට – ඔවුන් වැරදි වුවද, අපට ඔවුන්ව තේරුම්ගත හැකි පරිදිම – දෙමළ ජාතිකවාදය හැර වෙනත් ඉදිරි මාවතක් නොමැති බව තීරණය කිරීමට අවශ්‍ය පසුබිම සලසා දෙයි.

LTTE සංවිධානයේ දේශපාලන වැඩපිළිවෙළ වූයේ තම පාලනයක් පිහිටුවා ගැනීම අපේක්ෂා කළ දෙමළ ධනේශ්වර පන්තියේ වැඩපිළිවෙළක් මිස, දෙමළ කම්කරු පන්තියේ වැඩපිළිවෙළක් නොවේ. LTTEයේ පරාජය පිළිබඳ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (ICFI) විශ්ලේෂණය පැහැදිලි කරන පරිදි, සිංහල කම්කරුවන් වෙත දේශපාලනික ආමන්ත්‍රණයක් කිරීමට LTTEය සම්පූර්ණයෙන්ම අසමත් විය. **ඊට නිශ්චිතම හේතුව වූයේ ඔවුන්ගේ ඉදිරි දර්ශනය පන්ති අරගලයක් මත නොව වාර්ගික අරගලයක් මත පදනම් වීමයි.** එමෙන්ම, කොළඹ ආණ්ඩුවේ අපරාධ වෙනුවෙන් සමස්ත සිංහල ජනතාවටම දෝෂාරෝපණය කිරීම මඟින්, සියල්ල වෙනස් කළ හැකිව තිබූ කම්කරු පන්ති එකමුතුව ඇතිවීමේ ඉඩකඩ ඔවුන් විසින් සදහටම අහිමි කරනු ලැබීය. [4] සාමාන්‍ය සිංහල සිවිල් වැසියන්ට එරෙහිව LTTE සංවිධානය එල්ල කළ ප්‍රචණ්ඩකාරී ප්‍රහාරවලින් ද ඉටු වූයේ ආණ්ඩුවේ සිංහල ආධිපත්‍යවාදයෙන් (supremacism) ඉටු වූ එම ප්‍රතිගාමී අරමුණම ය: එනම්, කම්කරු පන්තිය වාර්ගික, ආගමික සහ භාෂාමය පදනමින් බෙදා වෙන් කිරීම සහ එමඟින් කොළඹ සිටින සිංහල ස්වෝත්තමවාදී බලවේගයන්ගේ අත ශක්තිමත් කිරීමයි. 2009 දී LTTEය ලැබූ මිලිටරි පරාජයෙන් කිසිදු ප්‍රශ්නයක් විසඳුණේ නැත. එමඟින් දෙමළ මහජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් තවදුරටත් අහිමි කර, ඔවුන්ගේ ඉඩම් තවදුරටත් හමුදා ග්‍රහණයට නතු කර, ඔවුන්ගේ තරුණයින් තවදුරටත් දේශපාලන මඟපෙන්වීමක් සොයන තත්ත්වයකට ඇද දමනු ලැබීය.

සංගීත්සන්ගේ ගීත වැනි නිර්මාණ ආමන්ත්‍රණය කරන්නේ අන්න එම දේශපාලන රික්තකයටයි. **ඒවා අපරාධ ලෙස සලකා මර්දනය නොකළ යුතුය. ඒ වෙනුවට ඒවාට පිළිතුරු දිය යුත්තේ, ප්‍රභාකරන්ට කිසිදා ලබා දිය නොහැකි වූ දෙයක් දෙමළ කම්කරුවන්ට ලබා දෙන සමාජවාදී වැඩපිළිවෙළක් මඟිනි:** එනම්, තමන් සියලු දෙනාම පීඩාවට පත් කරන ධනේශ්වර රාජ්‍යයට එරෙහි පොදු සටනේදී, සිංහල සහ මුස්ලිම් කම්කරු පන්තිය සමඟ ඇති වන සැබෑ එකමුතුවයි.

**සංගීත්සන්ව සිරගත කරන රාජ්‍යය ඊළඟට පැමිණෙන්නේ ඔබ සොයා ය**

සංගීත්සන්ගේ අත්අඩංගුවට ගැනීම තමන්ගේ ප්‍රශ්නයක් නොව දෙමළ ජනතාවගේ ප්‍රශ්නයක් ලෙස දැකීමට පෙළඹිය හැකි සිංහල කම්කරුවන් සහ තරුණයින් විසින් වඩාත්ම පැහැදිලිව වටහා ගත යුතු කරුණ වන්නේ මෙයයි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත 1979 දී පනවන ලද්දේ දෙමළ සන්නද්ධ සංවිධාන මර්දනය කිරීම සඳහාය. නමුත්, එය කිසිවිටෙකත් දෙමළ ජනතාවට පමණක් සීමා වූවක් නොවීය. 1988-1990 කාලසීමාවේ පැවති ජනතා විමුක්ති පෙරමුණේ නැඟිටීම් ලේවැකි අයුරින් මර්දනය කිරීමට ද එය භාවිත කෙරුණු අතර, එමඟින් පීඩිත සිංහල ග්‍රාමීය තරුණයින් දසදහස් ගණනක් ඝාතනය කෙරුණි. එය සිංහල මාධ්‍යවේදීන්ට, වෘත්තීය සමිති ක්‍රියාකාරීන්ට සහ දේශපාලන ප්‍රතිවාදීන්ට එරෙහිව ද භාවිත කර ඇත. එමෙන්ම, මෙම පනත අහෝසි කරන බවට පොරොන්දු වෙමින් බලයට පත් වූ ජනතා විමුක්ති පෙරමුණ/ජාතික ජන බලවේගය (JVP/NPP) රජය යටතේ ද, මුස්ලිම් සහ දෙමළ තරුණයින්ට එරෙහිව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ක්‍රියාවට නංවා ඇති

අතර, විරෝධතාවල නිරත වූ විදුලිබල මණ්ඩල සේවකයින්ට සහ වර්ජනයේ නිරත වූ තැපැල් සේවකයින්ට එරෙහිව අත්‍යවශ්‍ය මහජන සේවා පනත ද භාවිත කර ඇත.

සෑම අවස්ථාවකදීම මෙහි පවතින තර්කනය එක හා සමානය: දෙමළ සංස්කෘතික ප්‍රකාශනයන් "ත්‍රස්තවාදය" ලෙස අර්ථ දක්වන එම රාජ්‍ය යාන්ත්‍රණයම, එයට අවශ්‍ය සුදුසු ඕනෑම අවස්ථාවක ඔබේ වැඩවර්ජනය, ඔබේ විරෝධතාවය හෝ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) විවේචනය කරමින් ඔබ සමාජ මාධ්‍ය වෙත එකතු කරන සටහන ද "ත්‍රස්තවාදය" ලෙස අර්ථ දක්වනු ඇත. නව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PSTA) තුළට ඇතුළත් කරමින් පවතින නම්‍යශීලී අර්ථ දැක්වීම්, එනම් "මහජනතාව බිය ගැන්වීම" හෝ "යම් ක්‍රියාවකින් වැළකී සිටීමට රජයට බල කිරීම" වැනි ක්‍රියාවන්, දැනට නොපවතින LTTE සංවිධානයක් හෝ වෙනත් එවැනි කණ්ඩායමක් ඉලක්ක කරගත් ඒවා නොවේ. ඒවා සමස්ත කම්කරු පන්තියම ඉලක්ක කරගත් ඒවාය. සිංහල, දෙමළ, මුස්ලිම් ඒ සියලු දෙනාම ඊට ඇතුළත්ය.

LTTE සංවිධානයේ නැවත නැඟිටීමක් වැළැක්වීමේ නාමයෙන් 2009 වසරේ සිට උතුරු සහ නැගෙනහිර පළාත්වල පවත්වාගෙන යනු ලබන ඔත්තු බැලීමේ (surveillance) සහ මිලිටරි වාඩිලෑමේ යටිතල ව්‍යුහය, ඕනෑම අවංක නිරීක්ෂකයෙකුට පැහැදිලිව හඳුනාගත හැකි තවත් දෙවන කාර්යයක් ඉටු කරයි: එනම්, සමාජ සහ ආර්ථික අර්බුදය තීව්‍ර වන විට, පාලක පන්තිය විසින් දිවයිනේ දකුණු ප්‍රදේශයට ද ව්‍යාප්ත කිරීමට අදහස් කරන රාජ්‍ය පාලන ක්‍රමවේදයේ සජීවී ආකෘතියක් සහ අච්චුවක් ලෙස එය ක්‍රියා කිරීමයි. යුද්ධය අවසන් වී වසර දහහතක් ගත වූ පසුවත් සමස්ත ජනගහනයක්ම මිලිටරි නිරීක්ෂණයට ලක් කර තබා ගන්නා වූ ද, තම ගීත පද මාලාව හේතුවෙන් 24 හැවිරිදි සංගීතඥයෙකු සිරගත කරන්නා වූ ද රාජ්‍යය, ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පිළිබඳ ඕනෑම ආකාරයක මවාපෑමක් බොහෝ කලකට පෙරම අත්හැර දමා ඇති රාජ්‍යයකි.

**ඉදිරි මාවත: ධනපති රාජ්‍යයට එරෙහිව කම්කරු පන්තියේ එකමුතුව**

සංගීත්සන්ව වහාම සහ කොන්දේසි විරහිතව නිදහස් කළ යුතුය. ඔහුට එරෙහිව ඇති චෝදනා ඉල්ලා අස්කර ගත යුතුය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කළ යුතු අතර, නව ලේබලයක් සහිත එම ආයුධයම වන එහි අනුප්‍රාප්තික පනත් කෙටුම්පත වන රාජ්‍යය ත්‍රස්තවාදයෙන් ආරක්ෂා කිරීමේ පනත (PSTA) සම්මත නොකළ යුතුය. උතුරු සහ නැගෙනහිර පළාත්වල පවතින හමුදා වාඩිලෑම අවසන් කළ යුතුය. මෙම නීති යටතේ රඳවාගෙන සිටින සියලුම දේශපාලන සිරකරුවන් නිදහස් කළ යුතුය.

මේවා දමිළ ජනතාවගේ ඉල්ලීම් පමණක් නොවේ. මේවා සමස්ත කම්කරු පන්තියේම ඉල්ලීම් වේ. මන්ද, කම්කරු පන්තියේ ඕනෑම කොටසක ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් යනු සමස්ත කම්කරු පන්තියේම ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් වන බැවිනි.

ශ්‍රී ලංකාවේ හා දකුනු ආසියාවේ සමාජවාදී නායකත්වය (SLLA) නමින් සමාජවාදී සමානතා පක්ෂයේ (SEP) විප්ලවවාදී ප්‍රවණතාවක් නියෝජනය කරන අපි, පක්ෂය විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය (RCL) ලෙස ආරම්භ කළ දින සිට, වසර 26ක සමස්ත සිවිල් යුද්ධය පුරාම සහ ඉන් පසුවද කිසිදු අපගමනයකින් තොරව මෙම ස්ථාවරය පවත්වාගෙන ගොස් ඇත්තෙමු. ජනතා විමුක්ති පෙරමුණ වර්ගවාදී යුද්ධයට සහයෝගය දක්වන විට අපි ඊට විරුද්ධ වුණෙමු. වෘත්තීය සමිති නිලධාරිවාදය නිශ්ශබ්දව සිටියදී අපි දමිළ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටියෙමු. වෙනත් කිසිදු දේශපාලන පක්ෂයක් ඉදිරිපත් නොවූ මොහොතක, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නඩු විභාගයකින් තොරව රඳවාගෙන සිටි දමිළ රැඳවියන් නිදහස් කිරීම සඳහා අපි උද්ඝෝෂණය කළෙමු. අප සැමවිටම එසේ කළේ පැහැදිලි පන්ති විශ්ලේෂණයක් පදනම් කරගෙන ය: එසේ කළේ දමිළ කම්කරුවන්ගේ සහ ගොවීන්ගේ නොව, දමිළ ධනේශ්වරයේ එක් කොටසකගේ අවශ්‍යතා නියෝජනය කළ ද්‍රවිඩ ඊළාම් විමුක්ති කොටි (LTTE) සංවිධානයේ බෙදුම්වාදයට අප දේශපාලන සහයෝගය දුන් නිසා නොව [අප ඊට විරුද්ධව සටන් කළෙමු], ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂා කිරීම කම්කරු පන්තියේ එක්සත්කමෙන් වෙන් කළ නොහැකි බැවිනි; එමෙන්ම, දමිළ කම්කරුවන්ට සහ ගොවීන්ට තමන්ගේම අවශ්‍යතා ආරක්ෂා කර ගත හැක්කේ ධනවාදයට එරෙහි පොදු අරගලයකදී සිංහල වැඩකරන ජනතාව සමඟ එක්සත් වීමෙන් පමණක් වන බැවිනි.

**මෙම ගීතවලට ඇලුම් කරන, නොවැම්බර් මාසයේදී ඉටිපන්දම් දල්වා මහා වීරවරුන් වෙනුවෙන් ශෝක වන දමිළ තරුණ තරුණියනි:** ඔබේ වේදනාව වැරදි තැනක පිහිටුවා නැති අතර ආත්ම අභිමානය උදෙසා ඔබ තුළ ඇති උද්යෝගය දේශපාලන සම්පතක් මිස මානසික ව්‍යාධියක් නොවේ. **එහෙත් ප්‍රභාකරන්ගේ වැඩපිළිවෙළ අසාර්ථක විය. ඒ ජාත්‍යන්තර ප්‍රජාව ඔහුව පාවා දුන් නිසා හෝ හමුදා තුවක්කුව හමුවේ ඔහු පරාජය වූ නිසා නොව, වෙනම දමිළ ධනපති රාජ්‍යයකට කළ හැක්කේ නව ධජයක වර්ණ යටතේ දමිළ කම්කරුවන් දැනටමත් විඳදරාගන්නා දරිද්‍රතාවය සහ සූරාකෑම නැවත ප්‍රතිනිෂ්පාදනය කිරීම පමණක් වන බැවිනි.** වෙනස්කොට සැලකීමට සහ ජාතිවාදී මර්දනයට පිළිතුර සොයාගත හැක්කේ වෙනම රාජ්‍යයකින් නොව, සමාජවාදී විප්ලවය සඳහා වූ පොදු අරගලයක් තුළ පීඩිතයන් ඒකාබද්ධ කිරීමෙනි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මඟින් දමිළ ජනතාවගේ අභිලාෂයන් ඝාතනය කරන රාජ්‍යයම යනු ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) සමාජ කප්පාදු කිරීම් මඟින් සිංහල කම්කරුවන්ගේ ජීවන තත්ත්වයන් විනාශ කරන රාජ්‍යයම වේ. ඔබේ සතුරා කොළඹ කර්මාන්තශාලාවක වැඩ කරන සිංහල කම්කරුවා නොවේ. ඔබේ සතුරා වන්නේ ඒ දෙපාර්ශවයම පාලනය කරන පන්තියයි. ඔබේ අයිතිවාසිකම් වෙනුවෙන් සැබවින්ම සටන් කළ විප්ලවවාදී සම්ප්‍රදාය, එනම් ජනතා

විමුක්ති පෙරමුණ (JVP) යුද්ධයට ප්‍රීති ඝෝෂා කරන විට ඊට විරුද්ධ වූ, වෙනත් කිසිදු පක්ෂයක් ඉදිරිපත් නොවූ මොහොතක දමිළ දේශපාලන සිරකරුවන් වෙනුවෙන් උද්ඝෝෂණය කළ, උතුරු සහ නැගෙනහිර පළාත්වලින් හමුදාව ඉවත් කරගන්නා ලෙස ඉල්ලා සිටි සම්ප්‍රදාය වන්නේ සමාජවාදී සමානතා පක්ෂයේ ට්‍රොට්ස්කිවාදී සම්ප්‍රදායයි. ඔබේ උද්‍යෝගය සහ සටන හිමිවිය යුතු සැබෑ සම්ප්‍රදාය එයයි.

සංගීත්සන්ගේ අත්අඩංගුවට ගැනීම හුදකලා සිදුවීමක් නොවේ. එය නිදහසින් පසු ශ්‍රී ලාංකේය ධනවාදය නිර්වචනය කළ මුලෝපායේ නවතම ප්‍රකාශනයයි: එනම්, පීඩිතයන් වාර්ගික පදනම මත බෙදා වෙන් කිරීම, පීඩිතයන්ගේ මතකයන් සාපරාධීකරණය කිරීම සහ ප්‍රාග්ධනයේ ආධිපත්‍යයට තර්ජනයක් වන ඕනෑම ව්‍යාපාරයක් මර්දනය කිරීම සඳහා ත්‍රස්තවාදය වැළැක්වීමේ නීති යාන්ත්‍රණය භාවිතා කිරීමයි. සෑම ආණ්ඩුවක්ම මෙම ක්‍රීඩාව කර ඇත. ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ පිළිබඳ පොරොන්දු දෙමින් 2022 අරගලයේ නැගිටීමේ රැල්ල මත බලයට පැමිණි ජනතා JVP/NPP ආණ්ඩුවද දැන් කරමින් සිටින්නේ එයම ය.

මෙම උපායමාර්ගයට පිළිතුර, ලක්ෂ සංඛ්‍යාත ජීවිත ප්‍රමාණයක් අහිමි කළ ආවෘත අන්තයක් බවට ඔප්පු වී ඇති දමිළ බෙදුම්වාදය නොවේ. එමෙන්ම, රාජ්‍ය භීෂණයේ සෑම ක්‍රියාවකටම මතවාදී ආවරණයක් ලෙස සේවය කර ඇති සිංහල බෞද්ධ ස්වෝත්තමවාදය ද නොවේ.[5] මෙයට පිළිතුර වන්නේ, ධනපති පන්තියේ සියලුම කල්ලීන්ගෙන් සහ එහි සියලුම පක්ෂවලින් ස්වාධීනව සංවිධානය වූ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) කප්පාදුවලට එරෙහිව, මිලිටරිවාදයට එරෙහිව සහ සමස්ත වාර්ගිකවාදී රාජ්‍ය මර්දන යාන්ත්‍රණයට එරෙහිව, සියලු කම්කරු ජනතාවගේ අවශ්‍යතා සපුරාලන සමාජවාදී ජාත්‍යන්තරවාදයේ පොදු වැඩපිළිවෙළක් වෙනුවෙන් සටන් වදින සිංහල, දමිළ සහ මුස්ලිම් කම්කරුවන්ගේ දේශපාලන එක්සත්කමයි. මෙම එක්සත්කම සඳහා, පාලක පන්තිය අප සැම මත පටවා ඇති වාර්ගික බෙදීම්වලට කොටු වීම කොන්දේසි විරහිතව සහ සෘජුවම ප්‍රතික්ෂේප කිරීම අවශ්‍ය වේ.

සංගීත්සන්ව වහාම නිදහස් කරනු! ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) අහෝසි කරනු—ඊට ආදේශක පනත් එපා! කම්කරු පන්තියේ එක්සත් සමාජවාදී ව්‍යාපාරය ගොඩනගනු!

[1] SEP opposes Sri Lankan government's ban on LTTE, The Socialist Equality Party (Sri Lanka), 24 January 2009 <https://www.wsws.org/en/articles/2009/01/sril-j24.html>

[2] Sri Lankan government continues proscription of Tamil and Muslim groups and individuals, Saman Gunadasa 17 August 2022 <https://www.wsws.org/en/articles/2022/08/17/wfcd-a17.html>


[3] Sri Lankan independence: 60 years of communalism, social decay and war, The Socialist Equality Party (Sri Lanka) 4 February 2008 <https://www.wsws.org/en/articles/2008/02/sril-f04.html>


[4] Sri Lanka: the defeat of the LTTE and the dead-end of nationalism, Bill Van Auken, 21 May 2009 <https://www.wsws.org/en/articles/2009/05/pers-m21.html>


[5] දමිළ බෙදුම්වාදය, එහි වැඩපිළිවෙළ කෙතරම් වැරදි සහගත වුවද, මතු වූයේ ක්‍රමානුකූල ජාතික මර්දනයට ප්‍රතිචාරයක් වශයෙනි. සිංහල බෞද්ධ ස්වෝත්තමවාදය (chauvinism) යනු පීඩක ජාතියේ පාලක පන්තියේ මතවාදයයි—එය තම මූලික පදනමෙන්ම ආධිපත්‍යවාදී (supremacist) වන අතර, රාජ්‍ය විසින් වෙනස්කොට සැලකීම්, වාර්ගික සංහාර (pogroms) සහ මිලිටරිමය භීෂණය සාධාරණීකරණය කිරීමක් ලෙස අනෙකුත් සියලුම ප්‍රජාවන්ට වඩා සිංහල බෞද්ධ අනන්‍යතාවයේ ප්‍රමුඛතාවය තහවුරු කරයි. 'Chauvinism' (ස්වෝත්තමවාදය) යනු පාලක පන්තියේ සේවය සඳහා යොදවනු ලබන ආක්‍රමණශීලී, ආධිපත්‍යවාදී ජාතිකවාදය හැඳින්වීම පිණිස මාක්ස්වාදී වාග් මාලාවේ භාවිත වන පාරිභාෂික වචනයකි; එය නම් කර ඇත්තේ අන්ධ, ආක්‍රමණශීලී ජාතික ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ සංකේතය වූ නිකොලස් ශෝවින් (Nicolas Chauvin) ඇසුරෙනි. සිංහල බෞද්ධ පන්ති ආධිපත්‍යයට (Sinhala Buddhist class hegemony) අදාලව, "ජාතිකවාදය" (nationalism) යන වචනයෙන් ප්‍රකාශ නොවන නිවැරදි දේශපාලන බර මෙම වචනය තුළ ගැබ් කර ගනී.

---




**මෙම පොත් Mehring Books වෙතින් ඇනවුම් කරන්න.**

Mehring Books

# මීගමුව බන්ධනාගාර සමූලඝාතනය: පන්ති ප්‍රචණ්ඩත්වය සහ ශ්‍රී ලංකා ධනේශ්වර රාජ්‍යය

**ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වය (SLLA)** විසිනි.

මෙම ලිපිය ඉංග්‍රීසි බසින් *‘The Negombo Prison Massacre: Class Violence and the Capitalist State in Sri Lanka’* යන සිරසින් *2026* ජූලි *11* දින *theSocialist.lk* වෙබ් අඩවියේ පළ කෙරිණි.




2026 ජූලි 7 වැනිදා සිදු වූ මීගමුව බන්ධනාගාර කැරැල්ල අතරතුර ගේට්ටුවේ ඇති සිදුරක් තුළින් රැඳවියන්ට වගවිභාගයකින් තොරව වෙඩි තබන බන්ධනාගාර ආරක්ෂකයෙක්. ඡායාරූපය සමාජ මාධ්‍යවලින්.

අවම වශයෙන් 28 දෙනෙකුට ජීවිත අහිමි කරමින් සහ 100කට ආසන්න පිරිසකට තුවාල සිදු කරමින් ජූලි 5-6 දිනවල මීගමුව රිමාන්ඩ් බන්ධනාගාරයේ සිදු වූ සංහාරය අසාමාන්‍යයක් නොවේ. එය ශ්‍රී ලාංකීය සමාජයේ වඩාත්ම පීඩිත සහ කොන් කරනු ලැබූ ස්ථරයන්ට එරෙහිව පන්ති යුද්ධයේ මෙවලමක් ලෙස එහි ආකෘතියෙන්ම ක්‍රියාත්මක වන දණ්ඩන (penal) පද්ධතියක නවතම සහ මාරාන්තික ප්‍රකාශනයයි. මෙම සංහාරය මගින්, හුදෙක් රුධිරයෙන් පමණක් දැකගත හැකි පැහැදිලි බවකින් යුතුව, ධනපති රාජ්‍යයේ සැබෑ ස්වරූපය නිරාවරණය කරයි. එනම්, දිළිඳුකම සාමාන්‍ය තත්ත්වයක් ලෙස නිපදවන දේපළ සබඳතා ආරක්ෂා කර ගැනීම සඳහා දිළිඳු ජනතාවට එරෙහිව යොදවා ඇති සන්නද්ධ මිනිසුන්ගෙන් සමන්විත ආයතනයක් ලෙස එය ක්‍රියාත්මක වීමයි.

මීගමුව මහා රෝහලෙන් සහ මූලික අධිකරණ පරීක්ෂණවලින් දැනට මතුවෙමින් පවතින පශ්චාත් මරණ පරීක්ෂණ සාක්ෂි මඟින් පැහැදිලි වන්නේ, “පාතාල මත්ද්‍රව්‍ය කල්ලි අතර ගැටුමක්” යැයි රජය විසින් කලබලයෙන් ගොතා ඉදිරිපත් කළ ප්‍රකාශය මඟින් වසාගැනීමට උත්සාහ කළේ කුමක්ද යන්නයි. මියගිය රැඳවියන් 20 දෙනාගෙන් අතිබහුතරයක් (රැඳවියන් 14 දෙනෙකු) මියගොස් ඇත්තේ හිස, පපුව සහ උඩුකය ප්‍රදේශවලට අධිවේගී ගිනිඅවිවලින් එල්ල වූ වෙඩි වැදීම් හේතුවෙනි. මියගිය බන්ධනාගාර ආරක්ෂකයින් සහ නිලධාරීන් හත්දෙනා (ජූලි 8 වනදා සැරයන්වරයෙකු තුවාල ලබා මියයෑමත් සමඟ මෙම සංඛ්‍යාව අට දක්වා ඉහළ ගියේය) ඝාතනයට ලක්ව ඇත්තේ මොට ආයුධ, කැඩීගිය ගඩොල් කැබලි සහ යකඩ පොලු වලිනි. ඒවා, සියල්ල අහිමි වූවන් විසින් සිය උග්‍ර ක්‍රෝධය පුපුරා යාම තුළ භාවිත කළ ආයුධයි. මෙය එකම පන්ති පද්ධතියක් (class system) විසින් නිර්මාණය කරන ලද, එකිනෙකට වෙනස් වූ මරණයේ ස්වරූප දෙකකි.

තත්ත්වය සමනය කිරීම රජයේ අරමුණ නොවූ බව ඔවුන්ගේ උපායමාර්ගික තේරීම් මඟින් තහවුරු වේ. ශබ්දවාහිනී යන්ත්‍ර මඟින් කිසිදු අනතුරු ඇඟවීමක් සිදු නොකෙරුනි. කඳුළු ගෑස්, ජල ප්‍රහාර හෝ රබර් උණ්ඩ කිසිවක් භාවිත නොකළේය. සාකච්ඡා මාර්ගයෙන් හෝ එකඟතාවයකින් ගැටලුව විසඳීමට ද කිසිදු උත්සාහයක් නොගැනිණි. ඒ වෙනුවට, පොලිසිය, යුද හමුදාව සහ 2012 වැලිකඩ බන්ධනාගාර සමූලඝාතනයට වගකිවයුතු, අපකීර්තියට පත් පැරමිලිටරිය වන විශේෂ කාර්ය බලකාය (STF), තාප්ප වලින් වට වූ පරිශ්‍රයක් තුළ සිරවී සිටි සිරකරුවන් දෙසට ඉලක්කයකින් තොරව වෙඩි තැබූහ. බන්ධනාගාරය අවට ප්‍රදේශය යුද කලාපයක් බඳු ස්වරූපයක් ගත් අතර, වෙඩි තැබීම් හඬ පරිශ්‍රය පුරා පැතිර යද්දී, පිටතට

රැස්ව හඬා වැලපෙමින් තොරතුරු ඉල්ලා කෑගැසූ සිරකරුවන්ගේ ඥාතීන් වන බහුතරයක් දුප්පත් ගම්වැසියන් වූ මව්වරුන්, බිරින්දෑවරුන් සහ දරුවන් ආදී සිය ගණනක් බියවැද්දීම සඳහා සන්නද්ධ ආරක්ෂක අංශ, සන්නද්ධ රථ, මිලිටරි ජීප් රථ සහ ඩ්‍රෝන යානා යොදවා තිබුණි.

මිනී මැරීම් ජූලි 6 වනදායින් අවසන් වූයේ නැත. මීගමුව බන්ධනාගාරයේ සිට වෙනත් බන්ධනාගාර වෙත මාරු කර යැවීමෙන් පසු, රැඳවියන් අවම වශයෙන් දෙදෙනෙකුවත් මියගොස් ඇති බව ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් (Amnesty International) සංවිධානය ජූලි 9 වනදා තහවුරු කළේය. එය සිදුවූයේ , ආරක්ෂකයින් විසින් පළිගැනීමේ චේතනාවෙන් සිදු කරන ලද වධහිංසා පැමිණවීම් සහ පහරදීම් පිළිබඳ බරපතල චෝදනා මධ්‍යයේය. නොසන්සුන්තාවයට නායකත්වය දුන් බවට චෝදනා එල්ල වූ රැඳවියන් පස්දෙනෙකු රහසිගතව හුදෙකලා කර රඳවා තබා ඇති අතර, එමඟින් "ඔවුන්ගේ ජීවිතවලට බරපතල තර්ජනයක්" මතුව ඇති බව සිරකරුවන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ කමිටුව අනතුරු ඇඟවීය. මෙම සමූලඝාතනය, සංවිධානාත්මක පළිගැනීම්වල ස්වරූපයෙන් තවදුරටත් ඉදිරියට ඇදෙමින් පවතී.

**අසත්‍ය ප්‍රචාරක යන්ත්‍රණය**

මෙම ලේ වැගිරීම සම්බන්ධයෙන් රජය ඉදිරිපත් කරන පැහැදිලි කිරීම මුල සිට අග දක්වාම අසත්‍යයක් වන අතර, එයට මැනවින් ලේඛනගත වූ ඓතිහාසික වාර්තාවක් ඇත. බන්ධනාගාර තුළ ක්‍රියාත්මක වන මත්ද්‍රව්‍ය ජාවාරම් ජාලයක් සම්බන්ධයෙන් ඇති වූ ආරවුලක් හේතුවෙන් මෙම ප්‍රචණ්ඩත්වය හටගත් බව අධිකරණ අමාත්‍ය හර්ෂණ නානායක්කාර කියා සිටියේය. මෙම විග්‍රහයට අනුව, සිරකරුවන් යනු "පාතාල අපරාධකරුවන්" සහ "කුඩුකාරයින්" වේ. මෙය රාජ්‍ය ඝාතන පිළිගැනීමට මහජන මතය සූදානම් කිරීම සඳහා භාවිත කරන, මනුෂ්‍යත්වය හෑල්ලුවට ලක් කරන වාග් මාලාවකි. ප්‍රධාන දොරටුවේ පටු සිදුරකින් වෙඩි තබන අයුරු වීඩියෝ ගත වී තිබූ බන්ධනාගාර නිලධාරියෙකුගේ ක්‍රියාව සාධාරණීකරණය කළ වැඩබලන බන්ධනාගාර කොමසාරිස් ජනරාල් ප්‍රසාද් හේමන්ත කුමාර, එම වෙඩි තැබීම් "විශාල බන්ධනාගාර බිඳීමක් වැළැක්වීම සඳහා අත්‍යවශ්‍ය වූවක්" බව කියා සිටියේය.



මීගමුව බන්ධනාගාර කැරැල්ල සහ වෙඩි තැබීම අතරතුර තුවාල ලබා මියගිය වින්දිතයන් කිහිපදෙනෙක්. ඡායාරූපය සමාජ මාධ්‍යවලින් ලබාගන්නා ලද්දකි.

මෙම විග්‍රහය, ජේවීපී/ජාජබ (JVP/ NPP) රජයේ උත්සන්න වෙමින් පවතින "මත්ද්‍රව්‍යවලට එරෙහි යුද්ධය" සමඟ මනාව බද්ධ වන ඝාතන සඳහා වූ දේශපාලන ආවරණයකි. එම යුද්ධය වනාහි, දිළිඳුකම අපරාධයක් බවට පත් කිරීම සහ පොලිස් රාජ්‍ය බලතල ව්‍යාප්ත කිරීම සාධාරණීකරණය කිරීම සඳහා කලක් තිස්සේ භාවිත වන යාන්ත්‍රණයකි.

නිල අසත්‍ය ප්‍රකාශයන්හි ඓතිහාසික වාර්තාව විමසා බැලීමෙන් වැදගත් පාඩමක් උගත හැකිය. 2020 වසරේදී මහර බන්ධනාගාරයේදී රැඳවියන් 11 දෙනෙකු වෙඩි තබා ඝාතනය කිරීමෙන් පසු, රාජපක්ෂ රජය එම සිදුවීමට හේතුව ලෙස මානසික රෝග සඳහා භාවිත කරන ඖෂධ සහ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ කුමන්ත්‍රණ ඉදිරිපත් කළේය. කෙසේ වුවද, එම ප්‍රකාශ පදනම් විරහිත බව මනෝ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනය විසින් ප්‍රතික්ෂේප කරන ලද අතර, වින්දිතයන් සියලු දෙනාම මියගොස් ඇත්තේ වෙඩි වැදීමෙන් බව පශ්චාත් මරණ පරීක්ෂණ මගින් තහවුරු විය. 2012 වසරේ වැලිකඩ බන්ධනාගාරයේදී රැඳවියන් 27 දෙනෙකු ඝාතනය කිරීමේ සිදුවීම ද අනුගමනය කළේ එම පිටපතමය. එහිදී රජය එය "දරුණු ගණයේ අපරාධකරුවන්ගේ" කැරැල්ලක් ලෙස හඳුන්වමින් ඊට දෝෂාරෝපණය කළ ද, බීබීසී සිංහල සේවය වෙත සිරකරුවෙකු ලබා දුන් සැලකිරීමකින් හෙළි වූයේ මෙම සමූල ඝාතනය සිදු කිරීමට පෙර විශේෂ කාර්ය බලකා (STF) කොමාන්ඩෝ භටයන් විසින්ම රැඳවියන්ට මාංචු දැමීම, පහර දීම සහ කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීම මගින් එම ගැටුම ඇවිස්සූ බවයි.

දශක ගණනාවක් පුරා සහ විවිධ පාලන තන්ත්‍රයන් යටතේ මෙම රටාව නොවෙනස්ව පවතී: එනම් කුපිත කිරීම, ඝාතනය කිරීම, බොරු කීම සහ

 ISSN 3093-6217

පරීක්ෂණ පැවැත්වීමයි. මෙහිදී "පරීක්ෂණ පැවැත්වීම" යන්නෙන් අදහස් කරන්නේ සත්‍යය යටපත් කරන සහ ඝාතකයන් වරදින් නිදහස් කරන වාර්තාවක් සැකසීම සඳහා විශ්‍රාමික විනිසුරුවරුන්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීමයි. විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයෙකුගේ ප්‍රධානත්වයෙන් යුත් ත්‍රිපුද්ගල කමිටුවක් පත්කිරීම පිළිබඳ නානායක්කාරගේ නිවේදනය, දේශපාලන තීන්ඩුවක් ලෙස හැඳින්වීම පවා තරම් නොවන කලින්ම පුරෝකථනය කළ හැකි වූ, මෙම චාරිත්‍රයේ නවතම පියවරයි.

### මේ බන්ධනාගාර පුරවන්නේ කවුරුන්ද?

මීගමුව බන්ධනාගාරයේදී මියගිය පිරිස "පාතාල අපරාධකරුවෝ" නොවෙති. ඔවුන්ගෙන් අතිබහුතරයක් වරදකරුවන් ලෙස තවමත් තීරණය කර නොමැති, රිමාන්ඩ් භාරයේ පසු වූ රැඳවියන් ය. මොවුන් ලංකාවේ සමස්ත බන්ධනාගාර ජනගහනයෙන් සියයට 75 ක් පමණ වන සමාජ පන්තියකට අයත් පිරිසකි. ඔවුන්ව රඳවා තබා තිබුණේ පුද්ගලයන් 900 දෙනෙකු සඳහා ඉදිකරන ලද, නමුත් දැනට මනුෂ්‍යයන් 2,400 කට ආසන්න පිරිසක් ගාල් කර ඇති බන්ධනාගාරයක ය. ජාතික මට්ටමෙන් ගත් කල, රැඳවියන් 11,762 දෙනෙකුට ඉඩකඩ ඇති ලංකාවේ බන්ධනාගාරවල, මේ වන විට 42,000 කට අධික පිරිසක් රඳවා තබා ඇත. එය බන්ධනාගාර සඳහා නියමිත ධාරිතාව මෙන් හතර ගුණයකට ආසන්න ප්‍රමාණයකි.

මීගමුව බන්ධනාගාර කැරැල්ල සහ වෙඩි තැබීම අතරතුර තුවාල ලබා මියගිය වින්දිතයන් කිහිපදෙනෙක්. ඡායාරූපය සමාජ මාධ්‍යවලින් ලබාගන්නා ලද්දකි.

මොවුන් ඔප්පු වූ අපරාධ සඳහා දඬුවම් විඳින පුද්ගලයන් නොවේ. මොවුන් ප්‍රධාන වශයෙන්ම මත්ද්‍රව්‍ය ආශ්‍රිත චෝදනා මත අත්අඩංගුවට ගෙන, ඉන්පසු ඇප ලබා ගැනීමට හෝ නීතිමය සහාය ලබා ගැනීමට මූල්‍යමය හැකියාවක් නොමැතිකම හේතුවෙන් බොහෝ විට වසර ගණනාවක් තිස්සේ අවිනිශ්චිත අධිකරණමය සිරවීමක රඳවා තබා සිටින පිරිසකි. **ඔවුන් දඬුවම් ලබන්නේ ඔවුන් විසින් කරන ලදැයි ඔප්පු වූ වරදකට නොව, ඔවුන්ගේ සමාජ තත්ත්වය හේතුවෙනි. එනම්, ඔවුන් දුප්පත්, සමාජයෙන් කොන් වූ සහ ධනවාදී අවශ්‍යතාවලට අතිරික්ත වූ පිරිසක් වීම නිසාය.** මෙම රිමාන්ඩ් රැඳවියා යනු ධනේශ්වර "යුක්තියේ" පන්තිමය තර්කනය වඩාත්ම පිරිසිදුව ප්‍රකාශ වන සංකේතයයි.

ඔවුන්ව රඳවා තබා ඇති තත්ත්වයන් ක්‍රමානුකූල වධහිංසාවකට සමාන වේ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2021 වාර්තාව මඟින් සනාථ කර ඇති පරිදි, රැඳවියන්ට සිටගෙන නිදා ගැනීමටත්, මළපහ කිරීම සඳහා ෂොපින් බෑග් භාවිතා කිරීමටත් සිදු වී ඇත. එමෙන්ම එක් රැඳවියෙකු ප්‍රකාශ කළ පරිදි "බල්ලන් සහ බළලුන් පවා" ප්‍රතික්ෂේප කරන මට්ටමේ ආහාරවලින් යැපීමට ඔවුන්ට සිදුව තිබේ. මීගමුව බන්ධනාගාරය යනු පද්ධතිමය අසාධාරණත්වයේ ප්‍රකාශනයක් බඳු වූ, ඕනෑම මොහොතක පුපුරා යාමට ආසන්නව තිබූ එකකි. දැඩි අධික තදබදය, සාගත මට්ටමේ ආහාර, කිසිසේත්ම නොපවතින සනීපාරක්ෂක පහසුකම් සහ ආරක්ෂකයන්ගෙන් එල්ල වන දෛනික ප්‍රචණ්ඩත්වය එහි අනිවාර්ය අංග වේ. අවසානයේ එය පුපුරා ගිය විට, රාජ්‍යය ඊට ප්‍රතිචාර දැක්වූයේ ප්‍රතිසංස්කරණවලින් නොව, වෙඩි උණ්ඩවලිනි.

**මෙය පද්ධතියේ කිසියම් බිඳවැටීමක් හෝ දෝෂයක් නොවේ. එය පද්ධතිය සැලසුම් කර ඇති පරිදිම ක්‍රියාත්මක වීමකි. රාජ්‍යය විසින් මෙවැනි සිතාමතා සැලසුම් කරන ලද කුරිරු තත්ත්වයන් පවත්වාගෙන යනු ලබන්නේ, වැළැක්විය නොහැකි පිපිරීමක් සිදු වූ විට, ඊට එරෙහිව අතිමහත් මාරාන්තික බලයක් මුදා හැරීම සඳහා ය.** මෙම පිපිරීම සමූලඝාතනයක් සඳහා අවශ්‍ය නිදහසට කරුණු සපයන අතර, එම සමූලඝාතනය බන්ධනාගාර පවුරෙන් පිටත සිටින වැඩකරන පන්තිය බිය ගැන්වීම සඳහා වන ආදර්ශයක් ලෙස ක්‍රියා කරයි.

### ආරක්ෂකයින්: නිල ඇඳුම් ඇඳි කම්කරුවෝ

මීගමුවේදී ගඩොල් සහ යකඩ පොලුවලින් පහර දී මරා දමන ලද බන්ධනාගාර නියාමකයින් සහ නිලධාරීන් සත්දෙනා ද දිළිඳු ග්‍රාමීය පවුල්වලින් සහ පහළ මධ්‍යම පාන්තික පසුබිමකින් පැමිණි අය වෙති. ඔවුන් මෙවැනි අනතුරුදායක සහ අවමන් සහගත රැකියාවන් තෝරාගත්තේ වෙනත් විකල්පයක් නොතිබූ බැවිනි. එහෙත්, ඔවුන් හුදෙක් තමන් විසින් නිර්මාණය නොකරන ලද පිපිරීමක දෙපාර්ශවයේ ගැටුමට මැදි වූ නිෂ්ක්‍රීය වින්දිතයන් නොවූහ. ඔවුහු එම පීඩනකාරී පරිසරය දිනපතා සෘජුවම නිර්මාණය කිරීමට දායක වූ මෙවලම් බවට පත්ව සිටියහ.

රැඳවියන්ට එල්ල වූ අතිශය කෲර වධහිංසා, අවමන් සහගත සහ අමානුෂික සැලකීම් මෙන්ම ක්‍රමානුකූල අවසංග්‍රහය (mistreatment) ක්‍රියාත්මක කරන ලද්දේ මෙම ආරක්ෂකයින් හරහා ය. පහරදීම් සිදු කළේ ඔවුන්ගේ දෑතින් ය. අපහාසාත්මක වදන් පිටවූයේ ඔවුන්ගේ මුවින් ය. කුසගින්නේ තැබීම, හුස්ම හිරවන සුලු දැඩි තදබදය සහ වෛද්‍ය ප්‍රතිකාර අහිමි කිරීම වැනි තත්ත්වයන් බලහත්කාරයෙන් පවත්වාගෙන ගියේ ඔවුන්ගේ මැදිහත්වීමෙනි. ශරීරයට ගඩොල් කැබලි සහ යකඩ මුගුරු වලින් ඇන ඔවුන්ව ඝාතනය කිරීමට හේතු වූ, එම දැඩි සහ පාලනය කරගත නොහැකි කෝපය, අරමුණක් නොමැතිව හෝ වැරදි දිශාවකට එල්ල වූවක් නොවේ. එය දිනෙන් දින, සතියෙන් සතිය සහ මාසෙන් මාසය රැඳවියන්ගේ ජීවිතය ජීවමාන අපායක් බවට පත් කළ සෘජු වගකිවයුත්තන් ඉලක්ක කර ගනිමින් පුපුරා ගිය කෝපයකි.

ධනේශ්වර දණ්ඩනීය යාන්ත්‍රණයේ ඇති ගැඹුරුම බේදවාචකය මෙයයි: එය හුදෙක් ශ්‍රමිකයන්ව අනතුරට මුහුණ දෙන පෙරමුණට ඇද දැමීම පමණක් සිදු නොකරයි. එය ක්‍රමානුකූලව ඔවුන්ගේ මිනිස්කම අහිමි කරමින් (dehumanize) ඔවුන්ව මිලිටරිකරණයට ලක් කරයි;

ප්‍රචණ්ඩත්වය සඳහා ඔවුන්ව මානසිකව සූදානම් කරමින්, වධහිංසා පැමිණවීමට හුරු කරමින් සහ තමන්ගේම පන්ති සහෝදරයන් කෙරෙහි වෛර කිරීම සඳහා ඔවුන්ගේ මොළය සෝදා හරියි. කුසගින්නේ පසුවන රක්ෂිත බන්ධනාගාර රැඳවියෙකුට පහර දෙන බන්ධනාගාර නියාමකයා ද, සිරකුටි පුරවන එම ග්‍රාමීය අන්ත දිළිඳුකමේම තවත් එක් ප්‍රතිඵලයකි. නමුත්, රාජ්‍යය ඔහුගේ ආත්මය බිඳ දමා, ඔහුගේ සහෝදරත්වයේ හැඟීම උදුරාගෙන ඇත. වැලිකඩ බන්ධනාගාරයේ පිටත තාප්පයේ ලියා ඇති "සිරකරුවෝ ද මනුෂ්‍යයෝ ය" යන ව්‍යාජ සටන් පාඨයට පටහැනිව, සිරකරුවා යනු තමන් හා සමානවම එකම ක්‍රමවේදයක තවත් එක් ගොදුරක් ලෙස නොව, "කුඩුකාරයින් ", "පාතාල නීචයන්" හෝ "මනුෂ්‍යයෙකු නොවන" අපරාධකරුවෙකු වැනි සතුරෙකු ලෙස දැකීමටත්, ඔහුට එල්ල කරනු ලබන ඕනෑම ප්‍රචණ්ඩත්වයකට ඔහු සුදුසු අයෙකු බව සිතීමටත් රාජ්‍යය එම නියාමකයාව පුහුණු කර ඇත. **නිල ඇඳුම දරා සිටින තෙක්, මෙම නියාමකයා සවිඥානිකව මෙන්ම පූර්ණ වශයෙන්ම සේවය කරන්නේ ධනේශ්වර පාලක පන්තියට සහ එහි මර්දනකාරී යාන්ත්‍රණයටයි.** බන්ධනාගාරයක් තුළට කිසි දිනෙක පය නොතබන පාලක පන්තිය, දුප්පතුන්ගේ එක් කොටසක් ලවා තවත් කොටසකට කෲර ලෙස වධහිංසා පැමිණවීම සඳහා යොදවන යාන්ත්‍රණයක් සාර්ථකව නිර්මාණය කර ඇත. අවසානයේදී මෙම ක්‍රියාවලිය තුළ ඒ දෙපාර්ශවයම විනාශ වී යයි.

සිරකරුවන්ගේ ක්‍රෝධය වැරදි ඉලක්ක කරා යොමු වූවක් නොවේ. එය එල්ල වූයේ පවත්නා ක්‍රමයේ කෲරත්වයේ ඍජු පාර්ශවකරුවන් බවට තමන්වම පත් කරගෙන සිටි පුද්ගලයන් වෙතය. මෙහි ඇති ඛේදවාචකය නම්, ධනවාදය පෙරලා දැමීමේ විප්ලවවාදී අරගලයේදී මේ දෙපාර්ශවයම දිළිඳුභාවයට ඇද දමන ධනේශ්වර පන්තියට එරෙහිව තම සගයන් විය හැකි සහ කම්කරු රාජ්‍යයක් යටතේ කිසිසේත්ම තමන්ගේ සතුරන් ලෙස ප්‍රතිපක්ෂ නොවන කම්කරුවන්ම, සිරකරුවන්ට ප්‍රහාර එල්ල කිරීම සඳහා පවත්නා ක්‍රමය තුළ ඉතිරි වී සිටි එකම ඉලක්කය බවට පත් වන පරිදි මෙම ව්‍යුහය සකස් කර තිබීමයි. මීගමුවේදී මියගිය බන්ධනාගාර නියාමකයින් එකවරම අපරාධකාරයන් මෙන්ම වින්දිතයන් ද වෙති. එනම් ඔවුහු ඝාතකයන් මෙන්ම ඝාතනයට ලක්වූවන් ද වෙති; පන්ති පීඩනයේ මෙවලම් වන අතරම තමන් ද පීඩාවට පත් වූවන් වෙති. තමන්ට ක්‍රියාත්මක වීමට වැටුප් ගෙවනු ලැබූ එම යන්ත්‍රණය විසින්ම ඔවුන්ව ද අමානුෂිකත්වයට (dehumanize) පත් කර ඇත. ආරක්ෂිත දුරක සිට මෙම සහෝදර ඝාතනය මෙහෙයවූ පාලක පන්තිය, සිරකරුවන් හෝ බන්ධනාගාර නියාමකයින් වෙනුවෙන් ශෝක නොවනු ඇත. එයට පුද්ගලික දේපළ ක්‍රමය පවත්වාගෙන යාම සඳහා ඔවුන් දෙපාර්ශවයේම මරණ අවශ්‍ය විය.

**රාජ්‍ය ප්‍රචණ්ඩත්වයේ ඓතිහාසික ගමන් පථය**

මීගමුව සමූලඝාතනය තේරුම් ගත යුත්තේ ශ්‍රී ලංකාවේ බලයට පත් වූ සෑම ධනේශ්වර පාලන තන්ත්‍රයක්ම අඛණ්ඩව පවත්වාගෙන ගිය දණ්ඩන ප්‍රචණ්ඩත්වයේ ඉතිහාසය තුළ පිහිටා ගනිමිනි. එම ලැයිස්තුව බියජනක ය: 2020 වසරේ මහර (වෙඩි තබා 11 දෙනෙකු ඝාතනය කිරීම), 2012 වසරේ වැලිකඩ (පොලිස් විශේෂ කාර්ය බලකායේ කොමාන්ඩෝ භටයන් විසින් 27 දෙනෙකු ඝාතනය කිරීම), 2011 වසරේ අනුරාධපුරය, 2000 වසරේ කළුතර, සහ 2000 වසරේ බිඳුණුවැව (රාජ්‍යය නිහඬව බලා සිටියදී සිංහල අන්තවාදී පිරිසක් විසින් දෙමළ රැඳවියන් 27 දෙනෙකු කපා කොටා ඝාතනය කිරීම) ඒ අතර වේ. 1983 දෙමළ විරෝධී කළු ජූලියේ කෝලාහලය අතරතුර වැලිකඩ බන්ධනාගාරයේදී, බන්ධනාගාර බලධාරීන්ගේ සහයෝගය ඇතිව සිංහල වර්ගවාදී සිරකරුවන් විසින් දෙමළ දේශපාලන සිරකරුවන් 53 දෙනෙකු ඝාතනය කරන ලදී.

බන්ධනාගාර සමූලඝාතනයන්හි මෙම ගමන් පථය, කම්කරු පන්තියට සහ පීඩිත ජනතාවට එරෙහිව ක්‍රියාත්මක වූ රාජ්‍ය ප්‍රචණ්ඩත්වයේ පුළුල් ඉතිහාසයෙන් වෙන් කළ නොහැක්කකි. 1988-89 කාලසීමාවේ පැවති ජවිපෙ කැරැල්ල අතරතුර, රාජ්‍ය බලකායන් විසින් දිවයිනේ දකුණු ප්‍රදේශයේ ග්‍රාමීය තරුණයන් දස දහස් ගණනක් ඝාතනය කරන ලදී. එය රාජ්‍යයේ කිසිදු දේශපාලන හෝ මිලිටරි නායකත්වයක් මෙතෙක් වගවීමකට ලක් නොවූ සමූහ ඝාතන මෙහෙයුමකි. ජනතා විමුක්ති පෙරමුණ ද එකී වකවානුව තුළම මව්බිම ආරක්ෂා කිරීමේ නාමයෙන්, කම්කරුවන්, වෘත්තීය සමිති ක්‍රියාධරයන් සහ දේශපාලන ප්‍රතිවාදීන් ඉලක්ක කර ගනිමින් දේශපාලන ඝාතන දියත් කිරීමේ ෆැසිස්ට්වාදී මෙහෙයුමක් දියත් කළේය. වත්මන් ජවිපෙ/ජාජබ (JVP/NPP) ආණ්ඩුව — එහි ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා මෑතකදී ප්‍රකාශ කර තිබුණේ "මෙම ආණ්ඩුවෙන් පසු වෙනත් ආණ්ඩු බිහි නොවන" බවයි — තමන්ගේම ශ්‍රේණීන් තුළ මෙම ඉතිහාසයට කිසිසේත්ම මුහුණ දී නොමැති අතර, වත්මන් ආණ්ඩුව සුජාත පාලක පක්ෂයක් ලෙස සලකන ධනේශ්වර මාධ්‍ය සහ දේශපාලන සංස්ථාපිතය විසින් ද එසේ කිරීමට ඔවුන්ට කිසිදු බලපෑමක් එල්ල කර නැත.

දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානයට එරෙහිව වසර 26ක් පුරා පැවති සිවිල් යුද්ධය 2009 වසරේදී අවසන් වූයේ, එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂගේ මෙහෙයවීම යටතේ අවසන් මාස කිහිපය තුළ පමණක් දළ වශයෙන් දෙමළ සිවිල් වැසියන් 40,000ක් ඝාතනය කරමිනි. 1979 වසරේදී පනවන ලද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA), එය අහෝසි කරන බවට මැතිවරණ සමයේදී පැහැදිලි පොරොන්දු ලබා දී තිබුණද, අනුර කුමාර දිසානායකගේ වත්මන් ජවිපෙ/ජාතික ජන බලවේගය රජය විසින් ද තවදුරටත් පවත්වාගෙන යනු ලබයි. දේශපාලන ප්‍රතිවාදීන් රඳවා තබා ගැනීමට, වධහිංසා පැමිණවීමට සහ අතුරුදහන් කිරීමට දශක ගණනාවක් තිස්සේ මෙම පනත භාවිතා කර ඇත. ස්ත්‍රී දූෂණය ඇතුළු අනෙකුත් වධහිංසා පැමිණවීමේ ක්‍රමවේදයන් ඇතුළත් දරුණු මානව හිමිකම් උල්ලංඝනය කිරීම් හියුමන් රයිට්ස් වොච් (Human Rights Watch) සංවිධානය විසින්

ලේඛනගත කර ඇත. 2017 වසරේ රජයේ වාර්තාවලට අනුව, මෙම ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ නඩු විභාගයකින් තොරව සිරකරුවන් 70 දෙනෙකු වසර පහකට වැඩි කාලයක් ද, 12 දෙනෙකු වසර 10කට වැඩි කාලයක් ද රඳවා තබා ගෙන සිට ඇත.

මීගමුව ඝාතන, "බන්ධනාගාර මත්ද්‍රව්‍ය ජාලයකට" එරෙහිව එල්ල කරන ලද කණගාටුදායක වුවද අවශ්‍ය වූ ප්‍රතිචාරයක් ලෙස දැන් හුවා දක්වන්නේ මෙන්න මේ කියන රාජ්‍යයයි. වධහිංසා පමුණුවන, අතුරුදහන් කරවන සහ සමූහ ඝාතන සිදු කරන රාජ්‍යයම, තමන් කළ දේ පිළිබඳව බොරු ගොතන රාජ්‍යය ද වෙයි. මෙම මුසාව ප්‍රචණ්ඩත්වයට ආනුශංගික වන්නේ නොවේ; එය ප්‍රචණ්ඩත්වයේම අත්‍යවශ්‍ය අංගයකි. වින්දිතයන් යනු සම්පූර්ණ මනුෂ්‍යයන් නොවන බව පිළිගැනීමට මහජන මතය මුලින්ම සකස් නොකර, මෙම ඝාතන ක්‍රියාවලිය ඉදිරියට ගෙන යා නොහැක.

**මතවාදී ප්‍රහාරය: අමානුෂිකකරණය (dehumanization) පන්ති යුද්ධයේ කොටසක් ලෙස**

මීගමුවේදී මියගිය පිරිස හැඳින්වීම සඳහා ආයතනික මාධ්‍ය විසින් "පාතාල අපරාධකරුවන්" සහ "කුඩුකාරයින් " වැනි යෙදුම් භාවිත කිරීම පිටුපස නිශ්චිත මතවාදී කාර්යභාරයක් පවතී. එමඟින් මනුෂ්‍යත්වයට වඩා පහත් මට්ටමක ලා සැලකෙන පිරිසක් නිර්මාණය කෙරේ. ඔවුන්ගේ මරණ මනුෂ්‍ය ඝාතන ලෙස නොව, සමාජය පවිත්‍ර කිරීමේ ක්‍රියාවලියක් ලෙස අර්ථකථනය කෙරෙන අතර, එමඟින් රාජ්‍යයේ මාරාන්තික ක්‍රියාමාර්ග වෙනුවෙන් ඉහළ මධ්‍යම පාන්තික මහජන මතය බලමුලු ගන්වනු ලබයි. මෙය ෆැසිස්ට්වාදී ප්‍රතිමිත්වයේ තර්කනය වන අතර, ජාත්‍යන්තර වශයෙන් ඩොනල්ඩ් ට්‍රම්ප් වැනි පුද්ගලයන් විසින් විදේශික භීතිකාව (xenophobia) යොදා ගනිමින් සංක්‍රමණිකයන්ව යක්ෂාරෝපණය කිරීම ඍජුවම ප්‍රතිබිම්බගත කරයි. මෙහි අරමුණ එකම එකකි: එනම් දරිද්‍රතාවය අපරාධයක් ලෙස හුවා දැක්වීම, රාජ්‍ය භීෂණය සාධාරණීකරණය කිරීම සහ "අපරාධය" මෙන්ම දඬුවම යන දෙකම බිහි කරන පන්ති සබඳතා වසන් කිරීමයි.

ජාත්‍යන්තරව මෙන්ම ශ්‍රී ලංකාව තුළ ද ක්‍රියාත්මක වන "මත්ද්‍රව්‍යවලට එරෙහි යුද්ධය" යනු කිසිම දිනක මහජන සෞඛ්‍ය ප්‍රවර්ධනය උදෙසා ගනු ලැබූ පියවරක් නොවේ. එය **අතිරික්ත ජනගහනය, එනම් ප්‍රාග්ධනයට ඔවුන්ගේ ශ්‍රම දායකත්වය අවශ්‍ය නොවන, එමෙන්ම ඔවුන්ගේ පැවැත්ම සමාජ ක්‍රමයේ ස්ථාවරත්වයට තර්ජනයක් සේ සැලකෙන**, අතිමහත් බහුතරයක් සමාජයේ අතිශය දිළිඳුතම ස්ථරවලින් පැමිණෙන තරුණ පරපුර අපරාධකරුවන් බවට පත් කිරීම සහ ඔවුන්ව ගබඩා කර රඳවා තැබීම සඳහා සකස් කළ යාන්ත්‍රණයකි. රිමාන්ඩ් බන්ධනාගාර පිරී ඉතිරී යන මත්ද්‍රව්‍ය නඩු අතරින් අතිමහත් බහුතරයක් ව්‍යාජ චෝදනා මත පදනම් වූ ඒවා වේ. කාල් මාක්ස් විසින් සිය කැපිටල් (Capital I) කෘතියේ විශ්ලේෂණය කරන ලද ප්‍රාග්ධන සමුච්චකරණයේ ප්‍රාථමික අවධියේදී පැවති "අයාලේ යන්නන්ට එරෙහි නීති" (vagrancy laws) ඉටු කළ කාර්යභාරයම මේවා මඟින් ද ඉටු කෙරේ. එනම්, දේපළ අහිමි කරන ලද දිළිඳු ජනතාව පාලනය කිරීමටත්, ධනේශ්වර සූරාකෑමට හිතකර කොන්දේසි බලහත්කාරයෙන් බලාත්මක කිරීමටත් දණ්ඩනීය නීතිය භාවිත කිරීමයි.

ජනතා විමුක්ති පෙරමුණ/ජාතික ජන බලවේගය රජය සිය දේශපාලන ප්‍රහාරයේ ප්‍රධානතම මෙවලමක් බවට **"මත්ද්‍රව්‍යවලට එරෙහි යුද්ධය"** පත් කර ඇත. මෙවර මැයි දින රැලියේදී අදහස් දක්වමින් ජනාධිපති දිසානායක පාරට්ටු කර සිටියේ "2026 වසර ශ්‍රී ලංකා ඉතිහාසයට එක්වනුයේ දූෂිතයන්, වංචාකරුවන් සහ සොරුන් සිරගත කළ වසරක් ලෙස" බවයි. දූෂණයට සහ මත්ද්‍රව්‍යවලට එරෙහි මෙම වාග් සංග්‍රාමය ද්විත්ව අරමුණක් ඉටු කරයි: **එක් අතකින්, දුප්පත්කම සහ පීඩනය නිර්මාණය කරන ධනේශ්වර ක්‍රමයට එරෙහිව පවතින මහජන ක්‍රෝධය, සමාජ පරිහානියට වගකිව යුතු යැයි සැලකෙන තනි තනි "අපරාධකරුවන්" වෙත හරවා යැවීමට මෙය ඉවහල් වේ; අනෙක් අතින්, කප්පාදු පියවරයන් හේතුවෙන් පැන නගින විරෝධතා දැඩි වන විට කම්කරු පන්තියට එරෙහිව භාවිත කිරීම සඳහා මර්දනකාරී රාජ්‍ය යාන්ත්‍රණය පුළුල් කිරීමට ද මෙය මඟ පාදයි.**

**ජවිපෙ/ජජබ: මර්දනයේ අඛණ්ඩතාව**

මීගමුව සමූලඝාතනය සිදු වූයේ 'ක්‍රම වෙනසක්' (systemic change) ඇති කරන බවට වූ පොරොන්දු මත 2024 වසරේදී බලයට පත් වූ ජවිපෙ/ජජබ රජය යටතේ ය. මෙම ජනවරම, ගෝඨාභය රාජපක්ෂ බලයෙන් පහ කළ 2022 අරගලයේ ජනතා පිබිදීම තුළ මුල් බැසගත් එකක් වුව ද, මහජන අරගලය විප්ලවීය ගැටුමකට යොමු කරනු වෙනුවට පාර්ලිමේන්තු මාවත වෙත හරවා යැවූ වෘත්තීය සමිති නිලධාරිවාදය සහ ජවිපෙ/ජජබය විසින්ම එය දේශපාලනිකව පීලි පන්නවන ලදී. එම පාවාදීම අවසානයේ වික්‍රමසිංහගේ අගමැතිකමටත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) කප්පාදු ණය වැඩසටහනත්, අවසානයේ දිසානායකගේ ජයග්‍රහණයටත් මඟ පෑදීය. ඒ අනුව පොරොන්දු වූ "වෙනස" යනු එම ධනපති පන්ති පාලනයේම අඛණ්ඩ පැවැත්මක් බව දැන් ඔප්පු වී ඇත. බලයට පත් වූ දා සිට ජවිපෙ/ජජබ රජය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කප්පාදු වැඩපිළිවෙළ විශ්වාසවන්තව ක්‍රියාවට නංවා තිබේ: මහා පරිමාණ පෞද්ගලීකරණයන්, සේවා යෝජනය අනියම් තත්වයට හෙළීම හා රැකියා අහිමි කිරීම්, සහනාධාර කප්පාදු කිරීම්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) අහෝසි කරන බවට පොරොන්දු වුව ද එය දිගටම පවත්වාගෙන යාම, නව මර්දනකාරී නීති පැනවීම, හදිසි නීති බලතල ක්‍රියාත්මක කිරීම සහ කම්කරු විරෝධතා ප්‍රචණ්ඩ ලෙස මර්දනය කිරීම ඒ අතර වේ.

මීගමුව සමූලඝාතනය යනු තමන්ට පෙර සිටි පාලකයන් නියෝජනය කළ ධනපති පන්තියම නියෝජනය කරන සහ එම

දේශපාලන සබඳතාම ආරක්ෂා කරන රජයක ස්වාභාවික හා තර්කානුකූල ප්‍රතිඵලයකි. "මේ ආණ්ඩුවෙන් පස්සේ වෙන ආණ්ඩු එන්නේ නැහැ" යනුවෙන් මෙවර මැයි දින රැලියේදී ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා කළ ප්‍රකාශය හුදු අතිශයෝක්තියක් නොවේ. එය විරුද්ධ පක්ෂයේ දේශපාලනඥයන් වෙත නොව, සෘජුවම කම්කරු පන්තිය වෙත එල්ල කරන ලද තර්ජනයකි. ආර්ථික අර්බුදය තවදුරටත් උග්‍ර වෙමින් පවතින පසුබිමක සහ ඉරානයට එරෙහිව එක්සත් ජනපද-නේටෝ (US-NATO) යුද්ධය හේතුවෙන් ගෝලීය බලශක්ති සැපයුමට බාධා පැමිණ ඉන්ධන හා ආහාර මිල ගණන් තවදුරටත් ඉහළ යද්දී, ඉන් පැන නගින වැඩෙන සමාජ විරෝධයට මුහුණ දීම සඳහා ජවිපෙ/ජජබ රජය මෙලෙස පන්ති යුද්ධයකට සූදානම් වෙමින් සිටී.

### ශ්‍රී ලංකා ධනවාදයේ අර්බුදය

බන්ධනාගාර පද්ධතිය යනු ශ්‍රී ලංකා ධනවාදය විසින් නිර්මාණය කර ඇති පුළුල් සමාජ ව්‍යසනයේ සංකේන්ද්‍රිත ප්‍රකාශනයකි. ශ්‍රී ලංකාව ආසියා-පැසිෆික් කලාපයේ වඩාත්ම අසමානතාවයෙන් යුත් රටවල් අතරින් එකකි. 2016 වසරේදී, මෙරට ධනවත්ම 10% ක පිරිස සමස්ත නිවාස ඒකකවලින් 70% ක් උපයන මුළු ආදායමට සමාන ආදායමක් උපයා ඇත. දශක ගණනාවක් තිස්සේ පැවති පරපෝෂිත ධනේශ්වර සංවර්ධනයේ, දූෂණයේ සහ ජාත්‍යන්තර මූල්‍ය ප්‍රාග්ධනයට යටත් වීමේ ප්‍රතිඵලයක් ලෙස 2022 වසරේදී විදේශ ණය පැහැර හැරීමට සිදුවීමත් සමඟ, මෙරට දරිද්‍රතා අනුපාතය වේගයෙන් ඉහළ නැංවූ ආර්ථික බිඳවැටීමක් ආරම්භ විය. නිවාස ඒකකවලින් අවම වශයෙන් 70% ක් වත් දිනකට එක් වේලක් මඟ හැරීම ඇතුළුව සිය ආහාර පරිභෝජනය සීමා කරමින් සිටි බව එක්සත් ජාතීන්ගේ සංවිධානය වාර්තා කළේය. නිල දත්තවලට අනුව ආහාර උද්ධමනය 57% ක් දක්වා ඉහළ ගියේය.

බ්‍රිතාන්‍ය යටත්විජිතවාදය විසින් ඉන්දියාවෙන් රැගෙන එන ලද ගිවිසුම්ගත බද්ධ ශ්‍රමිකයන්ගෙන් පැවත එන්නන්, එනම් මධ්‍යම කඳුකරයේ වතු කම්කරුවන්, සියවසකට අධික කාලයකින් කිසිදු වෙනසකට ලක් නොවූ, ජරාජීර්ණ වූ "ලයින් කාමර" තුළ ජීවත් වෙති. ඔවුහු යන්තම් ජීවිතය ගැටගසා ගැනීමට පවා ප්‍රමාණවත් නොවන වැටුප් ලබමින්, තවමත් අන්ත අසරණ දරිද්‍රතාවයේ කොන්දේසි තුළ ජීවත් වෙති. කොළඹ මුඩුක්කු ආශ්‍රිතව වෙසෙන නාගරික දුප්පතුන්, ණය බරින් සහ පොහොර සහනාධාර අහිමි වීමෙන් පීඩාවට පත් ග්‍රාමීය ගොවීන් සහ ස්ථිර රැකියා විරහිතභාවයට මුහුණ දෙන තරුණ පරපුර ආදී සමාජ ස්ථරයන්ගෙන් බන්ධනාගාර ගත වන ජනගහනය බිහි වෙයි.

මේ සමාජ ස්ථරයන් යනු මානුෂීය අවශ්‍යතාවලට වඩා පෞද්ගලික ලාභය මුල් කරගන්නා පද්ධතියකින් බිහි වූ මිනිස් ප්‍රතිඵලයන්ය. ඔවුන් ඊට එරෙහි වන විට, එනම් ඔවුන් විරෝධය පාන විට, වැඩ වර්ජනය කරන විට, හෝ ප්‍රචණ්ඩ ලෙස නැඟී සිටින විට රජය ඊට පිළිතුරු දෙන්නේ උණ්ඩවලිනි. මෙය පද්ධතියේ අසාර්ථකත්වයක් නොවේ. මෙම පද්ධතියේ ස්වභාවයම එයයි.

### රාජ්‍යය පිළිබඳ මාක්ස්වාදී වටහා ගැනීම

ලෙනින්, රාජ්‍යය සහ විප්ලවය' (The State and Revolution) යන කෘතියෙන් රාජ්‍යය අර්ථ දැක්වූයේ "පන්ති ප්‍රතිවිරෝධතාවල සමහන් කළ නොහැකි ස්වභාවයේ නිෂ්පාදනයක් සහ ප්‍රකාශනයක්" ලෙසය. එය මධ්‍යස්ථ බේරුම්කරුවෙකු හෝ සමාජ ගැටුම් විසඳීමේ යාන්ත්‍රණයක් නොවන අතර, එක් පන්තියක් විසින් තවත් පන්තියක් සංවිධානාත්මකව මර්දනය කිරීම සඳහා භාවිත කරන මෙවලමකි. රාජ්‍යය මූලික වශයෙන් සමන්විත වන්නේ "බන්ධනාගාර ආදිය තම අණසක යටතේ පවත්වාගෙන යන, අවිගත් මිනිසුන්ගෙන් සැදුම්ලත් විශේෂ බලකායන්ගෙන්" බව ඔහු අවධාරණය කළේය. **බන්ධනාගාරය යනු රාජ්‍යයේ පන්තිමය ස්වභාවය සාමාන්‍යයෙන් වසා සිටින ප්‍රජාතන්ත්‍රවාදී-පාර්ලිමේන්තු පෙනුම ඉවත් කළ පසු දැකිය හැකි, එහි වඩාත්ම නිරුවත් ස්වරූපයයි.** කොවිඩ් වසංගතය අතරතුර පී.සී.ආර්. (PCR) පරීක්ෂණ ඉල්ලා සිටි නිරායුධ සිරකරුවන්ට ආරක්ෂකයින් සහ කොමාන්ඩෝ භටයින් වෙඩි තබන විට, සහ බන්ධනාගාරයක් වටලා පිටත රැස්ව සිටින පවුල්වල සාමාජිකයින් බිය ගැන්වීම සඳහා රජය යුද, නාවික, ගුවන් හමුදා, විශේෂ කාර්ය බලකාය (STF) සහ සන්නද්ධ ඩ්‍රෝන යානා යොදවන විට, එහි වෙස්මුහුණ සම්පූර්ණයෙන්ම ගැලවී යයි.

ධනේශ්වර දණ්ඩන පද්ධතිය ප්‍රතිසංස්කරණය කළ නොහැක. මානව හිමිකම් කොමිෂන් සභා වාර්තා, බන්ධනාගාර නවීකරණය පිළිබඳ පොරොන්දු, සහ විමර්ශන කමිටු ආදී මේ සියල්ලම මහජන ක්‍රෝධය සමනය කර, එය නැවතත් ධනේශ්වර නීත්‍යානුකූලභාවය නමැති ආවෘත අන්තයකට යොමු කිරීම සඳහා වූ යාන්ත්‍රණයන් පමණි. මෙම සමූල ඝාතන ඇති කරන තත්ත්වයන්, එනම් සිරකරුවන් අධික ලෙස පිරී ඉතිරී යාම, දරිද්‍රතාවය නිසා සිදු කෙරෙන රක්ෂිත බන්ධනාගාරගත කිරීම්, දුප්පතුන් අපරාධකරුවන් බවට පත් කිරීම සහ ආරක්ෂක අංශවලට හිමි වී ඇති දඬුවම් නොලබා බේරීමේ හැකියාව (වගවීමෙන් මුක්තිය) ආදිය පද්ධතියේ කිසියම් දෝෂයන් නොවේ. ඒවා පද්ධතිය සැලසුම් කර ඇති ආකාරයටම නිවැරදිව ක්‍රියාත්මක වීමකි.

පාලනයට පත් වූ අනුප්‍රාප්තික ආණ්ඩු බන්ධනාගාර ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වූයේ එකම හිස් චාරිත්‍රයකිනි. මහින්ද රාජපක්ෂ පුනරුත්ථාපනය පොරොන්දු විය. ගෝඨාභය රාජපක්ෂ පස් අවුරුදු ප්‍රතිසංස්කරණ සැලසුම් පොරොන්දු විය. සිරිසේන සංක්‍රාන්ති යුක්තිය පොරොන්දු විය. ජවිපෙ/ජාජබ "පද්ධතිමය වෙනසක්" පොරොන්දු විය. කමිටු පත් කරනු ලැබේ, සැලසුම් ප්‍රකාශයට පත් කරනු ලැබේ, නමුත් ප්‍රචණ්ඩත්වය ඇති කරන තත්ත්වයන්, එනම් සිරකරුවන් අධික ලෙස පිරී ඉතිරී යාම, නඩු විභාගයකින් තොරව රක්ෂිත බන්ධනාගාරගත කර තැබීම, කුසගින්න

සහ වධහිංසා පැමිණවීම් ආදිය තව තවත් නරක අතට හැරේ. **ඒවා නරක අතට හැරෙන්නේ ධනේශ්වර රාජ්‍යයට ඒවා අත්‍යවශ්‍ය බැවිනි. බන්ධනාගාරය පවතින්නේ දුප්පතුන් ශික්ෂණය කිරීමට, අතිරික්ත ශ්‍රමිකයන් ගබඩා කර රඳවා තැබීමට සහ කම්කරු පන්තිය බිය ගන්වා අවනත කර ගැනීමටය.** එහි කාර්යභාරය සහමුලින්ම මර්දනකාරී එකක් වන බැවින්, එය කිසිසේත්ම ප්‍රතිසංස්කරණය කළ නොහැක.

**විප්ලවවාදී පිළිතුර**

මීගමුව බන්ධනාගාරයේදී මියගිය සිරකරුවන් මෙන්ම ආරක්ෂකයින්ද, ඝාතනය කරනු ලැබුවේ, පාලක පන්තිය පසෙකට වී බලා සිටිමින් පීඩිතයන් එකිනෙකාට එරෙහිව පොලඹවන අතර, එය සාධාරණය ඉටු කිරීමක් ලෙස හඳුන්වන ක්‍රමවේදයක් මගිනි. **සිරකරුවන් ඝාතනය කරනු ලැබුවේ ඔවුන්ගේ ශ්‍රමය ප්‍රාග්ධනයට වටිනාකමක් නොමැති බැවින් ඔවුන්ගේ ජීවිතද වටිනාකමක් නොමැති දේ ලෙස සලකන රාජ්‍යයක් විසිනි.** බන්ධනාගාර ආරක්ෂකයින් ඝාතනයට ලක් වූයේ ද එකී ක්‍රමය විසින්ම වන අතර, ඔවුන් එයට බඳවා ගෙන තිබුනේ එමගින් තමන්ට කිසිසේත් ගැලවිය නොහැකි පරිදි මෙන්ම, තමන් එය නිර්මාණය කිරීමේ අවසාන මෙවලම් පමණක් වූ පුපුරණ සුලු කෝපයක මාවතට තමන්ව ඇද දමන භූමිකාවක් සඳහාය.

මීගමුව, මහර, වැලිකඩ මෙන්ම ධනේශ්වර දණ්ඩන ක්‍රමයේ මුළු මහත් ලේවැකි ඉතිහාසයටම ඇති එකම පිළිතුර නම්, සමස්ත ධනපති රාජ්‍යයට එරෙහිව වැඩකරන පන්තිය ස්වාධීන දේශපාලන බලවේගයක් ලෙස බලමුලු ගැන්වීමයි. මෙයින් අදහස් කරන්නේ, වාර්ගික බෙදීම් අභිබවා යමින් සිංහල, දෙමළ සහ මුස්ලිම් කම්කරුවන්ගේ එක්සත්කම උදෙසා සටන් වදින සහ ඔවුන්ව එකිනෙකාගෙන් වෙන් කර ධනේශ්වර පන්ති පාලනය ශක්තිමත් කිරීම සඳහා ඔවුන් අතර බෙදීම් ඇති කරන පාලක පන්තියට එරෙහිව, කම්කරු පන්තිය හා සියලු පීඩිත ස්ථරයන්, ගොවි ජනතාව සහ තරුණයින් අතර සන්ධානයක් ගොඩනගන, සමාජවාදී ජාත්‍යන්තරවාදයේ වැඩපිළිවෙළින් සන්නද්ධ වූ විප්ලවවාදී පක්ෂයක් ගොඩනැගීමයි.

කර්මාන්තශාලා, කාර්යාල, වතුකරය සහ ග්‍රාමීය ප්‍රජාවන් නියෝජනය කරන රට පුරා සිටින කම්කරුවන්, සියලුම ධනේශ්වර පක්ෂවලින් සහ ඒවාට අනුබද්ධ වෘත්තීය සමිති නිලධාරිවාදයෙන් ස්වාධීන වූ තමන්ගේම ක්‍රියාකාරී කමිටු පිහිටුවා ගත යුතුය. මෙම කමිටු, සමාගම් ලාභය වෙනුවට මානුෂීය අවශ්‍යතා මුල් කරගත් වැඩපිළිවෙළක් ඉදිරියට ගෙන යන කම්කරුවන්ගේ සහ ග්‍රාමීය ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී සහ සමාජවාදී මහා සම්මේලනයක පදනම විය යුතුය. එම වැඩපිළිවෙළට: විදේශ ණය ප්‍රතික්ෂේප කිරීම, කම්කරුවන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යටතේ බැංකු සහ ප්‍රධාන සමාගම් ජනසතු කිරීම, ජීවන වියදමට සරිලන සේ වැටුප් සංශෝධනය කිරීම, සැමට රැකියා සහතික කිරීම සහ දිළිඳු ගොවීන්ගේ හා සුළු ව්‍යාපාරිකයන්ගේ ණය අවලංගු කිරීම ඇතුළත් විය යුතුය.

ධනේශ්වර දණ්ඩන පද්ධතියට එරෙහි අරගලය, ධනවාදයට එරෙහි අරගලයෙන් වෙන් කළ නොහැක. බන්ධනාගාර ක්‍රමය මුළුමනින්ම තුරන් කළ හැක්කේ, ඒ සඳහා පසුබිම සකසන පන්ති සමාජය විප්ලවීය ලෙස පෙරළා දැමීමෙන් පමණි. ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වයෙහි (SLLA) කර්තව්‍යය වන්නේ, එම අරගලය සඳහා කම්කරු පන්තිය සංවිධානය කිරීමට සමත් දේශපාලන නායකත්වය ගොඩනැඟීමයි. එය කළ හැක්කේ, ශ්‍රී ලංකාව තුළ සහ සමස්ත දකුණු ආසියාව පුරා, ලෝක සමාජවාදී විප්ලවයේ පක්ෂය වන හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (ICFI) ජාත්‍යන්තර අරගලයේ කොටසක් ලෙසින් පමණි.

මීගමුවේදී මියගියවුන් ඉල්ලා සිටින්නේ ඊට අඩු කිසිවක් නොවේ.

---

**කම්කරුවනි, පීඩිත ජනතාවනි, තරුණයිනි, ශිෂ්‍යයිනි,**

**ගාසා ජන සංහාරය නවතනු!**

**අධිරාජ්‍යවාදය හංග කරනු! සයොන්වාදය පරාජය කරනු!**

**යුද අපරාධකරුවන් වගවීමට ලක් කරනු!**

**ඉරානයට අත නොතබනු - ඇමරිකානු-ඊශ්‍රායල ආක්‍රමණික යුද්ධය වහා නවතනු!**

**සියලුම ඇමරිකානු හමුදා නැවත කැඳවනු! කඳවුරු වසා දමනු!**

**තෙල් සඳහා තවත් ලේ නැත – සම්පත් අත්පත් කර ගැනීම අවසන් කරනු!**

**මිලිටරිය සඳහා අරමුදල් නවතනු! පාසල්, රෝහල්, නිවාස සඳහා අරමුදල් සපයනු!**

**ඉරාන කම්කරුවන් සමඟ සහයෝගීතාවය ගොඩ නගනු! අධිරාජ්‍යවාදී ආක්‍රමණයට හා පාලක රෙජීමයට එරෙහිව ඉරාන ජනතාව ආරක්ෂා කරනු!**

**කම්කරු ක්‍රියාකාරී කමිටු ගොඩනගනු! ජාත්‍යන්තරව සෑම සේවා ස්ථානයකම කාර්මික ශක්තිය එක්සත් කරනු!**

**වැඩ අඩාල කිරීමේ සිට මහා වැඩ වර්ජනය දක්වා සටන් කරනු! යුද යන්ත්‍රය නවතනු!**

**කම්කරු පන්තියේ ස්වාධීන බලය ගොඩ නගනු!**

**IMF කප්පාදු එපා! සියලු විදෙස් ණය අහෝසි කරනු!**

**සමාජවාදී නායකත්වය ගොඩ නගනු!**

# එක්සත් ජනපද කතිපයාධිකාරයේ අපරාධ කල්ලි නායකයා: ට්‍රම්ප් 2025 දී ඩොලර් බිලියන 2.2ක් සාක්කුවේ දමාගනී

**බැරී ග්‍රේ** විසිනි.

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ (WSWS) 2026 ජූලි 02 දින “The U.S. oligarchy’s crime boss: Trump pocketed $2.2 billion in 2025” යන හිසින් පළවූ බැරී ග්‍රේ විසින් ලියන ලද ඉදිරිදර්ශන ලිපියේ සිංහල පරිවර්තනය යි.

පසුගිය අඟහරුවාදා, ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් තමන්ගේ 2025 වර්ෂය සඳහා වන අනිවාර්ය මූල්‍ය හෙළිදරව්ව ප්‍රකාශයට පත් කළේය. එයින් පෙන්නුම් කෙරුණේ ඔහුගේ දෙවන ධූර කාලයේ පළමු වසර තුළදී ඔහු තම පෞද්ගලික ආදායම තුන් ගුණයකට වඩා වැඩි කරගෙන ඇති බවයි; එනම් 2024 දී ඩොලර් මිලියන 622ක් වූ ආදායම පසුගිය වසරේදී අවම වශයෙන් ඩොලර් බිලියන 2.2ක් දක්වා ඉහළ නංවාගෙන ඇත.



ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් *2026* මාර්තු *9* වන සඳුදා, ෆ්ලොරිඩාවේ ඩොරල් හි ට්‍රම්ප් ජාතික ඩොරල් මියාමි හි පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවකදී කතා කරයි *[AP* ඡායාරූපය/මාර්ක් ෂීෆෙල්බයින්*]*

ට්‍රම්ප් තමන්ගේ ධනය වර්ධනය කරගෙන ඇති පරිමාණය සමඟ සසඳන කල, ඇමරිකානු ඉතිහාසයේ මහා දූෂණ වංචාවන් කිසියම් ඇන්ටික් සුන්දරත්වයක් ගැබ් කරගත්තාක් සේ පවා පෙනී යයි. දේශපාලන සාපරාධීත්වයේ සංකේතයක් ලෙස සියවසක් පුරා පැවති 1920 ගණන්වල ‘ටීපොට් ඩෝම්’ (Teapot Dome) සිදුවීම කේන්ද්‍රගත වූයේ, එවකට අභ්‍යන්තර කටයුතු ලේකම් ඇල්බට් ෆෝල් විසින් නාවික තෙල් සංචිත බදු දීම වෙනුවෙන් ලබාගත් ඩොලර් 400,000ක (අද මුදලින් ඩොලර් මිලියන 8ක පමණ) අල්ලසක් වටාය. ෆෝල්ට බන්ධනාගාරගත වීමට සිදු විය.

1973 දී උප ජනාධිපති ස්පිරෝ ඇග්නියුට ඉල්ලා අස්වීමට සිදු වූයේ මේරිලන්ඩ් කොන්ත්‍රාත්කරුවන්ගෙන් මුදල් නෝට්ටු අඩංගු කවර මඟින් ලබාගත් සමස්තයක් ලෙස ඩොලර් 250,000ක පමණ අල්ලස් මුදලක් හේතුවෙනි. ට්‍රම්ප්ගේ ප්‍රමිතීන්ට අනුව බලන කල, මේවා ඉතා සුළු මුදල්ය.

මෙම වාර්තාව මඟින්, දේපළ වෙළඳාම් වංචාකරුවෙකු සහ මාධ්‍ය තොරම්බල් කාරයෙකුව සිට එක්සත් ජනපද ජනාධිපතිවරයා බවට පත්වූ පුද්ගලයාට තමන්ගේ සහ තම පවුලේ ධනය දැවැන්ත ලෙස වර්ධනය කර ගැනීමට මඟ පෑදූ බරපතල බියසැක නැති අත්තනෝමතික ගනුදෙනු සහ දූෂණ පිළිබඳ සමහර ඇඟවීම් සපයයි. පසුගිය සැප්තැම්බර් මාසය වන විට, ට්‍රම්ප් පවුලේ සමස්ත ධනය ඇස්තමේන්තුගත ඩොලර් බිලියන 10ක් ලෙස පැවති අතර, එය 2024 නොවැම්බර් මැතිවරණයෙන් පසුව දෙගුණයකින් පමණ ඉහළ ගොස් තිබුණි. ඩොනල්ඩ් ට්‍රම්ප් ජූනියර්ගේ ධනය ඩොලර් මිලියන 50 සිට ඩොලර් මිලියන 300 දක්වා ඉහළ ගිය අතර, එරික් ට්‍රම්ප්ගේ ධනය දස ගුණයකින් එනම් ඩොලර් මිලියන 400 දක්වා ඉහළ ගියේය.

එම වසරේදීම, ජාතික ආදායමෙන් ශ්‍රමයට හිමිවන කොටස වාර්තා තැබීම ආරම්භ කළ දා සිට අඩුම මට්ටම දක්වා පහත වැටුණි. 2025 තුන්වන කාර්තුවේදී ශ්‍රමයේ කොටස සියයට 53.8 දක්වා පහත වැටුණු අතර, එය 1947 දී සියයට 70ක් ලෙස පැවතුණි. මෙම සංඛ්‍යාලේඛන සැබෑ ජීවිතය තුළට පරිවර්තනය වන්නේ දරිද්‍රතා මට්ටමේ වැටුප්, දරාගත නොහැකි ඉහළ ගෙවල් කුලී සහ ජීවන වියදම් මෙන්ම කෝටි සංඛ්‍යාත කම්කරුවන්ට දිගු සේවා මුරයන්ට මුහුණ දීමට සිදුවීම ලෙසය.

ශ්‍රම සංඛ්‍යාලේඛන කාර්යාංශයේ (Bureau of Labor Statistics) පැය 40ක සේවා සතියක් මත පදනම් වූ සාමාන්‍ය මෝටර් රථ කම්කරුවෙකුගේ වැටුප් ඇස්තමේන්තුවට අනුව, ඩොලර් බිලියන 2.2ක වාර්ෂික ආදායමක් යනු එක්සත් ජනපදයේ මෝටර් රථ කම්කරුවන් 37,931 දෙනෙකුගේ ආදායමට සමාන වේ. ඩොලර් බිලියන 2.2ක වාර්ෂික ආදායමක් යනු පැයකට ඩොලර් 251,000කි. එම අනුපාතයට

අනුව, පුද්ගලයෙකු **තත්පරයකට** ඩොලර් 70ක් උපයන අතර, එය UAW මෝටර් රථ කම්කරුවෙකු **පැයකට** උපයන මුදල මෙන් දෙගුණයකටත් වඩා වැඩිය.

මේ සතියේ ඕවල් කාර්යාලයේ පැවති උත්සවයකදී, අඩු ආදායම්ලාභී නිවාස වර්ධනය කිරීමේ පනත් කෙටුම්පතකට අත්සන් තැබීම ප්‍රතික්ෂේප කිරීම සාධාරණීකරණය කරමින්, මිලියන සංඛ්‍යාත කම්කරු පන්තියේ ඡන්දදායකයන්ගේ ඡන්ද අයිතිය අහෝසි කිරීමේ තම සැලසුම මුලින්ම සම්මත කරන ලෙස කොන්ග්‍රස් මණ්ඩලයෙන් බලකර සිටීමටත්, එම නිවාස පනත "කම්මැලි කතාවක්" (big yawn) ලෙස හැඳින්වීමටත් ට්‍රම්ප් පෙළඹීම පුදුමයක් නොවේ.

2017 සහ 2021 අතර ඔහුගේ පළමු ධුර කාලය තුළදී, ට්‍රම්ප් තමන්ගේ මූල්‍ය කටයුතු තමන්ට පාලනය කළ නොහැකි භාරයන් (blind trusts) වෙත පැවරීමේ නූතන ජනාධිපතිවරුන්ගේ සම්ප්‍රදාය බිඳ දැමුවේය. ඔහු තම ව්‍යාපාරවලින් ඉවත් වීම ප්‍රතික්ෂේප කළ අතර, තවමත් තමන්ට ප්‍රවේශ විය හැකි භාරයක් තුළ ඒවා තැන්පත් කළේය. ඔහු වොෂින්ටන් ඩී.සී. හි පිහිටි තම ට්‍රම්ප් ඉන්ටර්නැෂනල් හෝටලය මුදල් උල්පතක් ලෙස භාවිතා කළ අතර, විදේශීය දූත පිරිස්, තැරැව්කරුවන් (lobbyists) සහ රිපබ්ලිකන් නිලධාරීන්ට එහි මුදල් වියදම් කිරීමට දිරිමත් කළ අතර එම මුදල් ඔහුගේ පෞද්ගලික බැංකු ගිණුම් වෙත ගලා ගියේය. ඇමරිකා-චීන වෙළඳ සාකච්ඡා සිදුවෙමින් පවතින අතරතුරදීම, ඔහුගේ දියණිය වන ඉවන්කා ධවල මන්දිර උපදේශකවරියක ලෙස සේවය කරද්දී ඇයට චීන වෙළඳ ලකුණු (trademarks) කිහිපයක් ලබා දීමට ඔහු කටයුතු කළේය.

කෙසේ වෙතත්, ට්‍රම්ප්ගේ දෙවන ධුර කාලය සමඟ සසඳන කල ඒවා ඉතා සුළු දේවල් වේ. ඔහු තම පළමු ධුර කාලයේදී ලබාදුන් සදාචාරාත්මක ප්‍රතිඥාවට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළ අතර, බයිඩන්ගේ ජනාධිපති සදාචාරාත්මක රීති අවලංගු කළේය, තවද 2025 මුල් භාගයේදී රජයේ සදාචාර කාර්යාලයේ (Office of Government Ethics) ප්‍රධානියා ඉවත් කර එය ස්ථිර අධ්‍යක්ෂවරයෙකු නොමැති තත්ත්වයට පත් කළේය.

ට්‍රම්ප් ඔහුගේ 2025 ආදායමෙන් වැඩි කොටසක් උපයා ගත්තේ ඔහුගේ ක්‍රිප්ටෝකරන්සි (cryptocurrency) ව්‍යාපාරවලින් වන අතර, එය ඩොලර් බිලියන 1.4ක් පමණ විය. නිව්යෝර්ක් ටයිම්ස් පුවත්පතේ විශ්ලේෂණයකට අනුව, $WLFI නමින් හැඳින්වෙන ඩිජිටල් මුදල් වර්ගයක් අලෙවි කරන ඔහුගේ ක්‍රිප්ටෝ ව්‍යාපාරයක් වන 'වර්ල්ඩ් ලිබර්ටි ෆිනෑන්ෂල්' (World Liberty Financial) ආයතනය පසුගිය වසරේදී ඩොලර් මිලියන 799ක් උපයා ඇති අතර, එය 2024 දී පැවතියේ ඩොලර් මිලියන 57ක් ලෙස පමණි.

ඔහුගේ දෙවන නිල කාලය ආරම්භයට දින තුනකට පෙර, ට්‍රම්ප් $TRUMP නමින් 'මීම්කොයින්' (memecoin) වර්ගයක් දියත් කිරීමට උදව් කළ අතර, එයින් තවත් ඩොලර් මිලියන 636ක් උපයා ඇත. ඔහු පසුගිය වසරේ මාරා-ලාගෝ (Mar-a-Lago) වෙතින් ඩොලර් මිලියන 77ක් උපයා ඇති අතර එය 2024 දී ඩොලර් මිලියන 50ක් විය. ඔහුගේ ට්‍රම්ප් නැෂනල් ඩොරල් ගොල්ෆ් ක්ලබ් වෙතින් ඩොලර් මිලියන 122ක් උපයා ඇති අතර එය ඩොලර් මිලියන 11ක වර්ධනයකි. ඔහු සතුව ට්‍රම්ප් මීඩියා ඇන්ඩ් ටෙක්නොලොජි (Trump Media & Technology) සමූහයේ ඩොලර් මිලියන 875ක් වටිනා කොටස් පවතී. 2025 අවසානය වන විට, ට්‍රම්ප් සතුව අවම වශයෙන් ඩොලර් මිලියන 857ක ආයෝජන වත්කම් පැවති අතර, එය පෙර වසරේ පැවතියේ ඩොලර් මිලියන 236ක් ලෙසය.

ජනාධිපතිවරයා ලෙස ට්‍රම්ප් ගත් ප්‍රතිපත්තිමය තීරණවලින් ඔහුගේ ක්‍රිප්ටෝ ව්‍යාපාරවලට සෘජු ප්‍රතිලාභ ලැබුණි. 2025 ජනවාරි මාසයේදී, ඔහුගේ නිල දිවුරුමට දින තුනකට පෙර, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ රජයට සම්බන්ධ ආයෝජන සමාගමක් වර්ල්ඩ් ලිබර්ටි ෆිනෑන්ෂල් ආයතනයේ සියයට 49ක කොටස් ප්‍රමාණයක් මිලදී ගත් අතර, එමඟින් ට්‍රම්ප් පවුලට ඩොලර් මිලියන 23ක ලාභයක් හිමි විය. ඉන් කෙටි කලකට පසු, ට්‍රම්ප් පරිපාලනය ඇමරිකාවෙන් එක්සත් අරාබි එමීර් රාජ්‍යයට කෘත්‍රිම බුද්ධිය (AI) බලගන්වන පරිගණක චිප්ස් අපනයනය කිරීම සඳහා හිමිසුමකට එළඹුණි.

ට්‍රම්ප්ගේ මීම්කොයින් ව්‍යාපාරයට 2025 පෙබරවාරි මාසයේදී සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව (SEC) විසින් නිකුත් කරන ලද ප්‍රකාශයකින් සෘජු ප්‍රතිලාභ ලැබුණු අතර, එමඟින් කර්මාන්තයට දැනුම් දුන්නේ එවැනි ටෝකන (tokens) මුදල් ඒකක තවදුරටත් එම ආයතනයේ අධීක්ෂණයට යටත් නොවන බවයි. මෙය බයිඩන් පරිපාලන සමයේ එම කොමිසමේ සභාපතිවරයා දැරූ ස්ථාවරය සම්පූර්ණයෙන්ම වෙනස් කිරීමකි. තවද ට්‍රම්ප් පසුගිය ජූලි මාසයේදී ස්ටේබල්කොයින්ස් (stablecoins) ලෙස හැඳින්වෙන ක්‍රිප්ටෝ මුදල් වර්ගයක් ප්‍රවර්ධනය කිරීමේ නීති සම්පාදනයකට අත්සන් තැබුවේ, ඔහුගේ පවුලේ අනුග්‍රහය ලබන සමාගම තමන්ගේම ස්ටේබල්කොයින් එකක් හඳුන්වා දී මාස හතරකට පසුවය.

පසුගිය ඔක්තෝබර් මාසයේදී, ට්‍රම්ප් විසින් ක්‍රිප්ටෝ ක්ෂේත්‍රයේ ධනවත්ම මිනිසා වන බයිනෑන්ස් (Binance) නිර්මාතෘ චැංපෙන්ග් ෂාඕ වෙත ජනාධිපති සමාව ලබා දුන් අතර, ඔහු 2023 දී මුදල් විශුද්ධිකරණ විරෝධී නීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වරදකරු වී මාස හතරක සිරදඬුවමක් විඳ තිබුණි. එතැන් සිට බයිනෑන්ස් ආයතනය ට්‍රම්ප් පවුලේ ක්‍රිප්ටෝ ව්‍යාපාරයේ වැදගත් ව්‍යාපාරික හවුල්කරුවෙකු බවට පත්ව ඇත.

කෙසේ වෙතත්, ට්‍රම්ප් තමන්ගේ ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමට සහ පෞද්ගලික ධනය වැඩි කර ගැනීමට ධවල මන්දිරය භාවිතා කළ එකම ක්ෂේත්‍රය ක්‍රිප්ටෝ නොවේ. ඔහු සෞදි අරාබිය සහ කටාර් වැනි රටවල දේපළ සඳහා 'ට්‍රම්ප්' යන නාමය භාවිතා කිරීමට බලපත්‍ර ලබා දී ඇත. එම ගනුදෙනු දෙකෙන් පමණක්

2025 දී ට්‍රම්ප්ට ඩොලර් මිලියන 14කට වඩා වැඩි මුදලක් උපයා දී ඇත.

පසුගිය ඉරිදා, නිව්යෝර්ක් ටයිම්ස් පුවත්පත පැවති සෝවියට් සමූහාණ්ඩුවක් වන කසකස්තානයේ ටංස්ටන් (tungsten) පතල් සංවර්ධනය කිරීම සඳහා එක්සත් ජනපදය සහ කසකස්තානය අතර ඇති වූ ඩොලර් බිලියන ගණනක ගනුදෙනුවක් පිළිබඳ හෙළිදරව්වක් පළ කළේය. මෙම ව්‍යාපෘතියට ට්‍රම්ප්ගේ පුතුන් සහ ඔහුගේ වාණිජ ලේකම් හොවාර්ඩ් ලුට්නික් සෘජුවම සම්බන්ධ වී සිටිති. එක්සත් ජනපද වාණිජ දෙපාර්තමේන්තුවෙන් සහ අපනයන-ආනයන බැංකුවෙන් (Export-Import Bank) ඩොලර් බිලියන ගණනක ණය වෙන් කරනු ලබන්නේ මෙම පවුල් දෙකට මෙන්ම ජනාධිපතිවරයාගේ අනෙකුත් බිලියනපති හිතවතුන්ට විශාල ලාභයක් උපයා දීමට නියමිත ව්‍යාපාරයකට මුදල් සැපයීම සඳහාය.

එමෙන්ම, ධවල මන්දිරය විසින් සිදුකරනු ලබන බෝම්බ හෙලීම් සහ/හෝ ඉරානය සමඟ සාම සාකච්ඡා පිළිබඳ නිවේදන කල්තියා දැනගැනීම මත පදනම්ව තෙල් මිල පිළිබඳ අනාවැකි වෙළඳපොලවල් (predictive markets) හරහා මූල්‍ය ප්‍රභූ පැලැන්තියේ සාමාජිකයන් විසින් උපයන මිලියන ගණනක මුදල්ද පවතී. කතිපයාධිකාරීන් සහ ට්‍රම්ප් වැනි ඔවුන්ගේ අපරාධ කල්ලි නියෝජිතයන් විසින් පාලනය කරනු ලබන ලෝකයක, ගැණිය නොහැකි දහස් ගණනකගේ ජීවිත රිසි සේ හසුරුවන ලද වෙළඳපොලවල් හරහා ලාභ ලැබීමේ මෙවලම් බවට පත්වේ. ට්‍රම්ප්ගේ බෑණනුවන් වන ජැරඩ් කුෂ්නර් මැදපෙරදිග ප්‍රතිපත්ති සහ සාකච්ඡා වලදී තමන්ට හිමිවූ භූමිකාව භාවිතා කරමින් සෞදි අරාබියෙන් සහ අනෙකුත් ගල්ෆ් රාජ්‍යයන්ගෙන් තමන්ගේ පෞද්ගලික ආයෝජන සඳහා දැවැන්ත මුදල් ප්‍රමාණයක් ලබාගෙන ඇති ආකාරය ගවේෂණාත්මක වාර්තා මගින් ලේඛනගත කර ඇත.

මේවා සිදුවන්නේ, ධවල මන්දිර උත්සව ශාලාව සහ "පරාවර්තන තටාකය" (Reflecting Pool) වැනි ව්‍යාපෘති සඳහා රජය සමඟ ව්‍යාපාරික කටයුතු කරන ආධාරකරුවන්ට ටෙන්ඩර් කැඳවීමකින් තොරව කොන්ත්‍රාත්තු ලබා දීම ඇතුළු ට්‍රම්ප් පරිපාලනයේ සාමාන්‍ය දූෂණ ක්‍රියාවලට අමතරව ය.


**ට්‍රම්ප් කරන්නේ නීති බිඳ දැමීම පමණක් නොවේ; ඔහු නීති නැවත ලියමින් සිටින්නේ තමන්ගේ ධනවත් වීම නීත්‍යානුකූලව අපරාධයක් ලෙස වර්ගීකරණය නොවන පරිදිය. දූෂණය රාජ්‍ය ප්‍රතිපත්තියේ මට්ටමට ඔසවා තැබෙයි — එනම් කොල්ලකන අතරතුරදීම එම කොල්ලය නීත්‍යානුකූල කිරීමකි.**

මේවා තනි පුද්ගලයෙකුගේ අපරාධ නොවේ. නිව්යෝර්ක් හි දේපළ වෙළඳාම් සහ සූදු මාෆියාවේ ෆැසිස්ට්වාදී නිෂ්පාදනයක් වන ට්‍රම්ප්ව රාජ්‍ය නායකයා ලෙස පත් කර ඇත්තේ අතිශය ධනවත් සහ පරපෝෂිත මූල්‍ය කතිපයාධිකාරය විසිනි. නිල සමාජයේ ඉහළම ස්ථරයන් සම්බන්ධ කරන සහ එහි වසා ගැනීම් සඳහා ට්‍රම්ප්, ආයතනික මාධ්‍ය සහ සමස්ත දේශපාලන සංස්ථාපිතයම ඒකාබද්ධ කරන එප්ස්ටයින් (Epstein) අපචාරයට (scandal) වඩා හොඳින් මෙම නව වංශවත් පන්තියේ සිරිත් විරිත් හෙළි කරන වෙනත් කිසිවක් නැත.


නාමික විපක්ෂය වන ඩිමොක්‍රටික් පක්ෂය සම්බන්ධයෙන් ගත් කල, ඔවුන් තම දෑත් අඹරවමින් මැසිවිලි නැගුවද මෙම කොල්ලකෑම් නැවැත්වීමට හෝ අපරාධකරුවන් වගවීමට බැඳීමට කිසිවක් නොකරයි, මන්ද ඔවුන්ද පාලනය කරනු ලබන්නේ එම කතිපයාධිකාරී පන්තිය විසින්ම වන අතර, ඔවුන් ලාභය සඳහා වන නිෂ්පාදනය සහ නිෂ්පාදන මාධ්‍යයන්ගේ පෞද්ගලික හිමිකාරිත්වය මත පදනම් වූ ක්‍රමය ආරක්ෂා කරන බැවිනි.

මෙම සමස්ත පන්තියේ දේපළ රාජසන්තක කළ යුතු අතර, කම්කරු පන්තිය විසින් නිෂ්පාදනය කරනු ලබන ධනය සමාජ අවශ්‍යතා සපුරාලීම සඳහා භාවිතා කළ යුතුය.

[අවධාරණය පරිවර්තනයේදී එකතු කෙරිණි]




## SLLA POLITICAL GRAPHICS



# මහා බලවතුන්ගේ ගැඹුරු වන එදිරිවාදිකම් මධ්‍යයේ යුරෝපීය අධිරාජ්‍යවාදීන් වෙළඳපල, ලාභ ශ්‍රමය සහ තීරණාත්මක අමුද්‍රව්‍ය වෙත ප්‍රවේශය සොයති

**ජෝර්ඩන් ෂිල්ටන්** විසිනි.


මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026* ජුලි *8* හා *9* වන දිනවල දී *"European imperialists seek access to markets, cheap labour and critical raw materials amid deepening great-power rivalries"* යන හිසින් පළවූ ජෝර්ඩන් ෂිල්ටන් විසින් ලියන ලද කොටස් දෙකකින් යුතු ලිපි මාලාවේ සිංහල පරිවර්තනය යි.

**1 කොටස**

යුරෝපයේ අධිරාජ්‍යවාදී බලවතුන් පසුගිය වසර කිහිපය තිස්සේ ලතින් ඇමරිකාව, අප්‍රිකාව සහ ඉන්දු-පැසිෆික් කලාපය පුරා විහිදෙන දුරදිග යන වෙළඳ ගිවිසුම් සහ අමුද්‍රව්‍ය හවුල්කාරිත්වයන් මාලාවකට එළඹ ඇත. ඩොනල්ඩ් ට්‍රම්ප් නැවතත් ධවල මන්දිරයට පැමිණීම සහ “ඇමරිකාව පළමුව” යන ගෝලීය වෙළඳ යුද්ධය වැලඳ ගැනීම මෙම ක්‍රියාවලිය සැලකිය යුතු ලෙස වේගවත් කර තිබේ.

මැයි මාසය ආරම්භයේදී, යුරෝපා සංගමය (EU) සහ මර්කෝසූර් (Mercosur) වෙළඳ හවුල අතර දිගු කලක් තිස්සේ සාකච්ඡා කරන ලද ගිවිසුම නිල වශයෙන් බලාත්මක විය. යුරෝපා සංගමයේ සාමාජික රටවල් 27 සහ ලතින් ඇමරිකානු රටවල් වන ආර්ජන්ටිනාව, බ්‍රසීලය, පැරගුවේ සහ උරුගුවේ අතර ඇති කරගත් මෙම ගිවිසුම, වෙළඳපල, අමුද්‍රව්‍ය සහ ආයෝජන අවස්ථා සඳහා ප්‍රවේශය ලබා ගැනීම වෙනුවෙන් ලෝකයේ ප්‍රධාන බලවතුන් අතර පවතින අරගලය තීව්‍ර වීම මනාව සංකේතවත් කරයි.

මර්කෝසූර් හවුල සහ ඉන්දියාව, මෙක්සිකෝව මෙන්ම නවසීලන්තය සමඟ ඇති කරගත් එවැනිම ගිවිසුම් නොවරදවාම “නිදහස් වෙළඳ ගිවිසුම්” ලෙස නම් කරනු ලැබේ. එහෙත් ඒවායින් නිරූපණය වන්නේ තම ප්‍රතිවාදීන්ගේ වියදමෙන් යුරෝපීය ප්‍රාග්ධනය සඳහා ප්‍රධාන වෙළඳපලවල් සහ සැපයුම් දාමයන් අත්පත් කර ගැනීමට ගන්නා උත්සාහයකි. එමෙන්ම, ඇමරිකානු අධිරාජ්‍යවාදයේ අභියෝගයට ලක් නොවූ ආධිපත්‍යය මත පදනම්ව දෙවන ලෝක යුද්ධයෙන් පසුව පිහිටුවන ලද ගෝලීය වෙළඳ විධිවිධාන තවදුරටත් බිඳවැටීමක් ද ඉන් අදහස් කෙරේ. වර්ධනය වන භූ-දේශපාලනික ගැටුම්කාරී තත්ත්වයන් යටතේ, ලෝක ධනවාදය තරඟකාරී කන්ඩායම්වලට බෙදී යමින් පවතින අතර, සෑම කන්ඩායමක්ම අනෙකාගේ වියදමෙන් වෙළඳපල, සම්පත් සහ උපායමාර්ගික වාසි තහවුරු කර ගැනීමට උත්සාහ කරති.



රොටර්ඩෑම් හි කන්ටේනර් පර්යන්තයක මිනිසුන් රහිත ස්වයංක්‍රීය නියෙමු *(guided)* වාහනයකට කන්ටේනරයක් පටවන ආකාරය [ඡායාරූපය: *Quistnix / CC BY 1.0*]

බ්‍රසල්ස්, බර්ලින් සහ පැරිස්, බුවනෝස් අයර්ස් සිට මුම්බායි දක්වා යුරෝපීය ප්‍රාග්ධනය සඳහා වෙළඳපල ප්‍රවේශය ඉල්ලා සිටින අතර, වොෂින්ටනයේ “ඇමරිකාව පළමුව” යන න්‍යාය පත්‍රය පදනම් වී ඇත්තේ ඇමරිකානු මහාද්වීපයේ ආර්ථික ජීවිතයෙන් සියලුම “අර්ධගෝලීය නොවන” (non-hemispheric) ප්‍රතිවාදීන් බැහැර කිරීම මත ය. **මෙම ප්‍රතිවාදී කන්ඩායම් දෙකම එකවර චීනයට එරෙහිව එල්ල වී ඇති අතර, චීනයේ ආර්ථික ව්‍යාප්තිය සහ වෙළඳාම මෙන්ම ආයෝජන වර්ධනය කිරීමට ගන්නා උත්සාහය, බීජිං පාලනය උතුරු ඇමරිකානු සහ යුරෝපීය අධිරාජ්‍යවාදීන්ගේ කොල්លකාරී අභිලාෂයන්ට ප්‍රධාන තර්ජනයක් බවට පත් වී ඇත.**

ඉරානයට එරෙහි එක්සත් ජනපද/ඊශ්‍රායල යුද්ධය සහ යුක්‍රේනයේ රුසියාවට එරෙහි එක්සත් ජනපද/නැටෝ (NATO) යුද්ධය, **දිනෙන් දින උත්සන්න වන ලෝකය නැවත බෙදා ගැනීමේ තුන්වන ලෝක යුද්ධයක ආරම්භක අදියරයන් සනිටුහන් කරයි.** යුරෝපා සංගමයේ ව්‍යාප්ත වන වෙළඳ ගිවිසුම් සහ අමුද්‍රව්‍ය හවුල්කාරිත්ව ජාලය විශ්ලේෂණය කළ යුත්තේ මෙම සන්දර්භය තුළ ය.

යුරෝපීය අධිරාජ්‍යවාදය හුදෙක් ආර්ථික න්‍යාය පත්‍රයක් පමණක් ලුහුබඳින්නේ නැත; වෙළඳපල, ශ්‍රම සංචිත, අමුද්‍රව්‍ය සහ භූ-උපායමාර්ගික බලපෑම් අත්පත් කර ගැනීම සඳහා තම ප්‍රතිවාදීන්ට එරෙහිව කුරිරු මිලිටරි බලයක් යෙදවිය හැකි වන පරිදි ඔවුහු උපරිමයෙන් සන්නද්ධ වෙමින් සිටිති. **මෙම ගමන, පශ්චාත් යුධ සමයේ වැඩි කාලයක් ආධිපත්‍යය දැරූ එක්සත් ජනපද අධිරාජ්‍යවාදය සහ යුරෝපීය බලවතුන් අතර අන්තර්- අත්ලාන්තික් සන්ධානය බිඳවැටීම වේගවත් කරමින් තිබේ.**

**යුරෝපය මුල් කරගත් වෙළඳ හවුලක් නිර්මාණය කිරීම**

යුරෝපා සංගමයේ ආර්ථික කොල්ලකෑමේ සහ ලාභ ලබාගැනීමේ ගෝලීය මූලෝපායේ හදවතෙහි පවතින්නේ අනාගත කර්මාන්ත සහ ආක්‍රමණශීලී මිලිටරි මෙහෙයුම් යන දෙකම සඳහා තීරණාත්මක අමුද්‍රව්‍ය සුරක්ෂිත කර ගැනීමේ මෙහෙයුමයි. 2024 දී බලාත්මක වූ තීරණාත්මක අමුද්‍රව්‍ය පනත (The Critical Raw Materials Act-CRMA), විශේෂයෙන්ම චීනය වැනි තනි සැපයුම්කරුවන් මත යැපීම අවම කිරීම සඳහා පැහැදිලි ඉලක්ක කෙටුම්පත් කරයි. ලොව පුරා සිටින අනෙකුත් සැපයුම්කරුවන් සමඟ මූලෝපායික හවුල්කාරිත්වයන් ඇති කර ගැනීම, ඛනිජ ප්‍රතිචක්‍රීකරණය ඉහළ නැංවීම සහ දේශීය කැණීම් ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම යන කරුණුවල එකතුවක් මඟින් මෙය සාක්ෂාත් කර ගැනීමට එය අපේක්ෂා කරයි.

චීනය සැලකිය යුතු ප්‍රමාණයකින් තීරණාත්මක අමුද්‍රව්‍ය නිස්සාරණය නොකළද, වඩාත්ම වැදගත් මූලද්‍රව්‍ය සමහරක් පිරිපහදු කිරීම සහ සැකසීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ඔවුන් ආධිපත්‍යය දරයි. උදාහරණයක් ලෙස, විද්‍යුත් වාහන (EV) සඳහා බැටරි නිපදවීමට, ඩිජිටල් උපකරණ සහ අනෙකුත් අධි-තාක්ෂණික මෙහෙයුම් සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය තුනක් වන ලෝකයේ බොහොමයක් මැංගනීස්, කොබෝල්ට් සහ මිනිරන් (ග්‍රැෆයිට්) පිරිපහදු කිරීමේ වගකීම දරන්නේ චීන පිරිපහදු මධ්‍යස්ථාන වේ. දශක ගණනාවක් තිස්සේ එක්සත් ජනපද සහ යුරෝපීය අධිරාජ්‍යවාදය චීනය ලෝකයේ ශ්‍රම සූරාකෑමේ මධ්‍යස්ථානය (sweatshop) ලෙස ගොඩනැගීම සඳහා එහි බිලියන සිය ගණනක් ආයෝජනය කර ඇත.

යුරෝපීය "තාක්ෂණික ස්වෛරීභාවය" සඳහා එනම්, එක්සත් ජනපදයෙන් සහ චීනයෙන් ස්වාධීනව විද්‍යුත් වාහන, පුනර්ජනනීය බලශක්ති යටිතල පහසුකම්, ස්මාර්ට්ෆෝන්, ඩිජිටල් යටිතල පහසුකම් සහ යුද්ධ කිරීම සඳහා වන උපකරණ නිෂ්පාදනය කිරීමේ හැකියාව සඳහා ලිතියම්, කොබෝල්ට්, දුර්ලභ පාංශු මූලද්‍රව්‍ය (REEs) සහ නිකල් වැනි ද්‍රව්‍ය කෙරෙහි සෘජු පාලනයක් තිබීම අත්‍යවශ්‍ය බවට වර්ධනය වන පිළිගැනීමක් CRMA පනතෙන් පිළිබිඹු වේ. යුරෝපා සංගම් කොමිසම සඳහන් කළේ, "බැටරි නිෂ්පාදනය සඳහා ලිතියම්, කොබෝල්ට් සහ නිකල් භාවිතා වේ; සූර්ය පැනල සඳහා ගැලියම් භාවිතා වේ; සුළං තාක්ෂණය සඳහා අමු බෝරෝන් භාවිතා වේ; අභ්‍යවකාශ සහ ආරක්ෂක අංශවල ටයිටේනියම් සහ ටංස්ටන් භාවිතා වේ" යනුවෙනි.

ඉදිරි දශක කිහිපය තුළ මෙම ද්‍රව්‍ය සමහරක් සඳහා ඇති ඉල්ලුම කිහිප ගුණයකින් වැඩි වනු ඇතැයි පුරෝකථනය කර ඇත. උදාහරණයක් ලෙස, යුරෝපා සංගමය 2024 දී පුරෝකථනය කළේ ලිතියම් සඳහා ඇති ඉල්ලුම 2030 වන විට 10 ගුණයකින් සහ 2040 වන විට 21 ගුණයකින් වැඩි වන අතර, එම කාලසීමාවන් තුළම දුර්ලභ පාංශු ලෝහ සඳහා ඇති ඉල්ලුම හය හෝ හත් ගුණයකින් ඉහළ යනු ඇති බවයි.

මෙයට ප්‍රතිචාර වශයෙන්, යුරෝපා සංගමය සම්පත් සබඳතා පිළිබඳ ගෝලීය ජාලයක් පිහිටුවීමට උත්සාහ කරයි.

ඉන්දු-පැසිෆික් කලාපය තුළ ඕස්ට්‍රේලියාව කේන්ද්‍රීය ස්ථානයක් ගනී. 2024 දී, යුරෝපා සංගමය ඕස්ට්‍රේලියාව සමඟ මූලෝපායික ඛනිජ පිළිබඳ අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබූ අතර, එමඟින් ලිතියම්, දුර්ලභ පාංශු මූලද්‍රව්‍ය, මිනිරන්, මැංගනීස් සහ කොබෝල්ට් සැපයුම ඉහළ නැංවීමේ යුරෝපා සංගමයේ අවශ්‍යතාවය හඳුනා ගන්නා ලදී. ඕස්ට්‍රේලියාවේ විශාල අමුද්‍රව්‍ය තැන්පතු වෙත ප්‍රවේශ වීම සඳහා යුරෝපීය ආයෝජන බැංකුවේ මූල්‍ය ආධාර ලැබෙනු ඇති අතර, පතල් කැණීමේ ව්‍යාපෘති, අමුද්‍රව්‍ය සැකසීම සහ ප්‍රවාහන යටිතල පහසුකම් සඳහා මූල්‍ය ආධාර සැපයීමට ඔවුන් 2025 අගභාගයේදී එකඟ විය.

මධ්‍යම ආසියාව යනු යුරෝපීය අධිරාජ්‍යවාදය එහි ස්වභාවික සම්පත් වෙනුවෙන් විනිවිදීමට අදිටන් කරගෙන සිටින තවත් එක් කලාපයක් වන අතර, එමඟින් යුරෝපා සංගමය, චීනයට, එක්සත් ජනපදයට සහ රුසියාවට එරෙහිව පෙළගැසෙයි. කසකස්තානය, උස්බෙකිස්තානය සහ ටජිකිස්තානය වැනි රටවල් සතුව යුරේනියම්, තඹ සහ දුර්ලභ පාංශු මූලද්‍රව්‍යවල (REEs) සැලකිය යුතු සංචිත පවතී. 2025 අප්‍රේල් මාසයේදී උස්බෙකිස්තානයේ සමර්කන්ඩ් හි පැවැති ප්‍රථම යුරෝපා සංගම්-මධ්‍යම ආසියානු සමුළුවේදී ද ඇතුළුව, මෙම කලාපය තුළ තම මැදිහත්වීම ගැඹුරු කිරීමට යුරෝපා සංගමය උත්සාහ කර ඇත. සමුළුවේ ප්‍රකාශය මඟින් යුරෝපා සංගමය සහ මධ්‍යම ආසියානු ජනරජයන් අතර "මූලෝපායික හවුල්කාරිත්වයක්" ඇති කිරීමට කැප වූ අතර, පසුව ඒකාබද්ධ සම්පත් ප්‍රයෝජනයට ගැනීමේ සැලසුම් සහ රුසියාව මඟ හැර යාම සඳහා

ප්‍රවාහන කොරිඩෝ පිහිටුවීම පිළිබඳ සැලසුම් ගෙනහැර දක්වන ලදී.

සාම්ප්‍රදායිකව රුසියාවේ සමීප මිත්‍රයෙකු වන ආර්මේනියාවේ අගනුවර වන යෙරෙවන් හි මෑතකදී පැවැත්වුණු යුරෝපීය දේශපාලන ප්‍රජාවගේ සමුළුව, රුසියාව මඟහරිමින් මධ්‍යම ආසියාවේ සිට යුරෝපයට ගලා යන වෙළඳ ප්‍රවාහයන් සඳහා වන ප්‍රධාන ප්‍රවාහන මාර්ගයක් ලෙස එම රට පිහිටා තිබීම සමඟ බැඳී පවතුනි. 2023 ආර්මේනියාව සහ අසර්බයිජානය අතර පැවැති යුද්ධයේදී අසර්බයිජානය විසින් නගෝර්නෝ-කරබාක් ප්‍රදේශය යටත් කර ගැනීමෙන් පසුව, අසර්බයිජානය තුර්කියෙන් වෙන් කරන ආර්මේනියානු භූමියේ සිහින් තීරුවක් වන සන්ගෙසුර් කපොල්ල (Zangezur Gap) හරහා ප්‍රවාහන කොරිඩෝවක් සංවර්ධනය කිරීමට එක්සත් ජනපදය මැදිහත් වූ අතර, එය ජාත්‍යන්තර සාමය සඳහා වන ට්‍රම්ප් මාර්ගය (Trump Route for International Peace) ලෙස නම් කර ඇත.

**2 කොටස**

**යුරෝපා සංගමය (EU – European Union), අප්‍රිකානු රටවල් සමඟ අමුද්‍රව්‍ය සහ සැපයුම් දාම පිළිබඳ මූලෝපායික හවුල්කාරිත්ව මාලාවකට ද අත්සන් තබා ඇත.**

2022 දී බ්‍රසල්ස් [යුරෝපා සංගමය], දුර්ලභ පාංශු මූලද්‍රව්‍ය (rare earths), ලිතියම් සහ පුනර්ජනනීය හයිඩ්‍රජන් ආවරණය වන පරිදි නැමීබියාව සමඟ අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීය. තඹ සහ කොබෝල්ට් නිස්සාරණය සහ ප්‍රවාහන යටිතල පහසුකම් සඳහා පුළුල් ආයෝජන ඇතුළත් කරමින් 2023 දී සැම්බියාව සමඟ වඩාත් පුළුල් අවබෝධතා ගිවිසුමකට එළඹෙන ලදී. ඩිජිටල් උපකරණ සඳහා ප්‍රධාන සංරචකයක් වන කොබෝල්ට් ලොව විශාලතම ප්‍රමාණයෙන් නිස්සාරණය කරන කොංගෝ ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය (DRC – Democratic Republic of Congo) සමඟ මූලෝපායික හවුල්කාරිත්වයක් එම වසරේම ඇති කර ගන්නා ලදී.

ලෝක වෙළඳපොළට අපනයනය කිරීම සඳහා ඇන්ගෝලාව හරහා අත්ලාන්තික් වෙරළ තීරයට DRC සහ සැම්බියාවෙන් අමුද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමට පහසුකම් සලසන ලොබිටෝ කොරිඩෝව (Lobito Corridor) පුළුල් කිරීමට යුරෝපා සංගමයට අවශ්‍ය වී ඇත. යුරෝපීය ආයෝජන බැංකුව (European Investment Bank) සහ පෞද්ගලික ආයතන විසින් අරමුදල් සපයනු ලබන **මෙම යටිතල පහසුකම්, කලාපය තුළ චීන සහ එක්සත් ජනපද (US) බලපෑම සෘජුවම දුර්වල කිරීම අරමුණු කර ගත්තකි.**

ඇමරිකා මහද්වීපය තුළ, මෙර්කෝසූර් (Mercosur) වෙළඳ ගිවිසුම මඟින් යුරෝපා සංගමය සහ තීරණාත්මක ඛනිජ (critical minerals) ලබා ගැනීමේ එහි වැදගත්ම හවුල්කරුවන් දෙදෙනෙකු වන ආර්ජන්ටිනාව සහ බ්‍රසීලය අතර ආර්ථික සබඳතා ශක්තිමත් කරයි. ආර්ජන්ටිනාව සමඟ එක්ව "ලිතියම් ත්‍රිකෝණයේ" (lithium triangle) කොටස්කරුවෙකු වන චිලී රාජ්‍යය, 2024 දී බ්‍රසල්ස් සමඟ වෙනම නිදහස් වෙළඳ ගිවිසුමකට (free trade agreement) එළඹුණි.

තවත් උතුරට වන්නට, සැලකිය යුතු ලෙස ප්‍රසාරණය වීමේ හැකියාවක් සහිත, තීරණාත්මක ඛනිජ සහ ස්වාභාවික වායු (natural gas) සැපයුම්කරුවෙකු ලෙස කැනඩාව සලකනු ලැබේ. කැනඩාව යුරෝපීය බලවතුන් සමඟ සබඳතා ගැඹුරු කර ගැනීමට උනන්දු වෙයි. ට්‍රම්ප් කැනඩාව 51 වන ප්‍රාන්තය ලෙස ඈඳා ගැනීමට තම අභිප්‍රාය ප්‍රකාශ කර ඇති අතර, එක්සත් ජනපද වෙළඳපොළ මත දැඩි ලෙස රඳා පවතින එහි ආර්ථිකය කඩාකප්පල් කරන බවට තර්ජනය කර ඇත.

මෑතකදී යෙරෙවන්හි (Yerevan) පැවැත්වුණු යුරෝපීය දේශපාලන ප්‍රජා (EPC – European Political Community) සමුළුවට එවැනි රැස්වීමකට සහභාගී වූ පළමු යුරෝපීය නොවන රාජ්‍ය නායකයා ලෙස කැනඩා අගමැති මාර්ක් කාර්නි සහභාගී වීම, සම්ප්‍රදායික අත්ලාන්තික් සාගරය හරහා සබඳතාවල (transatlantic relations) දරුණු බිඳවැටීම සහ වොෂින්ටනයේ තර්ජනවලට ප්‍රතිතුලනයක් (counterweight) ලෙස යුරෝපය සමඟ ආර්ථික සබඳතා ශක්තිමත් කර ගැනීමට කැනඩාවට ඇති උවමනාව පෙන්නුම් කළේය.

**අමුද්‍රව්‍ය සහ ප්‍රතිසන්නද්ධකරණය**

අමුද්‍රව්‍ය සහ වාණිජ වෙළඳපොළවල් සුරක්ෂිත කර ගැනීම සඳහා යුරෝපීය අධිරාජ්‍යවාදීන් ගේ ගෝලීය පීරා යෑම, තම ප්‍රතිවාදීන්ට එරෙහිව තම අවශ්‍යතා පැටවීමට සමත්, සටනට සූදානම් මිලිටරි බලකායක් අවශ්‍ය වේ. යුරෝපීය බලවතුන් තම මිලිටරි යන්ත්‍ර සඳහා යුරෝ බිලියන සිය ගණනක් වැය කරති. මේ ක්‍රියාදාමයේ සුවිශේෂිත තත්වයක පසුවන ජර්මනිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාපිත ණය සීමාවන්ගෙන් මිලිටරි වියදම් නිදහස් කිරීම සඳහා තම මූලික නීතිය (Basic Law) සංශෝධනය කර ඇති අතර, එමඟින් හමුදාවට සහ අදාළ යටිතල පහසුකම් සඳහා අරමුදල් සැපයීමට යුරෝ ට්‍රිලියන 1 ක [ලංකා රුපියල් කෝටි කෝටි 3.9 ක්] ණය ලබා ගැනීමට එයට හැකි වී තිබේ. යුරෝපා සංගමය මිලිටරි ආයෝජන (military investments) සඳහා යුරෝ බිලියන 800 ක් වෙන් කර ඇත.

නූතන යුද යන්ත්‍රයක් තැනීමට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමට යුරෝපීය අධිරාජ්‍යවාදීන් අපොහොසත් වුවහොත් මෙම මුදල්වලින් ඇති පලක් නැත. එක් ඇස්තමේන්තුවකට අනුව, එක්සත් ජනපදයේ නිෂ්පාදිත සෑම F-35 ප්‍රහාරක ජෙට් යානයක්ම නිපදවීම සඳහා දුර්ලභ පාංශු මූලද්‍රව්‍ය කිලෝග්‍රෑම් 400 ක් අවශ්‍ය වේ. යුධ ටැංකි, සන්නද්ධ වාහන සහ රේඩාර් පද්ධති සියල්ලම තීරණාත්මක ඛනිජවල ප්‍රධාන යෙදවුම් (inputs) මත රඳා පවතින අතර, යුරෝපා සංගම් රටවල් දැනට ඒවා ලබා ගන්නේ චීනයෙන්, රුසියාවෙන් හෝ ඔවුන්ගේ සෘජු පාලනය යටතේ නොමැති වෙනත් රටවලිනි. ප්‍රධාන යුධ ටැංකියක් (main battle tank – MBT) නිෂ්පාදනය කිරීමට අවශ්‍ය යෙදවුම් විස්තර කරමින් මූලෝපායික අධ්‍යයන සඳහා වන

ජාත්‍යන්තර ආයතනය (IISS – International Institute for Strategic Studies) විසින් කරන ලද අධ්‍යයනයක මෙසේ සඳහන් වේ:

"නූතන ප්‍රධාන යුධ ටැංකියක (MBT) හැකියාව දැන් විනිශ්චය කරනු ලබන්නේ එහි සංවේදක සහ ඔප්ට්‍රොනික්ස් (optronics-විද්‍යුත්-ආලෝක තාක්ෂණය) වල නවීන-සංකීර්ණ මෙවලම් වන අධෝරක්ත (IR – infrared) සහ රාත්‍රී දර්ශන (NV – night-vision) පද්ධතිවල රසදිය (mercury), කැඩ්මියම් ටෙලුරයිඩ් (cadmium telluride), ජර්මේනියම් (germanium), තඹ සහ ටැන්ටලම් (tantalum) අඩංගු විය හැක. ලේසර් දුර මනින උපකරණ (laser rangefinders) සහ වෙඩි කළ යොමු වන අතර ඉට්‍රියම් 94% ක්ම සපයනු ලබන්නේ චීනයෙනි."

MBT සන්නිවේදන පද්ධති, "තඹ සහ ගැලියම් ආසනයිඩ් (gallium arsenide), ගැලියම් නයිට්‍රයිඩ් (gallium nitride), බෙරිලියම් (beryllium), සිලිකන්, රිදී සහ ඉන්ඩියම් වැනි අනෙකුත් තීරණාත්මක ද්‍රව්‍ය" මත රඳා පවතින බව එහි



*2023 පෙබරවාරි 1 වන දින ජර්මනියේ ඔගස්ටස්ඩෝෆ්හි ෆීල්ඩ් මාර්ෂල් රොමෙල් බැරැක්කයේ බුන්ඩෙස්වෙහ්ර් (Bundeswehr – ජර්මානු සන්නද්ධ හමුදා) ටැංකි බලඇණිය 203 වෙත ජර්මානු ආරක්ෂක අමාත්‍ය බොරිස් පිස්ටෝරියස්ගේ සංචාරයකදී ලෙපර්ඩ් 2 (Leopard 2) ටැංකියක් දක්නට ලැබෙන අයුරු. [AP ඡායාරූපය/ මාටින් මේස්නර්]*

කුසලතාවයන් මෙන්ම වෙඩි බලය, ආරක්ෂාව සහ සංචලතාව වැනි සම්ප්‍රදායික මිතිකයන් (මිනුම් දඬු) ගෙනි. මේ සම්බන්ධයෙන් ගත් කල, වඩා හොඳ සංවේදක මඟින් යුද පිටියේ වඩා හොඳ දැනුවත්භාවයක් (battlefield awareness) ලබා දෙන අතර, එමඟින් ඉලක්ක සොයාගැනීමේ, හඳුනාගැනීමේ සහ තහවුරු කරගැනීමේ (identification) පරාසයන් පුළුල් කිරීමට කාර්ය මණ්ඩලයට හැකියාව ලැබේ. සංවේදක වඩ වඩාත් සංකීර්ණ වන අතර තීරණාත්මක ද්‍රව්‍ය මාලාවක් මත රඳා පවතී. මූලික වීදුරු සහ දර්පණ සඳහා සිලිකන් සහ සෙරමික් භාවිතා කරන අතර, අඩු දෘශ්‍යතා සහිත පරිසරයන්හි ප්‍රධාන සංවේදක (muzzle reference sensors) නූතන ටැංකිවල පොදු ලක්ෂණ වන අතර, ඉලක්කයක් දෘශ්‍යමය වශයෙන් හඳුනාගත් පසු වෙඩි තැබීමේ නිවැරදි කෝණ/විසඳුම් (firing solutions) සකස් කිරීම වේගවත් කිරීමට ඒවා උපකාරී වේ. මේවා සඳහා නියෝඩියමියම්-ඉට්‍රියම්-ඇලුමිනියම් ගානට් (neodymium–ytrium–aluminium garnet) සහ ඉන්ඩියම් (indium) හා අර්බියම් (erbium) භාවිතා කළ හැක. එක්සත් ජනපද භූ විද්‍යා සමීක්ෂණ ආයතනයට (USGS – US Geological Survey) අනුව, නියෝඩියමියම් සහ ඉට්‍රියම් යනු දුර්ලභ පාංශු මූලද්‍රව්‍ය (REEs – Rare Earth Elements) සඳහන් වේ. ටැංකියේ ප්‍රධාන තුවක්කුව සහ සන්නාහය (armour) සම්බන්ධයෙන් ගත් කල, ඒවාට "ඇන්ටිමනි (antimony), කාබන් (carbon), මැංගනීස් මිශ්‍ර ලෝහ (manganese alloys), ක්‍රෝමියම් (chromium), නිකල් (nickel), මොලිබ්ඩිනම් (molybdenum) සහ වැනේඩියම් (vanadium)" අවශ්‍ය වන අතර පතොරම් (ammunition) සහ සන්නාහය ඒවායේ දෘඪතාව හේතුවෙන් ටංස්ටන් (tungsten) සහ ටයිටේනියම් (titanium) මත රඳා පවතී.

IISS අධ්‍යයනය නාවික සහ ගුවන් ක්ෂේත්‍රවල මිලිටරි උපකරණ සඳහා ද මෙවැනිම විස්තරයකට යයි. එහි

හැඳින්වීමේ සඳහන් වන පරිදි: “බාහිර සැපයුම් මත, සහ විශේෂයෙන් බොහෝ විට එක් ස්ථානයක පමණක් සංකේන්ද්‍රණය වී ඇති තීරණාත්මක අමුද්‍රව්‍ය මත යුරෝපයේ ඉහළ යැපීම, යුරෝපීය ආරක්ෂක/මිලිටරි නිෂ්පාදනය (defence manufacturing) සඳහා සැලකිය යුතු සහ වර්ධනය වන අවදානමක් පෙන්නුම් කරයි.”

### වෙළඳ හවුල්වල සිට ලෝක යුද්ධය දක්වා, සහ කම්කරු පන්තියේ සමාජවාදී ප්‍රතිචාරය


**ස්වභාවික සම්පත් සහ ලාභ ශ්‍රමය සුරක්ෂිත කර ගැනීමට සහ වෙළඳපොළවල් පුළුල් කිරීම සඳහා යුරෝපා සංගමය දරන උත්සාහයන් සිදුවන්නේ ගෝලීය ධනේශ්වර අර්බුදයක් මැද ය. එහි ප්‍රතිවිරෝධතා දැනටමත් තුන්වන ලෝක යුද්ධයක මුල් අවධියට මඟ පාදා ඇති අතර, ලෝකය නැවත බෙදා ගැනීමක් සඳහා ප්‍රධාන බලවතුන් පටලවා ඇත. ඕනෑම එක් බලවතෙකු තම සැපයුම් දාමයන් ස්ථාවර කිරීමට දරන උත්සාහය එහි ප්‍රතිවාදීන් සමඟ නව ආතතීන් ඇති කරයි. සියලුම බලවතුන් එකවර එසේ කිරීමට දරන උත්සාහය අනිවාර්යයෙන්ම අධිරාජ්‍යවාදී යුද්ධයක් දක්වා උත්සන්න විය යුතුය. යුරෝපය තුළ, යුරෝපා සංගමය යනු තනි බලවතෙකු නොව, ප්‍රංශය සහ ජර්මනිය අතර නැවත නැවතත් ආතතීන් ඇවිලීමෙන් පෙන්නුම් කරන පරිදි, අවශ්‍යතා එකිනෙකට වෙනස් වන අධිරාජ්‍යවාදී බලවතුන්ගේ සන්ධානයක් වීම මඟින්, මෙම තත්ත්වය තවත් සංකීර්ණ වෙයි.**

මෙම ගැටුම්කාරී න්‍යාය පත්‍ර දැනටමත් යුක්‍රේනය තුළ පුපුරා ගොස් ඇති අතර, එහිදී එක්සත් ජනපදය සහ නේටෝව ක්‍රමානුකූලව යුක්‍රේනය තුළ රුසියාව සමඟ යුද්ධයක් අවුලුවාලීය. යුරෝපීය බලවතුන් මඟහරිමින් රුසියාව සමඟ එකඟතාවයකට පැමිණීමට වොෂින්ටනය දරන උත්සාහයේ කොටසක් ලෙස, ට්‍රම්ප් පසුගිය වසරේ යුක්‍රේනය සමඟ රටේ තීරණාත්මක ඛනිජ සූරාකෑම සඳහා– යුරෝපීය අධිරාජ්‍යවාදීන් බැහැර කරන– ද්විපාර්ශ්වික ගිවිසුමකට එළඹුණි.

දේශගුණික විපර්යාස හේතුවෙන් ප්‍රවේශය සඳහා විවෘත වන ආක්ටික් මුහුදු මාර්ගවල හදවතේ ප්‍රධාන උපායමාර්ගික ස්ථානයක් හිමිකරගෙන සිටින, අමුද්‍රව්‍යවලින් පොහොසත් ඩෙන්මාර්ක ස්වයං පාලන ප්‍රදේශයක් වන ග්‍රීන්ලන්තය ඈඳා ගැනීමට නැවත නැවතත් තර්ජනය කරමින් ට්‍රම්ප් පසුගිය වසර පුරා යුරෝපීය බලවතුන් සමඟ ආතතීන් ගැඹුරු කළේය. එක්සත් ජනපද සොල්දාදුවන් සඳහා ස්ථිර කඳවුරු සුරක්ෂිත කර ගැනීමට සහ දූපතේ ඕනෑම ප්‍රධාන ආයෝජන තීරණයක් සම්බන්ධයෙන් වොෂින්ටනයට නිෂේධ බලය ලබා ගැනීමට එක්සත් ජනපදය ඩෙන්මාර්කය සහ ග්‍රීන්ලන්තය සමඟ සාකච්ඡා පවත්වමින් සිටින බව නිව් යෝර්ක් ටයිම්ස් පුවත්පත මැයි මාසයේදී වාර්තා කළේය.

**අධිරාජ්‍යවාදීන් අතර ප්‍රතිවිරෝධතා දැඩි වීම සහ ගැටුම්කාරී කන්ඩායම් විවෘතව නැවත ඉස්මතු වීම, දෙවන ලෝක යුද්ධයට පෙර පැවති සහ එය පෝෂණය කළ 1930 ගණන්වල තරඟකාරී වෙළඳ කාණ්ඩ ගැසීම් වලට සමාන වේ.**

හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර




උප ජනාධිපති ජේ.ඩී. වැන්ස් ග්‍රීන්ලන්තයේ එක්සත් ජනපද මිලිටරියේ පිටුෆික් අභ්‍යවකාශ කඳවුරේදී අදහස් දක්වන අතර, බලශක්ති ලේකම් ක්‍රිස් රයිට් (වමේ) සහ ධවල මන්දිරයේ ජාතික ආරක්ෂක උපදේශක මයික් වෝල්ට්ස් බලා සිටිති, 2025 මාර්තු 28 සිකුරාදා. [AP ඡායාරූපය/ජිම් වොට්සන්]

කමිටුව (ICFI – International Committee of the Fourth International) මෙම ක්‍රියාවලියේ මුලාරම්භය එහි වර්ධනයේ වඩාත් මුල් අවධියකදී, එනම් 1990 ගණන්වල මුල් භාගයේදී, එක්සත් ජනපදයේ අභියෝගයට ලක් නොවූ ආධිපත්‍යය මත පදනම් වූ පශ්චාත් යුද සමතුලිතතාවය බිඳවැටීමේදී හඳුනා ගත්තේය. එම වසරේ අගභාගයේදී බර්ලිනයේ කැඳවන ලද අධිරාජ්‍යවාදී යුද්ධයට සහ යටත්විජිතවාදයට එරෙහි ජාත්‍යන්තර සම්මේලනයක් සඳහා කැඳවුම් කරමින් ICFI එහි 1991 මැයි දින ප්‍රකාශනයේ මෙසේ ලිවීය:

“දෙවන ලෝක යුද්ධය අවසන් වීමෙන් පසු ජාත්‍යන්තර සබඳතාවල මෙවැනි අවිනිශ්චිතතාවයක් පැවතී නැත. සීතල යුද්ධය (Cold War) සමයේ ජාත්‍යන්තර රාජ්‍ය තාන්ත්‍රිකභාවය ගලා ගිය පෙර දැකිය හැකි නාලිකා සිදුවීම් විසින් අභිබවා ගොස් ඇත. පැරණි සන්ධානයන් බිඳ වැටෙමින් පවතී; තවද නව සන්ධානයන් තවමත් ගොඩනැගීමේ ක්‍රියාවලියේ පවතී. **ලෝක ආධිපත්‍යය සඳහා ප්‍රබල අන්තර්ජාතික සංගතවල අරගලය ජාත්‍යන්තර කටයුතුවලට බිහිසුණු ආතතියක් ලබා දෙයි...** ‘මිතුරන්’ සහ ‘සතුරන්’ පෙළගැස්වීම තවමත් බොහෝ සෙයින් බලාපොරොත්තු නොවූ ස්වරූපයක් ගත හැකිය. **නමුත් අධිරාජ්‍යවාදයේ ස්වභාවයම, අවශ්‍යතාවල ගැටුම අනිවාර්යයෙන්ම යුද්ධය දෙසට ගමන් කරයි.**“

වසර තිස්පහකට පසු, ලෝක යුද්ධය තවදුරටත් අනාගත වියහැකියාවක් (prospect) නොව, කම්කරුවන්ගේ ඇස් පනාපිට දිග හැරෙන බිහිසුණු ක්‍රියාවලියකි. යුරෝපීය බලවතුන් එහි ආරම්භය ගැන තමන්ගෙන් සමග සාකච්ඡා නොකකල බවට මැසිවිලි නගන අතරේම අනුමත කළ ඉරානයට එරෙහි නීතිවිරෝධී එක්සත් ජනපද/ඊශ්‍රායල යුද්ධය, සෝවියට් සංගමය බිඳවැටීම දක්වා දිවෙන සමස්ත ඓතිහාසික යුගයක උච්චතම අවස්ථාව විය. නමුත් අඛණ්ඩ යුද මාලාවක් හරහා මිලිටරි බලය යෙදවීමෙන් තම ආර්ථික පරිහානිය පියවා ගැනීමට ඇමරිකානු අධිරාජ්‍යවාදය දැරූ උත්සාහය අසාර්ථක වී ඇත.

**ඉරානය සහ පුළුල් මැදපෙරදිග වේගයෙන් උත්සන්න වන තුන්වන ලෝක යුද්ධයක එක් පෙරමුණක් වන අතර, එම ලෝක යුද්ධය, රුසියාවට එරෙහි යුද්ධය සහ ඉන්දු-පැසිෆික් කලාපයේ චීනය සමඟ යුද්ධය සඳහා වන සූදානම ද ඇතුළත් කර ගනී. වෙළඳපොළවල්, ස්වභාවික සම්පත් සහ ලාභ ශ්‍රමය සඳහා වන ගෝලීය පොරබැදීමේදී යුරෝපීය බලවතුන් — මිලිටරි සැපයුම් සහ බුද්ධි තොරතුරු සඳහා එක්සත් ජනපදය මත බෙහෙවින් රඳා පවතින බැවින් — යම් මට්ටමක අත්ලාන්තික් සාගරයෙන් හරහා සහයෝගීතාවයක් පවත්වා ගැනීමට කටයුතු කරන අතරම, මෙම හිටපු මිතුරන් (erstwhile allies) ගෝලීය යුද්ධයේ සියලු පෙරමුණු වලදී එකිනෙකා ප්‍රතිවාදීන් ලෙස දැක ගනිති.**

ලෙනින් පළමු ලෝක යුද්ධය සහ රුසියානු විප්ලවය විසින් විවෘත කරන ලද ඓතිහාසික අවධිය යුද්ධ සහ විප්ලවයන්ගේ යුගයක් ලෙස විස්තර කළේය. මන්ද, ධනවාදයේ ප්‍රතිවිරෝධතා අධිරාජ්‍යවාදී ලෝක යුද්ධයක් හෝ සමාජවාදී විප්ලවයක් හරහා මිස විසඳිය නොහැකි මට්ටමට මුහුකුරා ගොස් තිබූ බැවිනි. මෙම යුගය පිළිබඳ එම අවබෝධය ඇතිවය ICFI හි 1991 මැයි දින ප්‍රකාශය අවධාරණය කළේ මෙසේය:

“ඓතිහාසික අත්දැකීම් පැහැදිලිවම සාක්ෂි දරන්නේ ප්‍රශ්නය තීරණය කරන්නේ ධනපති දේශපාලඥයන්ගේ සදාචාරාත්මක මනස්තාප (moral qualms) හෝ ආත්මීය භීතීන් නොව, අධිරාජ්‍යවාදයේ වෛෂයික ප්‍රතිවිරෝධතා බවයි. තවත් ලෝක යුද්ධයක් වැලැක්විය හැකි ලොව එකම බලවේගය විප්ලවවාදී කම්කරු පන්තියයි.”

යුරෝපයේ කම්කරුවන්ගේ කර්තව්‍යය වන්නේ යුද්ධයට, ප්‍රතිසන්නද්ධකරණ අයවැයට, සමාජ කොන්දේසි වලට එල්ල කරන ප්‍රහාරවලට සහ ධනේශ්වර තරඟකාරිත්වයේ සමස්ත තර්කනයට එරෙහි වන ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීමයි. එමෙන්ම එය එක්සත් ජනපදය, රුසියාව, චීනය, යුක්රේනය, ඉන්දියාව, අප්‍රිකාව සහ ලොව පුරා සිටින කම්කරුවන් සමඟ සවිඥානික එකමුතුවකින් යුතුව සිදු කිරීමයි. සියලුම රටවල කම්කරුවන් සමාජයේ සමාජවාදී පරිවර්තනයක් සඳහා සටන් කළ යුතුය: ලාභය සඳහා වන නිෂ්පාදනය වෙනුවට මානව අවශ්‍යතා සඳහා වන නිෂ්පාදනය ආදේශ කිරීම සහ ජාතික රාජ්‍ය පද්ධතිය වෙනුවට සමාජවාදී සමූහාණ්ඩුවල සහෝදර සංගමයක් ආදේශ කිරීමයි.

මෙය හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ වැඩපිළිවෙළයි. වත්මන් සමාජ ක්‍රමයේ (social order) සමස්ත තර්කනය මනුෂ්‍ය වර්ගයා තල්ලු කරමින් සිටින ව්‍යසනය වැලැක්වීමට වෙනත් මඟක් නැත.

සමාප්තයි.

[අවධාරණය පරිවර්තනයේදී එකතු කෙරුණි]

---

**සමාජවාදී ලෝක පක්ෂයේ කොටසක් ලෙස මේ කලාපයේ කම්කරු පංතියේ විප්ලවවාදී පක්ෂය ගොඩනැගීම සඳහා ශ්‍රී ලංකාවේ හා දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වය (SLLA) සමඟ අදම එකතු වන්න!**




මාක්ස්වාදය, භූ දේශපාලනය හා ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරය පිළිබඳ ප්‍රශ්න ලෝක සමාජවාදී වෙබ් අඩවිය විසින් නිර්මිත ආවර්ධිත බුද්ධියේ නව යෙදුම
Socialism AI වෙතින් අසන්න. SocialismAI.com වෙත පිවිසෙන්න.

**Socialism AI ඔබගේ දෛනික දේශපාලන අධ්‍යාපනයේ හා ක්‍රියාකාරකම්වල කොටසක් කර ගැනීමට අපි අපගේ සියලුම පාඨකයින්ට ආරාධනා කරමු.**

**සියල්ල රඳා පවතින්නේ අප කරන දේ මත ය. සමාජවාදය සඳහා සටනට සංවිධානය සහ දේශපාලන ඉදිරිදර්ශනය අවශ්‍ය වේ. කිසිවක් ස්වයංක්‍රීයව සිදු නොවේ. ධනවාදය නැවත වරක් මානව වර්ගයා ප්‍රශ්න පිළිබඳ ප්‍රශ්නයට යොමු කරයි: එනම් සමාජවාදය ද, ම්ලේච්ඡත්වය ද යන ප්‍රශ්නයයි.**

**අප ජීවත් වන්නේ පන්ති සමාජයක ය.  එහි කම්කරු පන්තියේ පැත්ත ගන්න. ලෝකය යහපත් ලොවක් බවට පරිවර්තනය කළ හැක්කේ කම්කරු පන්තියේ නායකත්වය යටතේ එම පන්තිය ද, සෙසු පීඩිත ජනතාව ද එක්සත් කිරීමෙන් පමණි. ඒ සඳහා එහි ලෝක පක්ෂය වන හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව හා එහි ශාඛා ගොඩනගන්න. ලෝක සමාජවාදී වෙබ් අඩවිය ගොඩ නැගීමේ අරමුදලට සහාය දෙන්න. ලෝක සමාජවාදී විප්ලවයේ ඉදිරිදර්ශනය සහ වැඩසටහනෙන් කම්කරු පන්තිය සන්නද්ධ කිරීමේ සටනට සහාය දෙන්න, එක් වන්න.**

**The Socialist** සඟරාව ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ (සසප/SEP) විප්ලවවාදී වාම කන්ඩායම වන **ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වය** (SLLA) හි ඩිජිටල් මාසික ප්‍රකාශනයයි. එහි සියලු කලාප download කර ගැනීමට මෙහි පිවිසෙන්න: https://www.thesocialist.lk/monthly-magazine/. මෙහි පළකරනු ලබන සියලු ලිපි පිළිබඳ ඔබගේ අදහස් හා සාකච්ඡා සඳහා අපව සම්බන්ධ කර ගැනීමට අපට ලියන්න: socialistlead@gmail.com. අපගේ වෙබ් අඩවිය **theSocialist.lk** නිති පතා කියවන්න. **The Socialist World** YouTube නාලිකාවේ විවරණ අසන්න. හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (ICFI) ලෝක ප්‍රකාශනය වන ලෝක සමාජවාදී වෙබ් අඩවිය wsws.org දිනපතා කියවන්න. සසප යනු ICFI හි ලංකා ශාඛාවයි. එසේම කම්කරු පන්තියේ නායකත්වය ගොඩනැගීමේ අපගේ අරගලයට එකතු වන්න. **theSocialist.lk** සඳහා මුදලින් දායක වන්න.

**ලංකාවේ එකම සමාජවාදී සඟරාව, The Socialist ඩිජිටල් කලාප ඔබගේ හිතවතුන් අතර බෙදා හරින්න.** සඟරාව WhatsApp හරහා ලබා ගැනීමට 0777497101 වෙතින් ඉල්ලුම් කරන්න.

World Socialist Web Site WSWS.ORG

සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ලිපි දිනපතා කියවන්න